# දෙසතිය

පුවත් සඟරාව

2026 ජනවාරි



# සංවර්ධනයේ අභියෝගය






# පන්තියෙන් එබ්බට

ප්‍රවෘත්ති සමඟ යාවත්කාලීන වීමෙන් ලැබෙන්නේ ලෝකය තේරුම් ගැනීමට උපකාරයක් වගේ ම දිනපතා අලුත් වන අර්ථවත් දැනුමක් ලබා ගැනීමට නව අවස්ථාවක්. උදෑසන පාසල් රැස්වීමේදී දිනයට අදාළ ව ජාතික, ජාත්‍යන්තර, ක්‍රීඩා සහ අධ්‍යාපනික (පොදු) වශයෙන් එක් ක්ෂේත්‍රයකින් දහය බැගින් වන සේ ප්‍රමුඛ පුවත් තෝරාගෙන දරුවන් ලවා ඉදිරිපත් කරවීමට අපේ අසල්වැසියා, ඉන්දියාව පියවරගෙන තිබෙනවා. ඒ, 2026 නව පාසල් වාරයේ ආරම්භය සනිටුහන් කරමින්.

එහි ප්‍රධාන ඉලක්කය වන්නේ තම රටේ සහ ලොව වටා දෛනික ව සිදුවන්නේ මොනවා ද? යන්න ගැන අවධානයෙන් සිටීමට දරුවා පෙළඹවීම. ඉන්දියාවේ සිදුවීම්වල අලුත් ම තතු, විවිධ රටවල් ජාත්‍යන්තරයේ ක්‍රියාත්මක වන ආකාරය, විද්‍යාව හා තාක්ෂණය පරිණාමය වන ආකාරය, මිලියන ගණනක් ජනයා ක්‍රීඩාවෙන් ලබන ආස්වාදය සහ අධ්‍යාපන ක්ෂේත්‍රය ඇතුළු සමස්ත සමාජයේ නව ප්‍රවණතා යනාදිය පිළිබඳ එදිනෙදා ප්‍රවෘත්තිවලින් අවබෝධයක් ලබා දීමට හැකි වන බව ඉන්දීය පුවත් සේවා වාර්තා කරනවා. මෙය, ඒ අවබෝධය කුඩා කල පටන් ම ලබා ගැනීමට රටේ දරුවා හුරු කරලීම සඳහා ප්‍රායෝගික ව ගත හැකි ප්‍රශස්ත වෑයමක්.

**කටු**



# දෙසතිය
පුවත් සඟරාව

වෙළුම 48, කලාපය 01,
2026 ජනවාරි

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කරණ මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීම - ප්‍රකාශන කාර්යාංශය
දු. අ. 011 - 2512759

උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**

47 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව





20



12
අලුත් වන පාරිසරික නීති




03
සිහින ගමනාන්තය




35
සියවස සපුරන දේශීය සිනමාව 1925-2025



05
රේගුවේ ගමන




41
ආසියානු යොවුන් ක්‍රිකට්

# වගකීම් සහ යුතුකම් වැඩි වර්ෂයක්

නව වසර (2026) උදාවීම අභිමුව ශ්‍රී ලංකාවට ඉදිරි වසර දෙස බැලීමට සිදු ව ඇත්තේ පෙර වසරවලට වඩා වෙනස් මානයකින්. 2025 නොවැම්බර් 27-30 දිනවල ශ්‍රී ලංකාව හරහා හමා ගිය 'දිට්වා' සුළි කුණාටුව පරිපාලන දිස්ත්‍රික්ක 22ක ජන ජීවිත උඩුයටිකුරු කරමින් ආපදා පරිසරයක් නිර්මාණය කළා. එහි මතක නටබුන් ජන මනසින් වියැකී නොමැත්තේ සිදු වූ ජීවිත හා දේපළ හානි අතිමහත් නිසා.

මේ පසුබිම යටතේ ශ්‍රී ලංකාවට ආර්ථික, සමාජීය, දේශපාලන, අධ්‍යාපනික හා සංස්කෘතික ප්‍රමුඛ සෑම ක්ෂේත්‍රයක ම සපුරා ගත යුතු ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරන අතර ම වැඩි අවධානයක් දීමට සිදු ව තිබෙනවා ස්වාභාවික පාරිසරික අභියෝග ජය ගැනීම කෙරෙහි. සෑම ක්ෂේත්‍රයක් ම ඒකාබද්ධ ව ගමන් කළ යුතු වුවත් 'සුරක්ෂිත පරිසරයක්' යන්න වඩා වැදගත් බවත් 'දිට්වා' සිදු කළ ව්‍යසනය තහවුරු කළා. මේ නිසා පාරිසරික සුරක්ෂිතතාව වෙනුවෙන් කැප වීමට සෑම පුරවැසියෙකුට ම පැවරෙන්නේ දැඩි වගකීමක් හා යුතුකමක්.

ශ්‍රී ලාංකිකයන් වන අප ඇද වැටුණු සෑම මොහොතක ම ඒ මතින් යළි නැගී සිටීමට සමත්කම් දක්වා ඇත්තේ එකමුතුකම, සහයෝගිතාව, අන්‍යෝන්‍ය බැඳියාව යන මානව ගුණාංගවලින් පොහොසත් ජාතියක් වන නිසා. මෙවර මුහුණදුන් ස්වාභාවික ව්‍යසනය හමුවේදී ද එය වඩාත් ඉස්මතු වී පෙනුණේ රජය මැදිහත් ව දිවයිනේ විවිධ පාර්ශ්ව ඒකාබද්ධ කරගෙන දියත් කළ ස්වේච්ඡා සහන සේවා වැඩපිළිවෙළ ද නිසා. ව්‍යසනයෙන් සිදු වූ සමස්ත හානි පූර්ණය සඳහා අවශ්‍ය ඩොලර් බිලියන 05ක පමණ ඇස්තමේන්තුගත මුදල සපුරා ගැනීමට ශ්‍රී ලංකා රජයට සිදු වූ නිසා විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සහයෝගය හා විශ්වාසය දිනා ගනිමින් Rebuilding Sri lanka අරමුදල පිහිටුවමින් ඒ සඳහා ප්‍රවේශය ලබා ගැනීමටයි පියවර ගැනුණේ. ඒ ඔස්සේ සහ වෙනත් සැලසුම් හා ක්‍රියාමාර්ග ඇසුරෙන් ජන ජීවිත යථාවත් කිරීමට රට හමුවේ තිබෙන අභියෝගයට ජයග්‍රාහී ව මුහුණ දීමට නොසැලී ක්‍රියාත්මක වන මොහොතක් මේ.

විෂ මත්ද්‍රව්‍ය උවදුරෙන් රට බේරා ගැනීමේ 'රට ම එකට' ජාතික මෙහෙයුම ද අඛණ්ඩ ව මේ වන විට ක්‍රියාවට නංවමින් තිබෙනවා. භෞතික සංවර්ධනය මෙන් ම සමාජයේ යහපත් පැවැත්ම සහ ස්ථාවරභාවයේ වැදගත්කම රටේ ඉදිරි ගමනට තීරණාත්මක බව ජනාධිපතිවරයා නිරන්තරයෙන් අවධාරණය කරන කරුණක්. මේ නිසා 'රට ම එකට' ජාතික වැඩසටහන පුළුල් ව ඉදිරියට ක්‍රියාත්මක කිරීම මේ වසරේ ප්‍රමුඛ අරමුණක්. දිළිඳුකම තුරන් කිරීමේ ප්‍රජාශක්ති වැඩසටහන, ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන, ඩිජිටල්කරණය යනාදී රජයේ අනෙකුත් ප්‍රමුඛ වැඩසටහන් ද තවදුරටත් පුළුල් කරමින් රටේ භෞතික සංවර්ධනයත් මානව සංවර්ධනයත් නව දිශානතියකට ගෙන යාමයි රජයේ ඉදිරි අපේක්ෂාව.

ජනවාරි මාසය එළඹෙත් ම සිහිපත් කෙරෙන 'කළු ජනවාරිය' යන්න රටේ මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් හඬ නැංවෙන ප්‍රබල අවස්ථාවක්. ඒ අනුව එහි වින්දිතයන්ට යුක්තිය ඉටුවනු දැකීම මෙන් ම රටේ වංචා, දූෂණ සහ අපරාධ චෝදනා එල්ලවූවන්ට නිසි දඬුවම් හිමිවනු දැකීමත් ජනතාවගේ අභිප්‍රාය අතර වනවා. ඒ අනුව නව පාලනය යටතේ අපේක්ෂා කළ වෙනස තවදුරටත් ශක්තිමත් ව ඉටුවනු දැකීමටනම් මේ වසරේ රටේ ජනතාවගේ සහයෝගය පෙර වසරට වඩා රජයට ලබා දීමේ යුතුකමක් ජනතාව සතු ව ද පවතිනවා. ජනතා පරමාර්ථ ඉටු වී 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' උදා වනු දැකීම අපගේ ද අපේක්ෂාවයි.

මාලා මලීෂාන්ත ගුණසේකර

- සංස්කාරක -


දෙසතිය
පුවත් සඟරාව

දෙසතිය සඟරා දායකත්වය

වාර්ෂික දායකත්වය රු. 1680.00
අර්ධ වාර්ෂික දායකත්වය රු. 840.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදාළ බැංකු බැරපත හා සඟරා දායකත්ව කූපන්පත 0707444138 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759

දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..................
Address ..................
ID Number .................. Tel / Mobile ..................
Signature .................. Date..................



# සිහින ගමනාන්තය

පසිඳු මිහිරාන් රැටියල

සිහින ගමනාන්තය යනු දුම්රිය ස්ථාන නවීකරණය වෙනුවෙන් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද දැවැන්ත ව්‍යාපෘතියක්. රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය සහ මහජනතාව ඒකාබද්ධ වන මේ ව්‍යාපෘතියේ මූලික අදියර යටතේ දුම්රිය ස්ථාන 100ක් නවීකරණය කෙරෙනවා.

ජනාධිපති අතිරේක ලේකම්, ඉංජිනේරු එස්.පී.සී. සුගීෂ්වර සඳහන් කරන ආකාරයට මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ 'ක්ලීන් ශ්‍රී ලංකා' සංකල්පය අනුව සමාජයේ ආකල්ප වෙනස් කිරීම අරමුණු කරගෙන. දුම්රිය මගීන්ගේ ආකල්ප වෙනස් කිරීමටනම් දුම්රිය පද්ධතියේ වෙනස්කම් කිරීම අනිවාර්යයෙන් ම කළ යුත්තක්. ඒ අනුව දුම්රිය ගමන මගීන්ට සුවපහසු ප්‍රවාහන මාධ්‍යයක් බවට පත් කිරීම සඳහා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් දියුණු කිරීම මේ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් බවයි ඔහුගේ සඳහන. නවීකරණය වන සෑම දුම්රිය ස්ථානයක ම කසළවලින් තොර පිරිසිදු වටපිටාවක දුම්රියක් පැමිණෙනතුරු විවේකී ව ගත කිරීමට අවශ්‍ය පහසුකම්, ඒ අතරතුර පොත් පරිශීලනයට අවස්ථාව, රූපවාහිනියේ වැඩසටහන් නැරඹීමට අවශ්‍ය පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම මේ ව්‍යාපෘතිය යටතේ මගීන්ට හිමි වන ප්‍රතිලාභ. ආබාධ සහිත පුද්ගලයෙකුට වුව ද අවශ්‍ය පහසුකම් සැලසීම සුවිශේෂ කරුණක්.

වසර 76ක දුම්රිය දෙපාර්තමේන්තු ඉතිහාසයේ සිදු කළ බොහෝ ව්‍යාපෘති සඳහා මුදල් අයෝජනය කර ඇත්තේ ඒ ඒ රජය. එහෙත් මේ ව්‍යාපෘතියේදී බොහෝ දුම්රිය ස්ථාන නවීකරණය වන්නේ පෞද්ගලික අංශයේ මුදල් අයෝජනයෙන්. පෞද්ගලික අංශය සහ මහජන සහභාගිත්වයෙන් සිදු කරන නිසා රජයේ වියදම් අවම කර ගැනීමට අවස්ථාව හිමි වන බව ඉංජිනේරු එස්.පී.සී. සුගීෂ්වර සඳහන් කරන කාරණාවක්.

මේ ව්‍යාපෘතිය පිළිබඳ ව මූලික සාකච්ඡා ආරම්භ වන්නේ 2025 වසරේ ජූනි මාසයේදී. එම සැලසුම් අනුව වැඩ නිම කළ පළමු දුම්රිය ස්ථානය වුණේ තල්පේ දුම්රිය ස්ථානය. එය නවීකරණය සඳහා ගත වූ කාලය මාස 4ක්. මේ ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ ව අදහස් දක්වන ඉංජිනේරු එස්.පී.සී. සුගීෂ්වර; ”නිශ්චිත ප්‍රමිතියකට සහ ආකෘතියකට අනුව වසර 2කදී මේ ව්‍යාපෘතිය සාර්ථක ව අවසන් කිරීමයි අපේ සැලසුම. මේ වන විට නවීකරණය කරමින් පවතින දුම්රිය ස්ථාන සංඛ්‍යාව 7ක්. ඉදිරියේදී වැඩ ආරම්භ වීමට නියමිත දුම්රිය ස්ථාන සංඛ්‍යාව 5ක්. තල්පේ දුම්රිය ස්ථානයේ වැඩ අවසන් කිරීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දුන්නේ ස්ටාර් ගාමන්ට් පුද්ගලික සමාගම. ඔවුන් ඊට ප්‍රචාරණයක් බලාපොරොත්තු නොවීම විශේෂත්වයක්. විශේෂයෙන් එම ආයතනයේ සේවය කරන සේවකයන් රැසක් මේ දුම්රිය ස්ථානය භාවිත කිරීමත් රජයට සහය දැක්වීමත් ඔවුන්ගේ අභිප්‍රාය වුණා.”

තල්පේ දුම්රිය ස්ථානය අවම වශයෙන් වසරක කාලයකට නඩත්තු කිරීමට ස්ටාර් ගාමන්ට්ස් ආයතනය ම භාරගැනීම විශේෂත්වයක්. එම ආයතනය එහි නඩත්තු සිදු කරන්නේ ඔවුන්ගේ ආයතනයෙන් වැටුප් ගෙවන සේවකයන් දෙදෙනෙක් ද ලබාදෙමින්. දුම්රිය දෙපාර්තමේන්තුව ඔවුන්ට එම අයිතිය ලබා දෙන්නේ ගිවිසුමකින් බවත් මේ නඩත්තු සඳහා දුම්රිය ස්ථානයෙන් ස්ථානයට අනුගමනය කරන ක්‍රමවේදවල වෙනස්කම් පවතින බවත් මේ සියලු ම ක්‍රියාවලිය සිදු කරන්නේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ බවත් ඉංජිනේරු එස්.පී.සී. සුගීෂ්වර අවධාරණය කරනවා.

ව්‍යාපාරික ප්‍රජාවගේ ප්‍රධානතම සම්පත වන්නේ පාරිභෝගික ජනතාව. පාරිභෝගිකයා යනු මෙරට මහජනතාව. මේ වැඩසටහන ඔස්සේ මහජනතාවගේ පොදු සුභ සාධනය වෙනුවෙන් රටේ ව්‍යාපාරික ප්‍රජාව ඉදිරියට පැමිණීම පැසසිය යුත්තක්. ඒ වෙනුවෙන් මූල්‍ය ලාභ අපේක්ෂාවකින් තොර ව මුදල් ආයෝජනය කරමින් ඉදිරියට පැමිණි ව්‍යාපාරික ප්‍රජාව පිළිබඳ අදහස් දක්වන ඉංජිනේරු එස්.පී.සී. සුගීෂ්වර; "ඉදිරියේදී නාරාහේන්පිට, බම්බලපිටිය, අහංගම දුම්රිය ස්ථාන නවීකරණය ආරම්භ කිරීමට නියමිතයි. බම්බලපිටිය දුම්රිය ස්ථානය

ඕරා පෞද්ගලික ආයතනය විසින් නවීකරණය කරනු ලබන අතර ඒ සඳහා වැය කරන මුදල රුපියල් මිලියන 60ක්. මරදාන දුම්රිය ස්ථානයේ නවීකරණය සිදු කරන්නේ අක්බාර් සමාගම. ඒ සඳහා වැය වන මුදල මිලියන 40ක්. කදුරුවෙල දුම්රිය ස්ථානය නවීකරණය වන්නේ ඩඩ්ලි සිරිසේන ප්‍රමුඛ අරලිය සමූහ ව්‍යාපාරයේ මූල්‍ය අනුග්‍රහයෙන්. දෙහිවල දුම්රිය ස්ථානය නවීකරණය වෙනුවෙන් ද පෞද්ගලික ආයතනයක් ඉදිරිපත් ව සිටිනවා. ඒ අනුව ව්‍යාපෘතිය ඉදිරියට යන්නේ සැලකිය යුතු ප්‍රගතියකින්."

මේ ව්‍යාපාතිය හුදෙක් සාම්ප්‍රදායික ව සිදුවන ගොඩනැගිලි නවීකරණයක් නොවෙයි. මෙහිදී දුම්රිය ස්ථාන නවීකරණය වන්නේ සැලසුම් කළ ක්‍රමවත් ප්‍රමිතියකට අනුව වීම විශේෂත්වයක්.

නවීකරණය වන මේ සෑම දුම්රිය ස්ථානයක ම මගී ආරක්ෂාව වෙනුවෙන් සීසීටීවී කැමරා පද්ධති සවි කෙරෙන අතර දුම්රිය ස්ථාන පරිශ්‍රයට නොමිලේ අන්තර්ජාල පහසුකම ලබා දීමත් විශේෂත්වයක්. දුම්රිය ස්ථාන අවට ප්‍රදේශයේ වැදගත්කම නිරූපණය වන සේයාරූ සහ පැරණි සේයාරූ දැක්වෙන පුවරු ඒ ඒ ස්ථාවල සවි කිරීම ද මේ ව්‍යාපෘතියට සමගාමී ව සිදුවන්නක්. ඩිජිටල්කරණයට එක්වෙමින් දුම්රිය කාලසටහන් මෙහි ප්‍රදර්ශනය වන්නේ ඩිජිටල් පුවරු ඔස්සේ. ඊට අමතර ව ATM යන්ත්‍රයක් සවි කිරීමට ද දුම්රිය ස්ථානවල ඉඩකඩ වෙන් කිරීම දුම්රිය මගීන්ට අත්වන තවත් ප්‍රතිලාභයක්. සෑම දුම්රියපොළක ම නවීකරණය වන්නේ නිශ්චිත වර්ණ තේමාවක් සහිත ව. ඒ අනුව ජනසතු කෙරුණු තල්පේ දුම්රිය ස්ථානයේ ද කළුගල් බිත්තිවල පැවැති ස්වභාවය ඉස්මතු කර තිබූ අතර එහි වර්ණ තේමාව වුණේ කළු පැහැය.

බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන කිහිපයක් ම මේ වන විට රටේ විවිධ ප්‍රදේශවල ගොඩනැගෙමින් පවතිනවා. බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන සංකල්පයෙහි දුම්රිය නැවතුමට හිමිවන්නේ ප්‍රධාන ස්ථානයක්. බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන සංකල්පයට දුම්රිය ස්ථාන නවීකරණයේදී 'සිහින ගමනාන්තය' සංකල්පය ඒකාබද්ධ කරගැනීම කැපී පෙනෙන කාරණාවක්. ඒ අනුව ගොඩනැගෙමින් පවතින බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන යටතේ දුම්රිය ස්ථාන නවීකරණය වන්නේ නිසි ප්‍රමිතියකින් යුතු ව. ඒ පිළිබඳ අදහස් දක්වන ඉංජිනේරු එස්.පී.සී. සුගීශ්වර; "මහනුවර, අනුරාධපුර ආදී දුම්රිය ස්ථාන නවීකරණය වන්නේ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන සංකල්පය යටතේ. ඒ අනුව මහනුවර දුම්රිය ස්ථානය නවීකරණය අවසන් වන්නේ 2026 වසරේ මාර්තු මාසයේදී. මහනුවර දුම්රිය ස්ථානයේ නවීකරණ සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදෙන්නේ මාගා ඉංජිනියරින් සමාගම".



මේ ව්‍යාපාතිය හුදෙක් සාම්ප්‍රදායික ව සිදුවන ගොඩනැගිලි නවීකරණයක් නොවෙයි. මෙහිදී දුම්රිය ස්ථාන නවීකරණය වන්නේ සැලසුම් කළ ක්‍රමවත් ප්‍රමිතියකට අනුව වීම විශේෂත්වයක්. නවීකරණය වන මේ සෑම දුම්රිය ස්ථානයක ම මගී ආරක්ෂාව වෙනුවෙන් සීසීටීවී කැමරා පද්ධති සවි කෙරෙන අතර දුම්රිය ස්ථාන පරිශ්‍රයට නොමිලේ අන්තර්ජාල පහසුකම ලබා දීමත් විශේෂත්වයක්.

පුද්ගලික අංශය මේ කාර්යයේදී මූලිකත්වය ගත්තත් මේ සියලු ම කාර්ය සිදු කරන්නේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන් සහ අනුමැතියෙන්. විශේෂයෙන් ඒ ඒ පෞද්ගලික ආයතන වෙත කිසිදු මූල්‍ය වරප්‍රසාදයක් හිමි නොවන අතර ඔවුන්ගේ වෙළෙඳ සන්නාම පමණක් දුම්රිය ස්ථානයේ ප්‍රදර්ශනය කිරීමට අවකාශයක් පමණයි ලැබෙන්නේ. ඒ නිසා මේ කාර්ය පෞද්ගලීකරණය කිරීමක් යනුවෙන් වැරදි සහගත ලෙස වටහාගැනීම නොකළ යුත්තක් බවයි ඉංජිනේරු එස්.පී.සී. සුගීශ්වර සඳහන් කළේ.

මානව ආකල්ප සංවර්ධනය යනු රටක සංවර්ධනයේ පළමු පියවර. එය පුරවැසියන් ලෙස අප මනාව තේරුම් ගත යුත්තක්. නවීකරණය වන දුම්රිය ස්ථාන රැකගැනීමට ඍණාත්මක ආකල්පවලින් බැහැර වීමයි කළ යුත්තේ. තැන තැන බුලත් කෙළ ගැසීම, කුණු රොඩු දැමීම, ජල කරාම අඩක් වසා දැමීම, පොදු දේපළ සීරීම, කඩා බිඳ දැමීම නොකළ යුත්තක්.

දුම්රිය ස්ථානයේ වෙන් කළ කසළ බඳුන් ස්ථාපිත කරන්නේ කසළ නිසි පරිදි බැහැර කිරීමට. ඒ සඳහා උපදේශාත්මක පුවරු සවි කෙරෙනවා. ඒ ඔස්සේ මානව ආකල්ප දියුණු කරමින් සුන්දර දුම්රිය ස්ථානයක් පවත්වා ගැනීමයි ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අපේක්ෂාව.

රජයේ බදු මුදල් ඉතිරි කරගනිමින් රජයේ අධීක්ෂණයෙන් පෞද්ගලික අංශයේ දායකත්වයෙන් සිදු කෙරෙන මේ 'සිහින ගමනාන්තය' ව්‍යාපෘතිය යටතේ නවීකරණය වන දුම්රිය ස්ථාන රැකගැනීම පුරවැසියන් ලෙස සැමගේ යුතුකමක් සහ වගකීමක්. සංවර්ධනය කරා ගමන් කරන පොහොසත් රටකට ලස්සන ජීවිතයකට මෙවැනි ව්‍යාපෘති වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම වටිනා ආයෝජනයක්.

# රේගුවේ ගමන

බිනූ දිලාරා ගමගේ



රේගුවක ප්‍රධාන කාර්යභාරය වන්නේ දේශ සීමාවකින් තවත් දේශ සීමාවකට භාණ්ඩ හුවමාරු කර ගැනීමේදී ඒ සඳහා බද්දක් අය කර ගැනීම. මෙය අතීත මානව ශිෂ්ටාචාරවල පවා ප්‍රාථමික මට්ටමේ ඉටු වී තිබෙන්නක්. ලාංකේය සමාජයේත් අතීතයේ සිට ම ක්‍රමයෙන් වර්තමානය දක්වා වර්ධනය වී තිබෙන රේගු කාර්ය දකින්නට ලැබෙනවා. ඒ අනුව 'රේගු කාර්යයක් සිදු වුණා' ය යන්නට ශ්‍රී ලංකාවේ දැනට හමු වී ඇති පැරණිතම ලිඛිත සාධකය වන්නේ ගොඩවාය සෙල්ලිපිය. එම සෙල්ලිපියේ වලවේ ගංමෝය අසල පැවතුණ වරායකින් ගොඩ බස්සන භාණ්ඩ සඳහා බදු අය කළ බවත් එමගින් උපයන ආදායම කොටස් වශයෙන් රටේ භාණ්ඩාගාරයට, ගොඩවාය විහාරයේ නඩත්තු කටයුතුවලට සහ රාජකාරියේ නියුතු නිලධාරින්ගේ පඩිනඩි පියවීමට යොදා ගත් බවත් සඳහන්.

ශ්‍රී ලංකාවේ නිල වශයෙන් රේගු කාර්යයක් ආරම්භ වන්නේ 1806 බ්‍රිතාන්‍ය යටත්විජිතයක් ව පැවතුණ කාලයකදී. 1869 අංක 17 නමින් රේගු ආඥා පනත අනුමත කෙරෙන අතර වර්තමානය දක්වා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන්නේ මේ පනතේ නීති රෙගුලාසිවලට යටත් ව.

ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ චන්දන පුංචිහේවා සඳහන් කරන ආකාරයට ශ්‍රී ලංකා රේගුවට ප්‍රධාන කාර්යභාර හතරක් තිබෙනවා. ඉන් ප්‍රධාන ම කාර්යභාරය වෙන්නේ රජයට ආදායම් එක්රැස් කිරීම. රටේ ආදායම රැස් කරන ප්‍රධානතම රාජ්‍ය ආයතන තුන විදිහට ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා සුරාබදු දෙපාර්තමේන්තුව හඳුනා ගත හැකි බවත් 2025 වසරේ රජයේ ආදායමෙන් 50%කට වැඩි ආදායමක් රේගුව තනිව ම උපයා දී ඇති බවත් ඔහු පවසනවා. දෙවැන්න සමාජ ආරක්ෂණය. ශ්‍රී ලංකාව ලෝකයේ වරාය කේන්ද්‍රස්ථානයක් මෙන් ම ජෛව විවිධත්වයේ ද කේන්ද්‍රස්ථානයක්. එම නිසා භාණ්ඩ ආනයනයේදී සැලකිලිමත් වීමට සිදු වෙනවා පමණක් නොව නීති රැහැනට පිටින් සීමා කර හෝ තහනම් කර තිබෙන භාණ්ඩ මෙරටින් අපනයනය කිරීම සම්බන්ධයෙන් ද සැලකිලිමත් විය යුතු වෙනවා. ලංකාවට ආවේණික ජීවීන්, ශාක කොටස්, පුරාවිද්‍යාත්මක ද්‍රව්‍ය නීති විරෝධී විදිහට රටෙන් පිටමං කරනවා ද යන්න සොයා බැලීමටත් මත්ද්‍රව්‍ය, ප්‍රමිතියකින් තොර ඖෂධ, වෙනත් උපකරණ ගෙන්වීම් පාලනය කර ගැනීමේ මූලික වගකීමත් රේගුව සතු ව පවතිනවා. තුන් වැනි කාර්යය වන්නේ නීත්‍යනුකූල වෙළෙඳාමට පහසුකම් සැපයීම.

අදහස් දක්වන රේගු අධ්‍යක්ෂ; "අප සෑම විට ම උත්සාහ කරන්නේ නීත්‍යනුකූල ව වෙළෙඳාම් කරන සේවකයන්ට හැකි ඉක්මනින් අඩු ම පිරිවැයකින් රේගුවෙන් අදාළ භාණ්ඩ නිදහස් කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීමට. අනීතික ව සිදුවන වෙළෙඳාම නීතියෙන් අඩපණ කිරීමටත් පියවර ගන්නවා. නවීන තාක්ෂණය යොදාගෙන සැක කටයුතු බහාලුම් වැටලීම මෙන් ම ලෝක රේගු සංවිධානය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ මූලධර්ම වැනි ක්‍රමවේද අනුගමනය කිරීමට මුල් තැනක් දෙනවා. රේගුවේ හතර වැනි කාර්යභාරය විදිහට හඳුනා ගැනෙන්නේ දත්ත එක්රැස් කර ගැනීම. රටේ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී රජයට අවශ්‍ය වෙනවා භාණ්ඩ හා සේවා පිළිබඳ ආනයන අපනයන දත්ත. රටේ ඉල්ලුම අනුව භාණ්ඩ ආනයනයට යොමු විය යුතු අවස්ථා හඳුනා ගැනීමට, විනිමය අනුපාත ස්ථාවර ව පවත්වා ගැනීමට, දේශීය නිෂ්පාදකයන් රැක ගැනීමට අවශ්‍ය තීරු බදු පැනවීම් යනාදී බොහෝ කාරණා සඳහා මේ දත්ත රජය යොදා ගන්නවා."

2025 දෙසැම්බර් 30 දින වන විට එම වසරේ ආදායම වශයෙන් රුපියල් ට්‍රිලියන 2.55ක් උපයා ගැනීමට ශ්‍රී ලංකා රේගුවට හැකි වී තිබෙනවා. එය 2024 වසරේ ආදායම වූ රුපියල් බිලියන 1535ට වඩා ට්‍රිලියනයකින් වැඩි ආදායමක්. 2025 වසරේ අදායමෙන් වැඩි ප්‍රතිශතයක් සම්පූර්ණ වී තිබෙන්නේ මෝටර් රථ හා වාහන අමතර කොටස් ගෙන්වීමෙන් උපයා ගන්නා ලද ආදායමෙන්. එය 39%ක්. ඛනිජ තෙල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ගෙන්වීමෙන් උපයා ගත් 23% එහි දෙවැනි වැඩි ම ආදායම් ඉපැයීම. ඉතිරි 38% සම්පූර්ණ වී ඇත්තේ අනෙකුත් භාණ්ඩ හා සේවා අපනයනයෙන්. එම වසරේදී උපයා ගන්නා ලද රේගු ආදායමේ සුවිශේෂත්වයක් දක්නට ලැබෙනවා. ඒ,

අනෙකුත් වසරවලදී 80%කට ආසන්න ප්‍රමාණයක් වාහන ගෙන ඒම හා ඛනිජ තෙල් ආනයනය මගින් ආවරණය කිරීම වෙනස් වී එය 62% දක්වා අඩු වී වෙනත් ආදායම් ඔස්සේ ඉපැයීම් 20% ආසන්න ප්‍රමාණයකින් වැඩි කරගෙන තිබීම. මෙය වාහන ගෙන්වන ලද පසුගිය වසරවල උපයාගත් ආදායම් සමග සන්සන්දනය කිරීමෙන් පවා වඩාත් හොඳින් නිරීක්ෂණය වන කාරණාවක්. ඒ අනුව වාහන හා ඛනිජ තෙල් ආනයන ආදායම වැඩි වීම පමණක් මෙවර රේගු ආදායම ඉහළ යාමට හේතු වී නැහැ. පසුගිය වසරට සාපේක්ෂ ව මේ වසරේදී යන්ත්‍රෝපකරණ හා යාන්ත්‍රික සැපයුම් රුපියල් බිලියන 79 - 85 දක්වාත් ප්ලාස්ටික් ද්‍රව්‍ය රුපියල් බිලියන 54 - 60 දක්වාත් කිරි ආශ්‍රිත නිෂ්පාදන රුපියල් බිලියන 39 - 58 දක්වාත් යනාදී වශයෙන් සෑම ආනයන ආදායමක් ම මේ වසරේදී වැඩි වී තිබෙනවා.

එමෙන් ම 2017 වසරේ සිට ලබාගත් ආදායම් වාර්තාවල සඳහන් වන ආකාරයට රේගුවේ වාර්ෂික ආදායම් අපේක්ෂාව ඉලක්කගත සීමාවට වඩා පහළින් තිබී ඇති. එය 2017 වසරේදී රුපියල් බිලියන 80 ක් ද 2018 වසරේදී රුපියල් බිලියන 144 ක් ද 2019 වසරේදී රුපියල් බිලියන 300 ක් ද 2020 වසරේදී රුපියල් බිලියන 63 ක් ද 2021 වසරේදී රුපියල් බිලියන 33 ක් ද 2022 වසරේදී රුපියල් බිලියන 22 ක් ද වශයෙන් හඳුනා ගත හැකියි.

එහෙත් 2023 වසරේ සිට ශ්‍රී ලංකා රේගුවට ඉලක්කගත වාර්ෂික ආදායම් අපේක්ෂාව ඉක්මවා යමින් අමතර ආදායමක් උපයා ගැනීමට හැකි ව තිබෙනවා. 2024 වසරේ ද රුපියල් ට්‍රිලියනය ඉක්ම වූ ආදායමක් ලබා ගැනීමටත් එය 2025 වසරේදී රුපියල් ට්‍රිලියන දෙකහමාර ඉක්ම වූ ආදායමක් බවට වැඩි කර ගැනීමටත් හැකි වී තිබෙනවා.


අදහස් දක්වන අධ්‍යක්ෂ පුංචිහේවා; "රේගුවට ආදායම් එක්රැස් කිරීමේ මේ තරම් වර්ධනයක් අත්පත් කර ගැනීමට ප්‍රධානතම හේතුව වුණේ අවදානම් කළමනාකරණය අංශය. ඉතාමත් මෑත කාලයේදීයි මෙහි කටයුතු ආරම්භ කෙරුණේ. බහාලුම් පරීක්ෂාවේදී වඩාත් කාර්යක්ෂම කාර්යභාරයක් මෙයින් ඉටු කෙරෙනවා. විශේෂයෙන් භාණ්ඩ ආනයන ඉතිහාසය ඔස්සේ පරීක්ෂා කර කාලයක් තිස්සේ අනීතික ව භාණ්ඩ වෙළෙඳාම සිදු කෙරෙන කලාප, මාර්ග හා පුද්ගලයන් පිළිබඳ දත්ත ගොනු සකස් කර ගැනීම (Risk Profiles) සිදු වෙනවා. භාණ්ඩ අපනයනයේදී මෙන් ම ආනයනයේදී ද ඇති විය හැකි අක්‍රමිකතා මග හරවා රේගුවට ලැබිය යුතු නිසි බදු ආදායම් එලෙසින් අය කර ගැනීමටත් ඉවහල් වෙනවා. මේ ක්‍රියාවලිය ස්වංක්‍රීය පද්ධතියක් (Auto-mated Risk Management System) බවට සංවර්ධනය කිරීම ආරම්භ කළා. එමගින් හැකියාව ලැබෙනවා අවදානම් කළමනාකරණ දර්ශක වඩාත් නිවැරදි ව යාන්ත්‍රික ක්‍රියාවලියක් ඔස්සේ සකස් කර ගැනීමට. රේගු දෙපාර්තමේන්තුවේ සෑම කාර්යාල භූමිකාවක් ම හැකි පමණින් පරිගණකගත පද්ධතියක් ඔස්සේ ක්‍රියාත්මක කර ඩිජිටල්කරණය කිරීමට පියවර ගනිමින් තිබෙනවා. මේ නිසා ගෙවීම් පියවීම් පවා මුදල් නෝට්ටු, Pay Orders භාවිතයකින් තොර ව Bank to Bank මාර්ගගත ක්‍රමවේදය යටතේ පමණක් සිදු කිරීමටයි පියවර ගෙන තිබෙන්නේ. ඒ නිසා මෙතෙක් කල් මුදල් හුවමාරුවේදී ඇති වූ බොහෝ අකාර්යක්ෂමතා මගහරවා ගැනීමට හැකි වී තිබෙනවා.


අවදානම් කළමනාකරණ අංශය මේ වන විට සොයාගෙන තිබෙනවා භාණ්ඩවල වටිනාකම් නිර්ණයේදී අගය අඩුවෙන් තක්සේරු කිරීම් (Under Valuation) රජයට හිමි විය යුතු බදු ආදායමෙන් වැඩි කොටසක් අහිමි කරන බව. මේවා වැළැක්වීමට රේගුවේ මධ්‍යම තක්සේරු අංශය පියවරගෙන තිබෙනවා. මෙයින් සිදු වන්නේ භාණ්ඩවල සැබෑ මිලට වඩා අඩු වටිනාකම් තක්සේරුවක් සිදු කර ඇති ගනුදෙනු හඳුනාගෙන එම භාණ්ඩවලට නැවතත් අඩු අගයන් පැනවීමට නොහැකි පරිදි අදාළ පාර්ශ්ව වෙත නීතිය ක්‍රියාත්මක කිරීම. මේ ක්‍රියාමාර්ග ගැනීමෙන් 2025 වසරේ අමතර බදු විදිහට රුපියල් මිලියන 10,456ක මුදලක් මේ යටතේ එකතු කර ගැනීමට හැකි වී තිබෙනවා. මෙය සාපේක්ෂ ව සුළු මුදලක් වුවත් දිගින් දිගට ම මෙවැනි අකාර්යක්ෂමතා වසරක් පාසා වීමට ඉඩ හැරීමෙන් පාලනය කිරීමට නොහැකි වන විශාල පාඩුව මග හරවා ගැනීමට හැකියාව ලැබෙනවා."

දැනට මේ සියලු කාර්ය සිදු කිරීමට සිටින්නේ සීමිත රේගු නිලධාරීන් පිරිසක්. එබැවින් දැඩි සේවක අවශ්‍යතාවක් රේගු දෙපාර්තමේන්තුව සතු ව පවතිනවා. රේගු ආඥා පනතේ සංශෝධන කිරීමත් අපෙක්ෂාවක්. දැනට ආනයනය හා අපනයනයට අදාළ ව රේගු සටහන්කරණයක් සම්මත කිරීමට සිදු වන්නේ භාණ්ඩ මෙරටට ගෙන ඒමෙන් අනතුරුව. එහෙත් ලෝක රේගු සංවිධානය දැනට නිර්දේශ කරන විදිහට භාණ්ඩ ගෙන ඒමට පෙර ම (Pre-arrival Processing) ඒවා සටහන්කරණය කිරීම නිසා අදාළ බහාලුම් රටින් පිටත් කරන විට ම ශ්‍රී ලංකා රේගුවට අදාළ භාණ්ඩ සඳහා බදු අය කිරීමට අවශ්‍ය සියලු ම දත්ත පිළිබඳ ව කල්තියා ම දැනුවත් ව සූදානම් වීමට හැකියාව ලැබීම සුවිශේෂ කරුණක්.









# ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කර ගැනීම

නීතිඥ චතුෂි විදුෂිකා

ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය සහ ත්‍රස්ත ක්‍රියාකාරකම්වලට අදාළ ඉතිහාසය පිරික්සා බලන විට, එහි ආරම්භක නීතිමය පදනම වන්නේ 1947 මහජන ආරක්ෂක පනත. එය ත්‍රස්තවාදය වැළැක්වීම හෝ ත්‍රස්තවාදයට විරෝධය පළ කරන නීතියක් හෝ නොව, ජාතික හදිසි අවස්ථාවලදී විධායකයට අතිරේක ව බලයක් ලබාදෙන නීතියක්. මේ පනත භාවිතයෙන් හදිසි නීතියෙන් ත්‍රස්ත ක්‍රියා ලෙස අර්ථ දක්වන ලද ක්‍රියා මර්දනය, සංවිධාන තහනම් කිරීම, සැකකරුවන් අත්අඩංගුවට ගැනීම ආදිය සිදු කෙරුණා.

1978 සහ 79 කාලයේදී උතුරු-නැගෙනහිර ප්‍රදේශවල විවිධ සන්නද්ධ ක්‍රියා ආරම්භ වීමත් සමඟ ලංකා ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධාන තහනම් කිරීමේ පනත සම්මත කරමින් මෙරට ප්‍රථම ත්‍රස්තවාදයට එරෙහි වීමේ පනත හඳුන්වා දුන්නා. ඉක්බිති ව එය අහෝසි කරමින් 1979 ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සම්මත කෙරුණා. පසුකාලීන ව එය ස්ථිර නීතියක් බවටයි පත් වුණේ. සාක්ෂි රහිත ව වුව ද අත්අඩංගුවට ගන්නා සැකකරුවන් නඩු පැවරීමකින් තොර ව දිගු කාලයක් රඳවා තබා ගැනීම ආදී දෑ නිසා මානව හිමිකම් සංවිධාන සහ දේශීය, විදේශීය විවිධ පාර්ශ්වවල දැඩි විවේචන ඊට එල්ල වුණා. මේ පනත භාවිත කරමින් විවිධ වධ හිංසා සිදු කිරීම, බලහත්කාරයෙන් කටඋත්තර ගැනීම, ලිංගික අපචාර සිදු කිරීම සම්බන්ධ ව පොලිසියට සහ එවකට පැවති රජයට එල්ල වුණේ චෝදනා. මෙයට එල්ල වූ බරපතළ ම චෝදනාව වූයේ මාධ්‍යවේදීන්, දේශපාලනඥයන් ඇතුළු විරුද්ධ මතධාරීන් මර්දනයට, නිදහස් අදහස් ප්‍රකාශනයට බාධා කිරීමට පනත යොදාගන්නා බවට. මාධ්‍යවේදී ජේ. එන්. තිස්සනායගම් සහ දේශපාලනඥයෙකු වන අසාද් සාලි අත්අඩංගුවට ගත්තේ ද මේ පනත භාවිත කරමින්.

2015 වසරේදී ජිනීවාහි පැවති මානව හිමිකම් සැසිවාරයේ යෝජනා සහ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ සටහන් කරුණු අනුව අවධාරණය වූයේ මානව හිතවාදී පනතක අවශ්‍යතාව. විවිධ දේශපාලන මත සහ සිවිල් සංවිධානවල මත අනුව මේ පනතේ ප්‍රධානතම ගැටලුව වන්නේ 'ත්‍රස්තවාදය' යන්නට ලබා දී ඇති පුළුල් නිර්වචනය.

සුබවාදී කරුණු කොපමණ තිබුණත් ප්‍රායෝගික ක්‍රියාත්මක වීමේ අඩුපාඩු හේතුවෙන් සහ අනිසි දේශපාලන භාවිතය නිසා ඊට විවිධ විවේචන එල්ල වුණා. මෙවැනි පසුබිමක ජාතික ජන බලවේගය ප්‍රමුඛ වත්මන් රජය විසින් පැවති පනත අහෝසි කර 'ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත - 2026 (Protection of the State from Terrorism Act, No - 2026) හඳුන්වා දීමට යෝජනා කිරීම ප්‍රජාතන්ත්‍රවාදී නීති සංස්කෘතියක ආරම්භයක් ලෙස සැලකිය හැකියි. ඒ අතර එය නැවුම් නීතියක් ද? පැරණි නීතියේ ම තවත් කොටසක් ද? එහි අඩුපාඩු සහ සුබවාදී ලක්ෂණ මොනවා ද? යන්න විශේෂයෙන් සලකා බැලිය යුතුයි.

ඒ අනුව නව පනතේ වාසි කිහිපයක් පවතිනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පැවති දැඩි සහ අධිකරණ පාලනයෙන් තොර බලතලවලට සීමා පැනවීමට ගෙන ඇති උත්සාහය නව නීතියේ මූලික ම වාසියක්. සැකකරුවන් දීර්ඝ කාලයක් අධිකරණයට ඉදිරිපත් නොකර රඳවා තැබීම, අමාත්‍යවරයාගේ විධායක නියෝග මත නිදහස අහිමි කිරීම වැනි ක්‍රියාමාර්ග සීමා කිරීමට නව නීතියෙන් යෝජනා වී තිබෙනවා. ඒ අනුව 'නීතියේ ආධිපත්‍යය' යනාදී නීතිමය සංකල්ප ආරක්ෂා කිරීම සහ

21 වැනි සියවසයට ගැළපෙන නීති රාමුවක් මේ පනතේ දක්නට ලැබෙනවා. නියමිත කාලයක් ඇතුළත සැකකරුවකු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීම, වෛද්‍ය පරීක්ෂාව අනිවාර්ය කිරීම, නීතිඥයන්ට ඇති ප්‍රවේශය සහ ඥාතීන්ට දැනුම්දීම සම්බන්ධ ප්‍රතිපාදන, මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම්දීම වැනි කරුණු සඳහන් ව තිබීම නව පනත් කෙටුම්පතේ ඇති සාධනීය ලක්ෂණ කිහිපයක්. විවිධ මත අනුව මේ නීතිය හරියාකාරයෙන් ක්‍රියාත්මක වීමෙන් පසුගිය වකවානුවේ බහුල ව සිදුවුණු වධහිංසා, අයුතු රඳවා ගැනීම්, බලය අනිසි ලෙස භාවිත කිරීම් යනාදිය අවම කිරීමට හෝ තුරන් කිරීමට හෝ හැකියි.

ජනාධිපතිවරයා සතු ව පැවති අසීමිත බලය සීමා කිරීමත් මේ පනතේ වාසියක්. පෙර පැවති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ජනාධිපතිවරයාට තිබූ රැඳවුම් නියෝග නිකුත් කිරීමේ සහ කාලය දීර්ඝ කිරීමේ පුළුල් මෙන් ම අත්තනෝමතික බලය නව පනත් කෙටුම්පත යටතේ විමර්ශන සහ අධිකරණ ක්‍රියාමාර්ග දක්වා බලය බෙදාහැරීම වැනි සාධනීය පියවර සහිත ව වෙනස් ව තිබෙනවා. ඇතැම් පාර්ශ්ව පවසන පරිදි ස්වාධීන බව සහ ප්‍රායෝගික බව මෙහිදී වඩාත් කැපී පෙනෙන ලකුණු.

නීතිය, තාක්ෂණය, වෝහාරික විද්‍යාව, වෝහාරික මනෝ විද්‍යාව, මස්තු විද්‍යාව, ජාන විද්‍යාව, ඇඟිලි සලකුණු යනාදිය සම්බන්ධ දැනුම සහ විශේෂඥතාව සහිත පුද්ගලයන් ඇතුළත් විශේෂ විමර්ශන ඒකකයක් මේ නව පනතෙන් ස්ථාපිත කිරීම ත්‍රස්ත විමර්ශනය වෘත්තීයමය කිරීමේ උත්සාහයක් ලෙසත් දක්වන්න පුළුවන්. එහෙත් එම ඒකකයේ ස්වාධීනත්වය, පාර්ලිමේන්තු සහ අධිකරණ පාලනය තහවුරු නොකළහොත් එය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ම නව සංස්කරණයක් පමණක් බවට පත් වීමට ඉඩ තිබෙනවා. මේ සියවසට ගැළපෙන පරිදි නීති රාමුව සකස් කිරීමත් මහජන අදහස් කැඳවීමත් කලින් පැවැති සංවිධාන පමණක් පදනම් කරගත් ත්‍රස්තවාදයට සීමා නොවී ඩිජිටල් සන්නිවේදනය, අන්තර්ජාල ක්‍රියාකාරකම් ආශ්‍රිත අවදානම් ගැන ද සලකා බැලීමත් එහි තවත් සාධනීය කරුණු. එහෙත් ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේදී සුබවාදී බව අත්‍යවශ්‍යයි.

මේ නව පනතේ අවාසි පිළිබඳ ව ද විවිධ පාර්ශ්ව අදහස් පළ කරනවා. පැරණි පනතේ ඇතැම් බලතල වෙනස් නාමයෙන් අන්තර්ගත වීමේ අවදානම ඔවුන් පෙන්වා දෙන එක් අවාසියක්. අධිකරණ නියෝගයකින් තොර ව පුද්ගලයන් රඳවා තබා ගැනීම, සංවිධාන තහනම් කිරීම හෝ ඇතැම් ක්‍රියාකාරකම් 'රාජ්‍ය ආරක්ෂාවට තර්ජන' ලෙස පුළුල් ව අර්ථ දැක්වීමෙන් අනාගතයේදී දේශපාලන විරුද්ධවාදීන් සහ සිවිල් ක්‍රියාකාරිකයන් මර්දනය කිරීමට අනිසි ලෙස නීතිය භාවිත කිරීමේ අවදානම තිබෙන බවයි මෙයින් කියවෙන්නේ.

'ත්‍රස්තවාදයට සහාය දීම', 'රාජ්‍ය ආරක්ෂාවට හානිකර තොරතුරු' සහ 'ජාතික ආරක්ෂාවට බලපාන ක්‍රියා' වැනි යෙදුම් පැහැදිලි සීමා නොමැති ව භාවිත කළ හැකි බැවින් විරෝධතා, වෘත්තීය ක්‍රියාකාරකම්, මාධ්‍ය වාර්තා සහ දේශපාලන විවේචන පවා නීතිමය අවදානමට ලක්විය හැකි බවත් ඇතැමුන් පෙන්වා දෙනවා.

ජනාධිපතිවරයා සතු ව පැවති අසීමිත බලය සීමා කිරීමත් මේ පනතේ වාසියක්. පෙර පැවති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ජනාධිපතිවරයාට තිබූ රැඳවුම් නියෝග නිකුත් කිරීමේ සහ කාලය දීර්ඝ කිරීමේ පුළුල් මෙන් ම අත්තනෝමතික බලය නව පනත් කෙටුම්පත යටතේ විමර්ශන සහ අධිකරණ ක්‍රියාමාර්ග දක්වා බලය බෙදාහැරීම වැනි සාධනීය පියවර සහිත ව වෙනස් ව තිබෙනවා. ඇතැම් පාර්ශ්ව පවසන පරිදි ස්වාධීන බව සහ ප්‍රායෝගික බව මෙහිදී වඩාත් කැපී පෙනෙන ලකුණු.

මාධ්‍යවේදීන්ගේ සහ නීතිඥයන්ගේ වෘත්තීය රහස්‍යභාවයට ඇති කෙරෙන බලපෑම නව පනතේ අවාසිදායක කරුණක් ලෙස ගෙනහැර දක්වනවා. සම්පාදිත නව නීති යටතේ තොරතුරු වාර්තා කිරීම නොසලකා හැරීම හෝ සන්නිවේදන තොරතුරු ආදිය සඟවා තබා ගැනීම හෝ අපරාධයක් ලෙස වර්ගීකරණය කළ හැකි අතර එය මාධ්‍යවේදීන්, නීතිඥයන් සහ වෛද්‍යවරුන් වැනි වෘත්තීය කණ්ඩායම්වලට සදාචාරාත්මක සහ නීතිමය ගැටලු මතු විය හැකි බව ද පැවසෙන්නක්.

ඩිජිටල් නිදහස සහ පුද්ගලිකත්වය ගැන ද ඇතමුන් මත පළ කරනවා. හමුදාවට සහ පොලිසියට ලබා දී ඇති විමර්ශන පිළිබඳ සංකේතාත්මක සන්නිවේදනය සම්බන්ධ විධිවිධාන, ජංගම උපාංග සහ පරිගණකවල පුද්ගලික දත්ත ආරක්ෂාවට බලපාන්නේ සෘජු ව ම. ඇතැමුන් සැක පළකරන්නේ මේ බලතල අනිසි ලෙස භාවිත කිරීමේ අවදානමක් ගැන.

පනත් කෙටුම්පතේ 10 වැනි පරිච්ඡේදයේ විවිධ නියම මඟින් තහනම් නියම නිකුත් කිරීමට ජනාධිපතිවරයාට අසීමිත බලතල හිමිවන බවත් පැවසෙනවා. එය ද අවාසිදායක කරුණක් බවයි ඇතැම් පාර්ශ්ව පවසන්නේ.

මේ අනුව 'ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත' අවලංගු කර නව නීති මාලාවක් හඳුන්වාදීමට දරන උත්සාහය ප්‍රතිපත්තිමය වශයෙන් ධනාත්මක කරුණක් මෙන් ම ත්‍රස්තවාදය සහ ජාතික ආරක්ෂාව පිළිබඳ අපැහැදිලි අර්ථ දැක්වීම් 'ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පතට' ඇතුළත් වීම යම් අවදානම්සහගත තත්ත්වයක් ද ඇති කරනවා. එහෙත් ඕනෑ ම නීතියක් අත්තනෝමතික ලෙස සම්පාදනයකොට මහජනයා මත පැටවීම වෙනුවට මහජන අදහස්වලට ඉඩ දී සාධනීය වෙනසක් සඳහා විවෘතභාවයක් දැක්වීම ජනතාවාදී රජයක ලක්ෂණයක්. මේ මොහොතේ ඒ සඳහා ඉඩප්‍රස්ථා විවෘතයි. එබැවින් යෝජිත නව පනතට අදහස් ලබා දී නව යුගයට ගැළපෙන, සාධනීය නීතියක් ලෙස එය ස්ථාපිත කිරීමට සහාය ලබාදීමයි පුරවැසියාගේ වගකීම.



# 25න් 26ට

දීප්ත කුමාර බටගොඩ

ශ්‍රී ලංකා ඉතිහාසයේ දරුණුතම ආර්ථික පරිහානිය ඇති වූ වර්ෂය වශයෙන් 2022 වර්ෂය ඉතිහාසගත වන්නාක් මෙන් ම 2025 වර්ෂය ද ඒ සමාන ව ම ඉතිහාසගත වනු ඇති. ආර්ථික අර්බුදය හේතුවෙන් කඩා වැටී තිබූ ආර්ථිකය නැවත ස්ථාවරත්වයට පත් වීම, අස්ථාවරත්වයට පත් ව තිබූ දේශපාලන සංස්ථාව ප්‍රජාතාන්ත්‍රික බලවේග ඔස්සේ නැවත ස්ථාවරත්වයට පත් වීම සහ මෑත ඉතිහාසයේ දරුණුතම ස්වාභාවික ආපදාවට ශ්‍රී ලංකාවට මුහුණදීමට සිදු වීම එලෙස 2025 වර්ෂය ඓතිහාසික වශයෙන් වැදගත් වීමට හේතු.

මේ වන විට ජාත්‍යන්තර ප්‍රජාවගේ ද විශේෂ අවධානය ශ්‍රී ලංකාව වෙත යොමු ව තිබෙන්නේ 2025 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික අත්පත් කරගැනීම් මෙන් ම සිදු වූ ස්වාභාවික ආපදාව නිසා. ඒ අනුව දේශපාලන හා ආර්ථිකමය වශයෙන් ශ්‍රී ලංකාව අත්පත් කර ගනිමින් තිබූ සහ අපේක්ෂා කළ අරමුණු ස්වාභාවික ආපදාව හේතුවෙන් හංගත්වයට පත් වේවි ද? එසේ නැතහොත් ශ්‍රී ලංකාව පෙරටත් වඩා ධෛර්යයකින් යුතු ව නැගී සිටීවි ද? යන්න විමසීම වැදගත්.

## 2025 ආර්ථික ස්ථාවරත්වය

පැවති අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ඒ වන විට පැවති එක ම සහ හොඳම විසඳුම වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගැනීම බවට විද්වතුන් මත පළ කළා. කාලයක් තිස්සේ මේ බව ශ්‍රී ලංකාවට පෙන්වා දී තිබුණ ද එවක පැවති ආණ්ඩු මේ පිළිබඳ ව අවධානය යොමු කර තිබුණේ නැහැ. අර්බුදයේ දරුණුතම අවධිය වන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගැනීමට ශ්‍රී ලංකාව තීරණය කළා. ඒ, 2022 වර්ෂයේදී. ඒ අනුව ඔවුන් සමඟ ඇති කරගත් එකඟතාව ඔස්සේ ආර්ථිකය මෙහෙයවමින් ණය ප්‍රතිව්‍යුගතකරණයක් සඳහා පාර්ශ්ව එකඟ කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබුණා.

2024 වර්ෂය වන විට එම වැඩසටහනේ ප්‍රගතියක් පෙන්නුම් කිරීම ආරම්භ වී තිබූ අතර 2024 අගභාගයේදී අභිනවයෙන් පත් වූ ආණ්ඩුව විසින් ඔවුන්ගේ 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' තේමාව කරගත් ආර්ථික ප්‍රතිපත්තිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගිතා වැඩසටහන සමඟ ඒකාබද්ධ ව ක්‍රියාත්මක කළා.

2025 වර්ෂයේ මුල් කාර්තුව වන විටත් ආර්ථිකයේ යහපත් කළමනාකරණය තහවුරු කරමින් ආර්ථික සියයට 4.8ක වර්ධනයක් පෙන්නුම් කළ අතර එය දෙ වැනි හා තුන් වැනි කාර්තුවේ පිළිවෙළින් සියයට 4.9ක් හා සියයට 5.4ක වර්ධනයකුයි පෙන්නුම් කළේ. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉහළ වර්ධනයක් පෙන්නුම් කරන්නේ දෙ වැනි හා තුන් වැනි කාර්තුවේදී. කෙසේ වුවත් දිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ බරපතළ හානියත් සමඟ වර්ධනයේ යම් පසුබෑමක් ඇතිවිය හැකි බව විද්වතුන් ප්‍රකාශ කරනවා.

> 2025 වර්ෂය ආර්ථිකමය වශයෙන් ඓතිහාසික ව වැදගත් වන සිදුවීම් මාලාවක් වූ වර්ෂයක්. ප්‍රධාන වශයෙන් ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයට මුහුණදීමෙන් පසුව සාම්ප්‍රදායික දේශපාලන නායකත්වයෙන් බැහැර වූ, නව දේශපාලන නායකත්වයක් යටතේ ආර්ථිකයේ ස්ථාවරත්වය ඇති වූ වර්ෂය වීම කැපී පෙනෙන කාරණයක්. ඒ අනුව රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය ඇති කරමින් රාජ්‍ය ආදායම අපේක්ෂිත මට්ටම ඉක්මවා යාම මෙන් ම ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් පවත්වා ගැනීමට හැකිවේයැයි අපේක්ෂා කරන්නට පුළුවන්. 2024 අය වැයේ බොහෝ ක්ෂේත්‍රවල අපේක්ෂිත ඉලක්ක ඉක්මවා තිබීම ද 2025 වසරේ විශේෂත්වයක්.

2025 වර්ෂය ආර්ථිකමය වශයෙන් ඓතිහාසික ව වැදගත් වන සිදුවීම් මාලාවක් වූ වර්ෂයක්. ප්‍රධාන වශයෙන් ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයට මුහුණදීමෙන් පසුව සාම්ප්‍රදායික දේශපාලන නායකත්වයෙන් බැහැර වූ, නව දේශපාලන නායකත්වයක් යටතේ ආර්ථිකයේ ස්ථාවරත්වය ඇති වූ වර්ෂය වීම කැපී පෙනෙන කාරණයක්. ඒ අනුව රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය ඇති කරමින් රාජ්‍ය ආදායම අපේක්ෂිත මට්ටම ඉක්මවා යාම මෙන් ම ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් පවත්වා ගැනීමට හැකිවේයැයි අපේක්ෂා කරන්නට පුළුවන්. 2024 අය වැයේ බොහෝ ක්ෂේත්‍රවල අපේක්ෂිත ඉලක්ක ඉක්මවා තිබීම ද 2025 වසරේ විශේෂත්වයක්.

ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍රවල ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කිරීම ද මෙහිදී වැදගත්. සංචාරක ක්ෂේත්‍රය, අපනයන ක්ෂේත්‍රය ඇතුළු විදේශීය අංශයේ ප්‍රවණතා, දේශීය ආදායම් ක්ෂේත්‍රය ප්‍රවණතාවල කැපී පෙනෙන ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර තිබෙනවා. 2025 වර්ෂයේ ශ්‍රී ලංකාව ඩොලර් බිලියන 18ක අපනයන ආදායමක් අපේක්ෂා කළා. නොවැම්බර් මාසය දක්වා වූ ආදායම ඩොලර් බිලියන 15.8ක් පමණ වෙනවා. අපේක්ෂිත මට්ටම කරා ළඟා විය නොහැකි වුවත් 2025 වර්ෂය අවසානය වන විට සමස්ත අපනයන ආදායම ඩොලර් බිලියන 17ක් විය හැකි බවයි ක්ෂේත්‍රයේ විශේෂඥයන් මත පළ කරන්නේ. එසේ වුවහොත් 2025 වර්ෂය ශ්‍රී ලංකා ඉතිහාසයේ වැඩි ම අපනයන ආදායම ඉපයූ වර්ෂය වනු ඇති. මේ සියලු අත්පත් කර ගැනීම් ශ්‍රී ලංකාවට ළඟා කරගත හැකි වූයේ ජාත්‍යන්තර හා ජාතික වශයෙන් විවිධ අභියෝග රාශියකට (ඇමරිකාවේ තීරු බදු සංශෝධනය, දිට්වා සුළි කුණාටුව වැනි) මුහුණදෙමින් බවයි කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සුරංග ද සිල්වා පවසන්නේ.

විදේශ ප්‍රේෂණ ඩොලර් බිලියන 07ක් ලබා ගැනීම, විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 06ක ඉහළ මට්ටමක පවත්වාගෙන යාම, පොලී අනුපාතිකය හා උද්ධමනය ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාම විවිධ අභියෝග මැද 2025 වර්ෂයේ ශ්‍රී ලංකාව අත්පත් කරගත් සාර්ථකවීම් බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය වසන්ත අතුකෝරළ පෙන්වා දෙනවා. රුපියල යම් ආකාරයක අවප්‍රමාණයකට ලක් වුවත් එය ඉහළ උච්චාවචනයට ලක් නොවී පවත්වා ගැනීමටත් හැකි ව තිබෙනවා. දිට්වා සුළි කුණාටුව නිසා යම් පසුබෑමක් තාවකාලික ව ඇති විය හැකි වුවත් එය 2026 වර්ෂයේ පළමු කාර්තුවෙන් පසුව නැවතත් සියයට 05 හෝ එයට ඉහළ ආර්ථික වර්ධනයක් බලාපොරොත්තු විය හැකි බවයි ඔහු පවසන්නේ.

## දිට්වා සුළි කුණාටුව සහ ආර්ථික හානිය

අභියෝග රැසක් මැද ශ්‍රී ලංකාව ආර්ථිකමය වශයෙන් යම් ස්ථාවරභාවයකට පත්වෙමින් සිටින මොහොතකයි 2025 දෙසැම්බර් මාසයේදී දිට්වා සුළි කුණාටුව පැමිණියේ. මෙහිදී ශ්‍රී ලංකාවේ වාරිමාර්ග පද්ධතියට, කෘෂිකර්මාන්තයට, ප්‍රවාහන පද්ධතියට, කර්මාන්ත ක්ෂේත්‍රයට හා සාමාන්‍ය ජන ජීවිතයට විශාල ලෙස බලපෑම් සිදු වුණා. දේපළ හානි පමණක් නොව ජීවිත හානි ද සිදු වුණා. ලෝක බැංකුව ඇස්තමේන්තු කරන පරිදි දේපළ හානියේ දළ මූල්‍යමය පාඩුව ඇමරිකානු ඩොලර් බිලියන 4.1ක් තරම්. එහෙත් ඇතැම් පිරිස් දක්වන්නේ මෙය ඩොලර් බිලියන 7ක් පමණ වන බවක්. මහාචාර්ය නාරද්ද ගමගේ පවසන්නේ හානි ඇස්තමේන්තු කිරීම සඳහා යම් කාලයක් ගතවිය හැකි බවත් එය සාධාරණ තත්ත්වයක් බවත් දළ වශයෙන් මෙහි හානිය ඩොලර් බිලියන 5-7ත් අතර පැවතිය හැකි බවත්.

සිදු වූ හානියේ බලපෑම අවම කර ගැනීමටත් රටේ සාමාන්‍ය ජනජීවිතය යථාවත් කර ගැනීමටත් ජාතික හා ජාත්‍යන්තර සහයෝගය නොමඳ ව ලැබීම විශේෂත්වයක්. කෙසේ වුවත් සිදු වූ අලාභ හානි නැවත යථාවත් කර ගැනීමට යම් කාලයක් ගතවනු ඇති. මහචාර්ය වසන්ත අතුකෝරළ පවසන පරිදි 2026 මුල් කාර්තුවේ ආර්ථිකයේ වර්ධනය යම් ප්‍රමාණයකින් අඩු විය හැකි වුවත් ඉන්පසුව අපේක්ෂිත වර්ධනය වන සියයට 05 මට්ටම හෝ එය අභිභවා යාමට ශ්‍රී ලංකාවට හැකි වනු ඇති. ශ්‍රී ලංකා මහබැංකු අධිපතිවරයා ද ප්‍රකාශ කර තිබුණේ 2026 වර්ෂය ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉහළ වර්ධනයක් අපේක්ෂා කළ හැකි බවක්.

## 2026 ආර්ථික අභියෝග

ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම ආර්ථික ගැටලුව වන්නේ ආර්ථිකයේ වර්ධනය හා ස්ථාවරත්වය අපේක්ෂා කරන අතරතුර ම විදේශ ණය සේවාකරණය කිරීමේ දුෂ්කරතාව. ආර්ථිකය වර්ධනය සඳහා යොදන උපායමාර්ගික ක්‍රියාකාරකම්වලින් කොටසක් නිරතුරු ව ම ආර්ථිකයෙන් කාන්දු වීමක් මේ නිසා සිදු වෙනවා. එසේනම් එම කාන්දු වනවාට සමගාමී ව අපේක්ෂිත ආර්ථික වර්ධනයේ තරම සහ වේගවත් බව ඉහළ තලයක රඳා පවත්වා ගැනීම කළ යුතුයි. මෙය 2026 වර්ෂයේ පමණක් නොව දිගුකාලීන ව පවතින අභියෝගාත්මක තත්ත්වයක්. අනෙකුත් සියලු ම අභියෝග මතු වන්නේ මේ දිගුකාලීන වූ අභියෝගය ජය ගැනීමට භාවිත කරන උපායමාර්ගික සැලසුම අනුව.

### 2025 ආර්ථික ඉතිහාසයට

- කොටස් වෙළෙඳපොළේ ඉහළ ම වර්ධනයක්
- වැඩි ම සංචාරක පැමිණීම
- වැඩි ම විදේශ ප්‍රේෂණ
- වැඩි ම සුරාබදු ආදායම
- වැඩි ම රේගු ආදායම
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉපයූ වැඩි ම ආදායම



> ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම ආර්ථික ගැටලුව වන්නේ ආර්ථිකයේ වර්ධනය හා ස්ථාවරත්වය අපේක්ෂා කරන අතරතුර ම විදේශ ණය සේවාකරණය කිරීමේ දුෂ්කරතාව. ආර්ථිකය වර්ධනය සඳහා යොදන උපායමාර්ගික ක්‍රියාකාරකම්වලින් කොටසක් නිරතුරු ව ම ආර්ථිකයෙන් කාන්දු වීමක් මේ නිසා සිදු වෙනවා. එසේනම් එම කාන්දු වනවාට සමගාමී ව අපේක්ෂිත ආර්ථික වර්ධනයේ තරම සහ වේගවත් බව ඉහළ තලයක රඳා පවත්වා ගැනීම කළ යුතුයි. මෙය 2026 වර්ෂයේ පමණක් නොව දිගුකාලීන ව පවතින අභියෝගාත්මක තත්ත්වයක්.

2026 වර්ෂය සලකා බැලුවහොත් පවතින කෙටිකාලීන අභියෝගය විය හැක්කේ දිට්වා සුළි කුණාටුව නිසා සිදු වූ හානි පූර්ණය. රජය එය දැනටමත් සාර්ථක ව සිදු කරමින් සිටින්නේ ලැබෙන ජාතික හා ජාත්‍යන්තර සහයෝගය සමඟ. දැනටමත් විදේශ කටයුතු අමාත්‍ය විජිත හේරත් පවසන්නේ ඒ සඳහා රුපියල් බිලියන 85ක තරම් ඍජු හා වක්‍ර ආධාර ලැබී ඇති බව. රජය විසින් මේ වන විටත් ඒ සඳහා රුපියල් බිලියන 500ක මුදලක් වෙන්කර තිබෙනවා. අදහස් දක්වන මහාචාර්ය නාරද්ද ගමගේ;"දිට්වා සුළි කුණාටු හානි පූර්ණය සඳහා ඩොලර් බිලියන 05ක පමණ මුදලක් අවශ්‍ය වෙනවා. Rebuilding Sri Lanka අරමුදලත් රජය විසින් පසුගිය වර්ෂයේ වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම් සහ දැනට වෙන් කර ඇති රුපියල් බිලියන 500ට අමතර ව ඉන්දියාව විසින් ලබා දෙන ඩොලර් මිලියන 450ක සහන පැකේජය, ලෝක බැංකුව විසින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලබාදෙන ඩොලර් මිලියන 200ක මුදල, ආසියානු සංවර්ධන බැංකුව ලබාදෙන ඩොලර් මිලියන 200ක ණය මුදල, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් රජයේ ඉල්ලීමකට අනුව ලබාදෙන ඩොලර් මිලියන 206ක මුදල දිට්වා සුළි කුණාටුවේ හානි පූර්ණය සඳහා වැය කළ හැකි වෙනවා. මේ ලැබීම්වලට අමතර ව හානි පූර්ණය සඳහා ජාත්‍යන්තර පරිත්‍යාගශීලීන්ගේ සමුළුවක් පැවැත්වීමට අපේක්ෂාවක් තිබෙනවා. එමගින් ඩොලර් බිලියනයක මුදලක් අපේක්ෂිතයි. දැනට තිබෙන මුදල් ප්‍රමාණය සමස්ත හානි පූර්ණය සඳහා ප්‍රමාණවත් නැහැ. එම නිසා ඉදිරි වසර දෙක තුන තුළ සමස්ත හානි පූර්ණය සඳහා තවදුරටත් ජාත්‍යන්තර වශයෙන් සහයෝගය හෝ මූල්‍ය පහසුකම් හෝ ලබා ගැනීමට සිදු වේවි".



සුළි කුණාටුව අතර වුවත් ඉතිහාසයේ වැඩි ම සංචාරකයන්ගේ පැමිණීම සහ ඉහළ ම සංචාරක ආදායම උපයා ගැනීමට හැකි වී තිබෙනවා. සංචාරක කර්මාන්තයෙන් අපේක්ෂිත ආදායම ඩොලර් බිලියන 05ක් වුවත් ලැබී ඇත්තේ ඩොලර් බිලියන 3.2ක් පමණ. එහෙත් එය ඉතිහාසගත ආදායම්වලට සාපේක්ෂ ව ඉහළ ඉපයීමක්. කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සුරංග ද සිල්වා පවසන්නේ ශ්‍රී ලංකාවේ සංචාරක පැමිණීම ඉහළ ගියත් ආදායම අපේක්ෂිත මට්ටම ළඟා කර ගැනීමට නොහැකි වීමට හේතු කිහිපයක් ම පවතින බව. මෙරටට වැඩි ම සංචාරකයන් පිරිසක් පැමිණෙන්නේ ඉන්දියාවෙන්. පැමිණෙන සංචාරකයන් වැඩි දින ගණනක් රඳවා ගැනීමට සංචාරකයන් සඳහා ලබාදෙන අත්දැකීම් පුළුල් පරාසයක් විහිදුවමින් ඔවුන්ගේ දෛනික වියදම් පරාසය පුළුල් කිරීමෙන් මේ තත්ත්වය සාධනීය තත්ත්වයක් දක්වා වර්ධනය කර ගැනීමට හැකියාව තිබෙන බව ඔහු පෙන්වා දෙනවා.

ශ්‍රී ලංකාව මූලික වශයෙන් ආනයන අපනයන මත රඳා පවතින ආර්ථිකයක්. මේ නිසා නිල විදේශ සංචිත ඉහළ මට්ටමක රඳවා තබා ගැනීම අත්‍යවශ්‍ය වෙනවා. ආර්ථික අර්බුද සමයේ දළ නිල සංචිත ප්‍රමාණය ඉතා පහළ තත්ත්වයක පැවතීමෙන් පසුව එය ඩොලර් බිලියන 06ට වඩා ඉහළ මට්ටමේ පවත්වාගෙන යමින් තිබෙනවා. ඉදිරි විදේශ ණය සේවාකරණ පිළිබඳවත් සලකා බලන විට දළ නිල සංචිත ප්‍රමාණය තවදුරටත් ඉහළ නංවා ගැනීමේ අවශ්‍යතාවක් පවතිනවා. රටට විදේශ විනිමය ලබා ගැනීමේදී අපනයන වෙළෙඳපොළ, සංචාරක කර්මාන්තය හා ඍජු විදේශ ආයෝජන ඉහළ නංවා ගැනීම තවදුරටත් පුළුල් කිරීමේ හැකියාවකින් යුත් ක්ෂේත්‍ර වශයෙන් හඳුනා ගන්න පුළුවන්. මහාචාර්ය නාරද්ද ගමගේ පවසන්නේ විදේශ ආයෝජන සඳහා පවතින ව්‍යුහාත්මක සහ නීතිමය බාධා පිළිබඳ ව රජය අවධානය යොමු කළ යුතු බව. තීරණ ගැනීම සඳහා පවතින විශාල ආයතනික පද්ධතිය හේතුවෙන් ඒවායේ ප්‍රමාදයක් සිදු විය හැකි බවත් එම නිසා පූර්ව සැලසුමක් සහිත රටේ සංවර්ධනය උදෙසා වන ව්‍යුහාත්මක සහ නීතිමය සංශෝධන සිදු කිරීමෙන් රජයට අපේක්ෂිත ගමන යා හැකි බවත් ඔහු පෙන්වා දෙනවා.

විනිමය අනුපාතිකය ස්ථාවර ව පවත්වා ගැනීම, රජයේ ප්‍රාග්ධන වියදම් අපේක්ෂිත ආකාරයෙන් වියදම් කිරීම සහ උද්ධමනය සියයට 05කට අඩු මට්ටමේ පවත්වා ගැනීම ශ්‍රී ලංකාව ඉදිරියේදී මුහුණ දිය හැකි අභියෝග. 2026 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික අපේක්ෂා රජයට ළඟා කර ගැනීමේ හැකියාව පවතින්නේ පැහැදිලි සහ නිවැරදි ආර්ථික කළමනාකරණයෙන් පමණක් ම නොව රාජ්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ පවතින විනිවිදභාවයත් එම තොරතුරු ශ්‍රී ලංකාවේ මහජනතාවට නිවැරදි ව ගලා යාමේ ක්‍රියාවලිය ඔස්සේ මහජනතාවගෙන් රජයට ලැබෙන සහයෝගය මතත්. ඇතැම් ජනමාධ්‍ය ආයතනවලින් මහජනතාවට සාවද්‍ය තොරතුරු ගලා යාම නිසා මහජන සහයෝගය රජයට නොලැබී යාමේ අවදානමක් පවතිනවා. මේ නිසා මහජනතාවට නිවැරදි තොරතුරු පමණක් ලබා ගැනීමට අවස්ථාව සැලසීමත් ඒ ඔස්සේ උපරිම මහජන සහායෝගයකින් යුතු ව 2026 වර්ෂයේ සංවර්ධන ආර්ථිකයට අඩිතාලම සකස් කර ගැනීමත් කළ යුත්තක්.

# අලුත් වන පාරිසරික නීති



**රංගිකා අබේසේකර**

පරිසරය යනු වෙනස් වන පද්ධතියක්. විශේෂයෙන් යුගයේ අවශ්‍යතාව මත ඒ හා බැඳුණු නීතිරීති යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය කාරණාවක්. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සම්මත වීම මෙරට පාරිසරික පද්ධතියට නෛතික රාමුවක් එක් කළ අවස්ථාවක්. අවශ්‍යතාව මත 1988 සහ 2000 වසරවලදී මේ පනත සංශෝධනය කර තිබෙනවා. තාක්ෂණයේ නවතාව, පරිසර දූෂණ තත්ත්ව හා ගෝලීය ජන ජීවිතයේ වෙනස්වීම් යන සියල්ල සලකා බලමින් නව කාරණා ඇතුළත් කර වසර 25කට පසුවයි මෙලෙස ජාතික පාරිසරික පනත සංශෝධනය වන්නේ. ඒ සඳහා 2025 දෙසැම්බර් මසදී කැබිනට් මණ්ඩල අනුමැතිය හිමි වුණා.

ජාතික පාරිසරික පනතේ නව සංශෝධන ඇතුළත් වන ආකාරය පිළිබඳ ව අදහස් දක්වන පරිසර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිසර සහ සැලසුම්) පද්මා අබේකෝන්; "2000 වසරෙන් පසුව මේ පනත සංශෝධනය කර නැහැ. පරිසර ප්‍රතිපත්තිය සහ ඒ හා සම්බන්ධ අනෙකුත් ජාත්‍යන්තර වශයෙන් ඇති බැඳීම් මෙහිදී සලකා බැලීම වැදගත්. ප්‍රධාන වශයෙන් ජාතික ප්‍රතිපත්තියේ ඇත්තේ සියලු අංගවලින් පරිසරය සුරක්ෂිත කළ යුතුයි යන කාරණාව. ඒ අතර අපද්‍රව්‍ය කළමනාකරණය විශේෂිත වනවා. ඒ යටතේ වායු දූෂණය, පස දූෂණය සහ ජල දූෂණය යන අංග 3ම එහි සඳහන්. ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්මේ ද කසල කළමනාකරණය හඳුනාගෙන තිබෙනවා Collective Waste Management යන අංගය යටතේ. මේ සියල්ල සලකා බලන විට අපට තිබෙනවා තිරසර සංවර්ධනය සඳහා වූ ඉලක්ක".

භූමිය සංරක්ෂණය සහ සමුද්‍රීය පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා මේ පනතේ තිබෙන කරුණු ඉතා වැදගත්. මේවා එකිනෙක විශ්ලේෂණයේදී පෙනී යන්නේ පරිසර පනතේ සංශෝධනවලට ඒවා ඇතුළත් විය යුතුයි යන කාරණය. පිරිසිදු පරිසරයක් ඇති කිරීමේදී ඇති බාධක හඳුනාගෙන තිබෙනවා. විවිධ කාර්ය සහ කර්මාන්ත සඳහා භාවිත කරන උපද්‍රවකාරී රසායනික අපද්‍රව්‍ය එහිදී ප්‍රධානයි. අදහස් දක්වන අතිරේක ලේකම් (පරිසර සහ සැලසුම්) පද්මා අබේකෝන්; ජලය, පස සහ වායුගෝලය පිරිසුදු කර නොගතහොත් කිසිවෙකුට ජීවත්වීමට නොහැකියි. ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය සුලබ ව දක්නට ලැබෙන ගැටලුවක්. 'Ending Plastic Pollution' යන තේමාව යටතේ 2025 පරිසර දිනය අප සැමරුවා. නීතියෙන් බැඳුණු ජාත්‍යන්තර නීතිය ස්ථාපිත කිරීම සඳහා මේ වන විටත් ලෝක ප්‍රජාව ක්‍රියා කරමින් සිටිනවා. එහිදී ප්ලාස්ටික් කළමනාකරණය සඳහා වන දැඩි නීතිරීති තිබිය යුතුයි. මේ සඳහා නව පනත යටතේ හඳුන්වා දී තිබෙනවා නිෂ්පාදකයාගේ විස්තීර්ණ වගකීම (Extended Producer Responsibility)".

මේ වගකීම යටතේ ප්ලාස්ටික් ඇතුළු අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියේ ධාරිතාව වැඩි කිරීමට අපේක්ෂා කරනවා. මේ ක්‍රමය හඳුන්වා දීමෙන් පසු මධ්‍යම පරිසර අධිකාරිය අවශ්‍ය රෙගුලාසි සකස් කරමින් තෝරාගත් ප්ලාස්ටික් සහ ඉලෙක්ට්‍රොනික අයිතම සඳහා නිෂ්පාදකයාගේ විස්තීර්ණ සංකල්පය (EPR) ක්‍රියාත්මක කිරීමට නියමිතයි. ඒ ඔස්සේ ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලිය දිරිගැන්වෙනු ඇති. ආයතනයකට ඉලක්කයක් ඇත්නම් තමන් නිෂ්පාදනය කළ ප්ලාස්ටික් ප්‍රමාණය සියයට 90ක් නැවත ප්‍රතිචක්‍රීයරණය කරන පද්ධතියට ගැනීමට එයින් ධාරිතාමය වැඩි දියුණුවීමක් සිදු කිරීමට අපේක්ෂා කරන බවයි මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කපිල මහේෂ් රාජපක්ෂ සඳහන් කරන්නේ.

ශ්‍රී ලංකාව අත්සන් තැබූ 'රැම්සා' සම්මුතිය යටතේ තෙත්බිම් වටිනා පරිසර පද්ධතියක් ලෙස හඳුනාගෙන තිබෙනවා. එහෙත් තෙත්බිම්වලට ඇති ආරක්ෂාව මේ වනවිට පවතින්නේ අඩු මට්ටමක. ජලය රඳවා ගැනීම සිදු කරන්නේත් මේ තෙත්බිම්. එහිදී ජලයේ ඇති රසායනික ද්‍රව්‍ය අවශෝෂණය කෙරෙනවා. තෙත්බිම් සංරක්ෂණයට අදාළ නව කාරණා රාශියක් නව පනතේ ඇතුළත් කර තිබෙන්නේ ගෝලීය ප්‍රතිපත්තිවලට



ගැළපෙන ආකාරයට පරිසර පද්ධතිය ආරක්ෂා කරගැනීමේ අරමුණෙන්. පරිසර කළමනාකරණය කෙතරම් වැදගත් යන්න මෑතකාලීන ස්වාභාවික විපත් සාක්ෂි දරනු ඇති.

අදහස් දක්වන මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කපිල මහේෂ් රාජපක්ෂ; "ජාතික පරිසර පනත ක්‍රියාත්මක කරන නියාමන අධිකාරිය වන්නේ මධ්‍යම පරිසර අධිකාරිය. අප හමුවේ ඇති අභියෝගය වන්නේ ශ්‍රී ලංකාවේ ඇති පරිසර නීති බලාත්මක කරගැනීම සහ අපේක්ෂිත අනුකූලතා මට්ටමට පවත්වාගෙන යාමට පනතේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. ඒවා මඟහරවා ගැනීමට නව සංශෝධනයේදී විශාල ප්‍රතිපාදන ගණනාවක් එකතු කර තිබෙනවා. මෙරට වායුගෝලීය තත්ත්ව, ශබ්ද මට්ටම් සහ ජලයේ ගුණාත්මකභාවය වැනි අංශ සම්බන්ධයෙන් අප ආයතනය වරින් වර පාරිසරික ප්‍රමිති, උපමාන හඳුන්වා දී තිබෙනවා. නියාමනය පවත්වාගෙන යාමට තිබුණු අපහසුතාවක් වන්නේ මේ සඳහා පනවා තිබූ නීතිරීති සහ දඬුවම් අතර පැවති පරස්පරතාව. එහෙත් මේ පනත යටතේ වායු දූෂණය, ශබ්ද දූෂණය, ජල දූෂණය හා කම්පනවලින් ඇති වන පාරිසරික හානි කිරීම්වලදී ඒවා සිදුකරන පුද්ගලයන් වරෙන්තු නොමැති ව අත්අඩංගුවට ගැනීමේ නීතිය බලාත්මක කරගැනීමට විශේෂ ප්‍රතිපාදන තිබෙනවා. විශේෂයෙන් පළාත් පාලන ආයතන සතු ව තිබෙනවා අදාළ ප්‍රදේශයේ පරිසර කළමනාකරණය සඳහා වන වගකීම් සමුදායක්. එම වගකීම් නිසියාකාරයෙන් ඉටු නොවන අවස්ථාවලදී ඒ සඳහා මැදිහත්වීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ද සංශෝධනවලට ඇතුළත්. මෙවැනි අවස්ථාවක මධ්‍යම පරිසර අධිකාරියට යම් කිසි පළාත් පාලන ආයතනයකට අවශ්‍ය මැදිහත්වීමක් සිදුකිරීමට සහ අදාළ ප්‍රදේශවල මහේස්ත්‍රාත්වරුන්ට අදාළ නියෝග නිකුත් කිරීමේ බලතල ලැබීම විශේෂත්වයක්".


බාසල් සම්මුතිය, ස්ටොක්හෝම් සම්මුතිය වැනි සම්මුති පිළිගත් රටක් ලෙස රසායනික අපද්‍රව්‍ය භාවිත කිරීමේදී පවත්වාගෙන යා යුතු ක්‍රමවේද ස්ථාපිත කර ගැනීමට නව සංශෝධනවලින් අවකාශ ලැබෙනවා. ඒ අනුව මෙරටට ආනයනය කරන රසායනික ද්‍රව්‍ය කර්මාන්තයකට භාවිත කිරීමේදී සහ බැහැර කිරීමේදී පිළිපැදිය යුතු ක්‍රමවේද සඳහාත් භාවිත කර ඇති, භාවිත කළ හැකි, භාවිත කළ නොහැකි රසායනික ද්‍රව්‍ය සඳහාත් නියාමනයක් ඇති කිරීමට මෙන් ම ඒ සඳහා වන බලපත්‍ර ක්‍රමවේදයක් සැකසීමටත් මෙයින් මධ්‍යම පරිසර අධිකාරියට අවකාශය ලැබෙන බවයි මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කපිල මහේෂ් රාජපක්ෂ සඳහන් කළේ.

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති මහාචාර්ය තිලක් හේවාවසම් පවසන්නේ කර්මාන්තශාලාවල ක්‍රියාකාරිත්වය නිසා සිදු වන පරිසර, ජල, පස, වායු දූෂණය නියාමනය සඳහා EPL (Environmental Protection License) බලපත්‍රයක් ලබා දෙන බව. ශ්‍රී ලංකාවේ කර්මාන්තශාලා 50000කට පමණ මෙවැනි බලපත්‍ර ලබා දී තිබෙනවා. මේ සංඛ්‍යාව ඉදිරියේදී තවත් වැඩි වනු ඇති. පරිසරය ආරක්ෂා කිරීමට අවශ්‍යනම් මෙරට ක්‍රියාත්මක වන සියලු ම කර්මාන්ත ශාලාවලින් සිදුවන පරිසර දූෂණය නියාමනය කළ යුතුයි. අදහස් දක්වන සභාපති මහාචාර්ය තිලක් හේවාවසම්; "ඇතැම් කර්මාන්ත ශාලා තිබෙනවා පාරිසරික නිර්දේශ නොමැති ව ස්ථාපිත කළ. මධ්‍යම පරිසර අධිකාරිය ලෙස පරිසරය ආරක්ෂා කර ගැනීමට පනතින් බලතල නැතත් පාරිසරික නිර්දේශ ලබා දෙනවා. පනත සංශෝධනයෙන් පසුව මේ පාරිසරික නිර්දේශ ලබා ගැනීම අනිවාර්යයි. කාර්මික අනතුරක් තිබෙන කර්මාන්ත ශාලා තිබේනම් අපට දැනට ඇති ප්‍රතිපාදන සමඟ ප්‍රතිපාදන නැහැ එම බලපත්‍ර අවලංගු කිරීමට."

කර්මාන්ත ශාලාවලින් පිරිපහදු කිරීමෙන් පසුව මුදා හරින ජලය සම්බන්ධයෙන් වූ සම්මත, ගැසට් කර තිබෙනවා. BOD පරීක්ෂණයක (Biological Oxygen Demand) අනුව ජල ලීටරයක රසායනික ද්‍රව්‍ය 30mgක පමණ සාන්ද්‍රණයක් පමණයි තිබිය යුත්තේ. COD පරීක්ෂණයක (Chemical Oxygen Demand) ජල ලීටරයක රසායනික ද්‍රව්‍ය 250mg සාන්ද්‍රණයක් සහිත ජලය පමණයි කර්මාන්ත ශාලාවලින් ඉවත දැමීමට හැකියාව ඇත්තේ. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන මහාචාර්ය තිලක් හේවාවසම්;"මෙහි ගැටලුවක් තිබෙනවා. එහි සාන්ද්‍රණය පමණක් පිරික්සීම ප්‍රමාණවත් නැහැ. එක් එක් කර්මාන්ත ශාලා ජලයට මුදා හරින දූෂක ප්‍රමාණ වෙනස්. එය පාලනය කළ යුතුයි. ඒ සඳහා නව නීති මේ නව සංශෝධනයෙන් ලැබෙනවා. විශාල දූෂක ප්‍රමාණයක් එක් කළහොත් ඒ සඳහා යම්කිසි ගෙවීමක් කළ යුතුයි. එයින් අදහස් කරන්නේ පරිසරයට මුදා හරින දූෂක ප්‍රමාණය අවම කර ගැනීම. ඒ සඳහා දූෂකයා විසින් දූෂක සඳහා යන පිරිවැය දරා ගැනීම (Polluter Pay Principal) වැනි ක්‍රම වෙනත් රටවල ක්‍රියාත්මක වෙනවා. ඉදිරියේදී පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාදීමේදී නෛතික ප්‍රතිපාදන සහිත ව මේ ක්‍රියාවලිය සිදුකිරීමයි බලාපොරොත්තුව".

යම් ආයතනයක් තමන්ගේ ප්‍රතිපත්තියක්, උපායමාර්ගයක්, සැලැස්මක්, වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී අනිවාර්යයෙන් උපායමාර්ගික පරිසර ඇගයීමක් කළ යුතුයි. මෙහිදී ව්‍යාපෘති යෝජකයාට ඉතා පහසුවෙන් පාරිසරික බලයක් ලැබෙනවා බලපෑම් ඇගයීම් අධ්‍යයනය කරන්නට. මේ සඳහා ප්‍රතිපාදන ජාතික පාරිසරික පනතේ සංශෝධනවලට ඇතුළත්. පාරිසරික කලාපවල පාරිසරික හානියක් වන ලෙස සැකසුණු අනවසර ඉදිකිරීම් බහුල ව දැකිය හැකියි. මේ පිළිබඳ තාක්ෂණික අධ්‍යයනයක් සිදු කිරීමෙන් පසු නව සංශෝධන අනුව මධ්‍යම පරිසර අධිකාරියට හැකියාව තිබෙනවා අදාළ උසාවි නියෝග මත ඒවා කඩා දැමීමටත් අදාළ නියෝග නිකුත් කිරීමටත්.

(රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවති මාධ්‍ය සාකච්ඡාවක් ඇසුරෙන්)





# ග්‍රීන්ලන්තයට දැල්වුණු රතු එළිය

නිහාල් පීරිස්



එක් රටක් තවත් රටක් මිල දී ගන්නට යාම සාමාන්‍යයෙන් අසන්නට නොලැබෙන ආකාරයේ දුලබ සිදුවීමක්. එහෙත් ඉතිහාසයේ කිහිපවරක් ම ඇමරිකාව ආක්ටික් කලාපයේ පිහිටි රටක් වන ග්‍රීන්ලන්තය මිල දී ගන්නට සූදානම් වුණා. ග්‍රීන්ලන්තය මේ වන විට අයත් වන්නේ ඩෙන්මාර්කයට. එය ඩෙන්මාර්කයට අයත් අර්ධ ස්වයංපාලිත කලාපයක්.

ග්‍රීන්ලන්තය මිල දී ගැනීම පිළිබඳ අදහසක් මෑතකදී ම ඉදිරිපත් වුණේ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ පළමු ධුර කාලය තුළ 2019 වසරේ. එහෙත් ඩෙන්මාර්ක නායකයන්ගේත් ග්‍රීන්ලන්ත නායකයන්ගේත් දැඩි විරුද්ධත්වය නිසා එය යටපත් වුණා. ඩෙන්මාර්ක අගමැතිනි මෙට ෆ්‍රෙඩෙරික්සන් එම අවස්ථාවේ පැවසුවේ ග්‍රීන්ලන්තය යනු කිසිසේත් අලෙවිය සඳහා ඇති භූමියක් නොවන බව.

ග්‍රීන්ලන්තය ඇමරිකාවට ඈඳා ගැනීමේ අදහස අත්හැරීමට ට්‍රම්ප් සූදානම් බවක් පෙනෙන්නේ නැහැ. මෙවර ඔහු ග්‍රීන්ලන්තය මිල දී ගැනීමක් පිළිබඳ අදහසක් ඉදිරිපත් කර නැතත් එරට ඇමරිකාවට ඈඳා ගැනීම සඳහා ගත හැකි වෙනත් ක්‍රියාමාර්ග ගැන කල්පනා කරමින් සිටින ආකාරයක් දැකගන්නට ලැබෙනවා.

මෙයට අදාළ විශේෂ සිදුවීමක් 2024 දෙසැම්බර් මාසයේත් සිදු වුණා. එනම් ට්‍රම්ප් ග්‍රීන්ලන්තය සඳහා විශේෂ නියෝජිතයකු පත් කිරීම. බොහෝ පාර්ශ්ව මෙය සලකන්නේ ග්‍රීන්ලන්තය ඇමරිකාවට ඈඳා ගැනීමේ සැලැස්ම හා බැඳුණු කැපී පෙනෙන සිදුවීමක් හැටියට.

ග්‍රීන්ලන්තය සම්බන්ධයෙන් ට්‍රම්ප් මෙතරම් උනන්දුවක් දක්වන්නේ මන්ද යන්න තේරුම් ගැනීම වැදගත්. ග්‍රීන්ලන්තය පිහිටා ඇති ආක්ටික් කලාපය පිළිබඳ ව මේ කාලයේ බොහෝ බලවතුන්ගේ අවධානය යොමුවෙමින් ඇති ආකාරයක් පෙනෙන්නට තිබෙනවා.

ගෝලීය උණුසුම ඉහළ යාම වැනි තත්ත්ව නිසා ධ්‍රැව ආසන්නයේ ඇති අයිස් තට්ටු දියවීම වේගවත් වී ඇති බව ප්‍රසිද්ධ කාරණයක්. එබැවින් මේ කලාපය ඔස්සේ අලුත් නැව් මාර්ග විවෘත වීමට පටන්ගෙන තිබෙනවා. මේ කලාපයේ සැඟවී ඇති ස්වාභාවික සම්පත් ද පෙරට වඩා පහසුවෙන් උකහා ගැනීමේ ඉඩකඩත් විවර වෙමින් තිබෙනවා.

ආක්ටික් කලාපය යනු ස්වාභාවික සම්පත් ඉතා බහුල ව පවතින්නේ යැයි විශ්වාස කෙරෙන කලාපයක්. ලෝකයේ තව ම මතු කර නොගත් ඛණිජ තෙල්වලින් සියයට 13ක් පමණ ද ස්වාභාවික ගෑස්වලින් සියයට 30ක් පමණ ද ආක්ටික් කලාපයේ සැඟවී ඇතැයි විශ්වාස කෙරෙනවා. රන්, තඹ, නිකල්, සින්ක් වැනි ලෝහ වර්ග ද විශාල වශයෙන් මේ කලාපයේ පවතින බවයි සඳහන් වන්නේ.

මෙවැනි පසුබිමක චීනය, රුසියාව වැනි ඇමරිකාවේ තරගකාර පාර්ශ්වවල අවධානය ද ආක්ටික් කලාපය වෙත වැඩි වැඩියෙන් යොමුවෙමින් ඇති ආකාරය දැකගත හැකියි. මේ කලාපයේ සිය බලය වැඩි කර ගැනීමට ඔවුනුත් පියවර ගනිමින් සිටිනවා. සෝවියට් යුගයේ මේ ආසන්නයේ තිබූ ඇතැම් හමුදා කඳවුරු ආදිය නවීකරණය කර නැවත විවෘත කිරීමට පවා රුසියාව ක්‍රියා කරමින් සිටින බව සඳහන්. මේ නිසා බටහිර බලවතුන්ට අලුත් ආරක්ෂක තර්ජනයක් ද මතුවෙමින් තිබෙනවා. චීනය ද මේ කලාපයේ කරන ආයෝජන මෑතකාලයේ විශාල වශයෙන් ඉහළ දමා ඇති බවයි වාර්තා වන්නේ. මේ සියල්ලෙන් පෙනෙන්නේ ආක්ටික් කලාපය ආර්ථික, වෙළෙඳ, ආරක්ෂක ආදී බොහෝ පැතිවලින් පෙරට වඩා වැදගත් භූගෝලීය කලාපයක් බවට පත් වෙමින් ඇති බව. ආක්ටික් කලාපයේ පිහිටා ඇති ග්‍රීන්ලන්තය ඇමරිකාවේ කොටසක් බවට පත්කර ගැනීමට ඩොනල්ඩ් ට්‍රම්ප් සූදානම් වන්නේ මෙවැනි පසුබිමක. ග්‍රීන්ලන්තය ඈඳා ගතහොත් මේ කලාපයේ විශාල බලයක් අත්කර ගැනීමට ඇමරිකාවට හැකි වනු ඇති බව අමුතුවෙන් කිව යුතු නැහැ.

දෙසැම්බර් 22 දින ග්‍රීන්ලන්තය වෙනුවෙන් විශේෂ නියෝජිතයෙකු ලෙස ලුයීසියානා ප්‍රාන්තයේ ආණ්ඩුකාරවරයා වශයෙන් ද ක්‍රියා කරන ජෙෆ් ලැන්ඩ්‍රි පත් කිරීමට ට්‍රම්ප් පියවර ගන්නේ මෙවැනි තත්ත්වයක. ඇමරිකාවේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා ග්‍රීන්ලන්තය ඇමරිකාවට අවශ්‍ය වන බවත් ඒ නිසා එය ලබා ගත යුතු ව ඇති බවත් පවසන ට්‍රම්ප් සඳහන් කර ඇත්තේ ජෙෆ් ලැන්ඩ්‍රි මේ කාර්යයේදී පෙරමුණ ගෙන ක්‍රියා කරනු ඇති බව. ග්‍රීන්ලන්තය ඇමරිකාවේ කොටසක් බවට පත් කර ගැනීමේ කාර්යයේදී මෙවැනි තනතුරක ක්‍රියා කරන්නට ලැබීම ගෞරවයක් ලෙස සලකන බව ලැන්ඩ්‍රි ද සමාජ මාධ්‍ය පෝස්ටුවක සඳහන් කර තිබුණා.

ඇමරිකානු ජනාධිපතිවරයා ගත් මේ පියවර හේතු වුණේ ඇමරිකාව සහ ඩෙන්මාර්කය අතර අලුත් ආතතියක් ඇති කිරීමට. ඩෙන්මාර්කයේ සිටින ඇමරිකානු තානාපතිවරයා වන කෙන් හොවරි විදේශ අමාත්‍යාංශය වෙත කැඳවා මේ ගැන විමසීමටත් ඩෙන්මාර්කය පියවර ගත්තා. ග්‍රීන්ලන්ත අගමැති ජෙන්ස් ෆ්‍රෙඩෙරික් නීල්සන් ද ට්‍රම්ප් ගත් පියවරට අදාළ ව ප්‍රකාශයක් කර තිබුණා. ග්‍රීන්ලන්තයේ භෞමික අඛණ්ඩතාවට ගරු කළ යුතු බවත් එහි අනාගතය ගැන තීරණය කළ යුත්තේ එහි ජනතාව බවත් ඔහු කියා සිටියා.

**ගෝලීය උණුසුම ඉහළ යාම වැනි තත්ත්ව නිසා ධ්‍රැව ආසන්නයේ ඇති අයිස් තට්ටු දියවීම වේගවත් වී ඇති බව ප්‍රසිද්ධ කාරණයක්. එබැවින් මේ කලාපය ඔස්සේ අලුත් නැව් මාර්ග විවෘත වීමට පටන්ගෙන තිබෙනවා. මේ කලාපයේ සැඟවී ඇති ස්වාභාවික සම්පත් ද පෙරට වඩා පහසුවෙන් උකහා ගැනීමේ ඉඩකඩත් විවර වෙමින් තිබෙනවා.**

වර්ග කි. මී. මිලියන 2ක පමණ භූමි ප්‍රමාණයකින් යුතු ග්‍රීන්ලන්තය සැලකෙන්නේ ලෝකයේ විශාලතම දූපත හැටියට. එහෙත් එහි වැඩි ප්‍රදේශයක් හිමෙන් වැසී ඇති අතර එම ප්‍රදේශ ජනශූන්‍ය තත්ත්වයකයි පවතින්නේ. ජනගහනය 57,000ක් පමණ සිටින ග්‍රීන්ලන්තයේ රට මැද ප්‍රදේශ හිමෙන් වැසී ඇති නිසා මේ අයගෙන් විශාල ප්‍රතිශතයක් වෙරළාසන්න ප්‍රදේශවල ජීවත් වනවා.

ග්‍රීන්ලන්තය ඇමරිකාවේ කොටසක් බවට පත් වෙනවාට ග්‍රීන්ලන්ත ජනතාවගෙන් බහුතරයක් ද කැමැත්තක් දක්වන්නේ නැහැ. 2024 ජනවාරි මාසයේ කරන ලද ජනමත සමීක්ෂණයකින් හෙළිදරව් වී තිබුණේ ග්‍රීන්ලන්ත වැසියන්ගෙන් සියයට 85ක් පමණ එරට ඇමරිකාවේ කොටසක් වෙනවාට අකැමැති බව. ඊට කැමැත්තක් දක්වා තිබුණේ සියයට 6ක් වැනි ඉතා සුළු පිරිසක්. සියයට 9කට ඒ ගැන නිශ්චිත අදහසක් නැහැ.





ඩොනල්ඩ් ට්‍රම්ප්



# නොනිවෙන ගිනි පුපුරු

සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි

දිගු කාලයක් අළු යට ගිනි පුපුරු සේ සැඟ ව පැවැති කාම්බෝජය සහ තායිලන්තය අතර භූමිය සම්බන්ධ ආරවුල 2025 ජූලි 24 දින කාම්බෝජ-තායිලන්ත දේශ සීමාව ඔස්සේ ඇවිළ ගිය සෘජු සන්නද්ධ ගැටුමක් දක්වා වර්ධනය වුණා. පසුව ජූලි 28 දින දෙරට ම කොන්දේසි විරහිත සටන් විරාමයකට එකඟ වුවත් දෙසැම්බර් මාසයේදී සතුරුකම් නැවත ආරම්භ වුණා. එම කාල සීමාවේ තායි හමුදා දේශසීමාව අසල ප්‍රදේශවල නගර සහ උපායමාර්ගික වශයෙන් වැදගත් කඳුකර ප්‍රදේශ කිහිපයක් ද අත්පත් කර ගත්තා.

තායිලන්තය සහ කාම්බෝජය අතර ආරවුල සියවසකට වඩා පැරණි වූවක්. එම දේශ සීමා ආරවුල ආරම්භ වන්නේ 1904 සහ 1907 ගිවිසුම් යටතේ ස්ථාපිත කරන ලද මායිම් සීමා නිර්ණවල අපැහැදිලිතා හේතුවෙන්. එම ගිවිසුම්වලින් සියම් රාජධානිය (නූතන තායිලන්තය) සහ කාම්බෝජය ඇතුළත් ප්‍රංශ, ඉන්දු, චීනයට අයත් මායිම නිර්වචනය කිරීමට උත්සාහ කෙරුණත් ප්‍රංශ යටත්විජිත බලධාරින් ඉදිරිපත් කළ මේ ගිවිසුම් සිතියම් සහ සමීක්ෂණ ලේඛන බොහෝ විට නිරවද්‍ය වුණේ නැහැ. උස්බිම් ප්‍රදේශ කිහිපයක් සහ උපායමාර්ගික ගමන් මාර්ග එකිනෙක අතර ඡේදනය වීම හේතුවෙන් ගැටලු ඇතිකර තිබුණා.

1953 වසරේදී කාම්බෝජය ප්‍රංශයෙන් නිදහස ලැබීමෙන් පසු, Preah Vihear පුදබිම් සංකීර්ණයේ ස්වෛරීභාවය ආරවුලේ කේන්ද්‍රස්ථානයක් බවටයි පත් ව තිබුණේ. ඓතිහාසික සිතියම් සහ ප්‍රංශ සමීක්ෂණ ලියකියවිලි උපුටා දක්වමින්, 1962 වසරේදී ජාත්‍යන්තර යුක්තිය සඳහා වූ අධිකරණය (ICJ) කාම්බෝජයට එම පුදබිම් සංකීර්ණය ප්‍රදානය කරමින් තීන්දුවක් නිකුත් කර තිබුණා. අධිකරණය එය අවට භූමිය පැහැදිලි ව නිර්වචනය නොකළ අතර යාබද උස්බිම්, කඳු බෑවුම් සහ දේවාලයට ප්‍රවේශ නීතිමය සහ මිලිටරි අවිනිශ්චිතතාවක් ඇතිකරන්නට හේතුවක් වුණා.

20 වැනි සියවසේ අගභාගය වන තෙක් මේ ආරවුල බොහෝදුරට නිද්‍රාශීලී ව පැවතුණා. එහෙත් 2008 වසරේ සිට 2011 වසර දක්වා කාලතුවක්කු හුවමාරු, මුර සංචාර ගැටුම් සහ සීමිත ආක්‍රමණ ඇතුළු ව නැවත හමුදා ගැටුම් ඇති වූ අතර එහි ප්‍රතිඵලය වුණේ දෙපාර්ශ්වයේ ම බහු මරණ සහ තුවාල. නැවත නැවත ගැටුම් ඇති වුවත් ICJ 1962 වසරේදී ලබා දුන් තීන්දුව නැවත තහවුරු කරමින්, පුදබිම් සංකීර්ණය කෙරෙහි කාම්බෝජයේ ස්වෛරීභාවය තහවුරු කළා. කෙසේ වෙතත් මෙහි භෞමික සීමාවල අපැහැදිලි බව සහ අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ දේශ සීමා නිර්ණය කිරීමක් නොමැති වීම ආතති අවුළුවාලීමට දිගට ම හේතු වූ අතර එම කලාපය පත් ව තිබුණේ දෙරට අතර මිලිටරි හා රාජ්‍ය තාන්ත්‍රික අර්බුද නැවත නැවත අවුළුවන අළු යට ගිනි පුපුරක් බවට.

කාම්බෝජ කාන්තාවන් පිරිසක් 2024 වසර මුල්භාගයේ මතභේදයට ලක්වූ මේ පූජ්‍ය ස්ථානයේදී දේශ ප්‍රේමී ගීත ගායනා කිරීමෙන් පසු නවතම ආතතිය උත්සන්න වූවා. මැයි මාසයේ ගැටුමකින් කාම්බෝජ සොල්දාදුවෙකු මිය ගියා. මෙය දශකයකට වැඩි කාලයක් රටවල් අතර සංහිඳියාවෙන් තිබූ සබඳතා අවම මට්ටමකට ඇද දැමුවා. දේශ සීමාව දිගේ දින පහක් දැඩි සටන් පැවති අතර එයින් මරණයට පත් වූ සොල්දාදුවන් සහ සිවිල් වැසියන් පිරිස දුසිම් ගණනක්. තවත් සිවිල් වැසියන් දහස් ගණනක් අවතැන් වුණා.

මෑතකාලීන අවුල හටගත්තේ ජූලි 23 දින ‘උබොන් රට්චතානි’ පළාතේ ‘නම්යුවෙන්’ දිස්ත්‍රික්කයේ පුද්ගල නාශක බිම් බෝම්බයකට පා තැබීමෙන් තායි සොල්දාදුවෙකු බරපතළ ලෙස තුවාල ලැබූ විටදී. මේ සිදුවීම පුළුල් සතුරුකම් සඳහා ක්ෂණික ප්‍රේරකයක් ලෙස ක්‍රියා කළා. පසු දින දේශ සීමාවේ විවිධ අංශ ඔස්සේ සෘජු සන්නද්ධ ගැටුම් පැතිර ගියා. තායි නේවාසික අසල්වැසි ප්‍රදේශ, රෝහලක් සහ ඉන්ධන පිරවුම්හලකට පහර දුන් කාම්බෝජයේ බහු රොකට් ප්‍රහාරක 2025 ජූලි 24 දින මහා පරිමාණ සටන් ඇවිළ වීම සඳහා හේතු වූ බව තායි මාධ්‍ය පුළුල් ලෙස වාර්තා කළා. ගැටුමේදී දෙපාර්ශ්වය



ම තම ක්‍රියාමාර්ග ආත්මාරක්ෂාව සඳහා ගත් බව ප්‍රකාශ කළ අතර ගැටුම ආරම්භ කළ බවට හැම විට ම අනෙකාට චෝදනා කරන්නට යෙදුණා. ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස ඊසාන දිග තායිලන්තයේ සහ උතුරු කාම්බෝජයේ සිවිල් වැසියන් 200,000කට වැඩි පිරිසක් අවතැන් වී තිබුණා.

ඊට ප්‍රතිචාර වශයෙන් රාජකීය තායි ගුවන් හමුදාව (RTAF) දේශ සීමාවේ කාම්බෝජ හමුදා රඳවනවලට එරෙහි ව ගුවන් ප්‍රහාර එල්ල කිරීම සඳහා එෆ් 16 ප්‍රහාරක ගුවන් යානා යෙදවූවා. ඉන් කාම්බෝජ ප්‍රාථමික පාසලකට සහ බෞද්ධ විහාරයක චෛත්‍යයකට පහර එල්ල වුණා. තායි-ලාඕසියානු දේශසීමා යුද්ධයෙන් පසු ගුවන් හමුදාව සටන් මෙහෙයුම්වල නිරත වූ පළමු අවස්ථාව මෙයින් සනිටුහන් වුණා.

**මෑතකාලීන අවුල හටගත්තේ ජුලි 23 දින 'උබොන් රට්චතානි' පළාතේ 'නම්යුවෙන්' දිස්ත්‍රික්කයේ පුද්ගල නාශක බිම් බෝම්බයකට පා තැබීමෙන් තායි සොල්දාදුවෙකු බරපතළ ලෙස තුවාල ලැබූ විටදී, මේ සිදුවීම පුළුල් සතුරුකම් සඳහා ක්ෂණික ප්‍රේරකයක් ලෙස ක්‍රියා කළා. පසු දින දේශ සීමාවේ විවිධ අංශ ඔස්සේ සෘජු සන්නද්ධ ගැටුම් පැතිර ගියා.**




මේ සටන් උත්සන්න වීම කලාපයේ සහ ජාත්‍යන්තරයේ කනස්සල්ලක් ඇති කළ අතර ඒසියාන් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් සාමය සහ සමථවීමක් සඳහා ඉල්ලීම් ඉදිරිපත් වුණා. එක්සත් ජනපදය සහ මැලේසියාව ද සටන් පිළිබඳ කනස්සල්ල පළ කළ අතර රාජ්‍ය තාන්ත්‍රික ක්‍රමවලින් ආතතිය උත්සන්න වීම සමනය කරන ලෙස දෙපාර්ශ්වයෙන් ම ඉල්ලා සිටියා. බාහිර රාජ්‍ය තාන්ත්‍රික පීඩනය යටතේ ආතතිය ක්‍රමයෙන් ලිහිල් වුවත් 2025 ජූලි මාසයේ ගුවන් ප්‍රහාර සහ භූමි ප්‍රහාර Preah Vihear දේවාලය නඩුවෙන් පසු හටගත් කාම්බෝජ-තායිලන්ත දේශ සීමා ආරවුලේ වඩාත් තීව්‍ර ම අවස්ථාවක්. එය අග්නිදිග ආසියාවේ ප්‍රධාන භූමියේ ස්ථාවරත්වය සහ ආරක්ෂාව සඳහා සැලකිය යුතු බලපෑමක් ඇතිකිරීමට ද සමත් වුණා. සටන් සහ ප්‍රහාර කෙමෙන් අඩුවී ගිය ද සමථයකට පත්වීම පූර්ණ වශයෙන් සිදු වී තිබුණේ නැහැ.

ඒ බව සනාථ වන්නේ 2025 දෙසැම්බර් 7 දින කාම්බෝජ සහ තායි හමුදා විනාඩි 30ක කෙටි දේශ සීමා ගැටුමක නිරත වූ විට සටන් නැවත ආරම්භ වීම හේතුවෙන්. පසු දින කාම්බෝජයේ බහුවිධ ස්ථානවලට එරෙහි ව තායිලන්තය අලුත් භූමි මෙහෙයුම් සහ ගුවන් මෙහෙයුම් සිදු කළා. Preah Vihear දේවාලය ආරක්ෂා කරන කාම්බෝජ සොල්දාදුවන්ට එරෙහි ව එල්ල කළ ගුවන් ප්‍රහාර ඒ පුරාණ ඓතිහාසික බලකොටුව විනාශ කළා.

දෙසැම්බර් 10 දින රාජකීය තායි හමුදාව දියත් කළේ 'සත්තාවත් මෙහෙයුම'. එහෙත් එම කාල සීමාවේ උතුරු කාම්බෝජයේ ප්‍රදේශ ගණනාවක් අත්පත් කර ගැනීමට එය අසමත් වුණා. අලුත් වූ ගැටුම් මධ්‍යයේ ඇමරිකා එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් කාම්බෝජය සහ තායිලන්තය යන දෙපිරිසෙන් ම ක්වාලාලම්පූර් සාම ගිවිසුමට ගරු කරන ලෙස සහ එයට අනුකූල වන ලෙස ඉල්ලා සිටියා.

මෙයට පෙර ජූලි මාසයේදී ද බිඳෙනසුලු සටන් විරාම ගිවිසුමකට දෙරට ම එකඟ වූවා. එය ඔක්තෝබර් මාසයේදී අත්සන් කළා. පසුව දෙසැම්බර් මස මුලදී එය බිඳ වැටුණු අතර ඇති වුණේ නව ගැටුම්. නව සටන් විරාමයක් සඳහා බලපෑම් එල්ල වන්නට වුයේ එතැන් සිට.

ඒ අනුව දැඩි සටන් මැද චීන සහ ඇමරිකා මැදිහත්වීම් අතර පැවැති රාජ්‍ය තාන්ත්‍රික කතාබහකින් දෙසැම්බර් 27 සෙනසුරාද දේශීය වේලාවෙන් දහවල් සිට නව සටන් විරාමයක් ක්‍රියාත්මක වීම ඇරඹුණා. ඔවුන් දැනට සිටින ඉදිරි පෙළ නැවැතී සිටීමට, හමුදා තර කිරීම් තහනම් කිරීමට සහ දේශ සීමා ප්‍රදේශවල ජීවත් වන සිවිල් වැසියන්ට හැකි ඉක්මනින් නැවත පැමිණීමට ඉඩ දීමට දෙපාර්ශ්වය ම එකඟ වී තිබුණා. චීනය සහ ඇමරිකා එක්සත් ජනපදය රාජ්‍ය තාන්ත්‍රික දිරිගැන්වීමත් සමඟ දෙරට අතර දින ගණනක් පැවති සාකච්ඡාවලින් පසුව සිදු වූ ඉදිරි ගමනක් ලෙස එය සැලකුණා.

චීනයේ විදේශ අමාත්‍ය වැන්ග් යී 'දැඩි උත්සාහයකින් දිනාගත්' සටන් විරාමයක් යැයි ඒ ගැන ප්‍රශංසා කළ අතර එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් 'වේගවත් හා සාධාරණ නිගමනයක්' ලෙස ප්‍රශංසා කරන්නටත් යෙදුණා. එහෙත් ඉන් පැය කිහිපයකට පසු තත්ත්වය මුළුමනින් ම උඩුයටිකුරු වී ගියා. ඒ, සති ගණනාවක් තිස්සේ පැවති මාරාන්තික ගැටුම්වලින් මිලියනයකට ආසන්න ජනතාවකට තම නිවෙස්වලින් පලා යාමට සිදුවීමෙන් පසු, කාම්බෝජය අලුතින් අත්සන් කරන ලද සටන් විරාම ගිවිසුම කඩ කළ බවට තායිලන්ත හමුදාව චෝදනා කිරීමත් සමඟ සහ ඉරිදා රාත්‍රියේ කාම්බෝජ පැත්තෙන් පියාසර කළ මිනිසුන් රහිත ගුවන් යානා හෙවත් ඩ්‍රෝන යානා 250කට වැඩි ගණනක් දක්නට ලැබුණු බව කියමින්. දැන් අළු යට ගිනි නැවත පුපුරු ගසමින් තිබෙනවා.

# ලෝක සැරිසර

**චන්දන මාරසිංහ**



## ඉන්දියා-රුසියා ආර්ථික සහයෝගිතාව

රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් දින 02ක සංචාරයක් සඳහා ඉන්දියාවට පැමිණියේ දෙසැම්බර් 04 දින දෙරට අතර පැවැත්වෙන වාර්ෂික සමුළුවට සහභාගි වීමට. සමුළුව පැවැත්වීමට පෙර රුසියානු ජනාධිපතිවරයා ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි සමඟ සාකච්ඡා පවත්වා තිබෙනවා. රුසියාවෙන් තෙල් මිල දී ගැනීම නතර කරන ලෙසට ඇමරිකාව ඉන්දියාවට බලපෑම් කරන අවස්ථාවක මේ සංචාරය යෙදීම ද විශේෂත්වයක්. ඒ අනුව දේශපාලනික තත්ත්ව හමුවේ මේ හමුවීම දෙරටට ම වැදගත් වන අතර ඉන්දියාව සමඟ සම්බන්ධතා පැවැත්වීම රුසියාවට මේ මොහොතේ අතිශයින් වැදගත්. ලොව වේගයෙන් ම සංවර්ධනය වන ආර්ථිකයක් ඉන්දියාව සතු වන අතර රුසියාවේ තෙල් ඇතුළු භාණ්ඩ සඳහා දැවැන්ත වෙළෙඳපොළක්. එසේ වන්නේ ලොව තුන් වැනි විශාලතම බොර තෙල් පාරිභෝගිකයා ලෙස ඉන්දියාව සැලකෙන බැවින්. රුසියාවෙන් තෙල් මිල දී ගැනීම හේතුවෙන් ඇමරිකාව ඉන්දියාවට අමතර සියයට 25ක තීරු බදු පනවා තිබෙනවා. ආයුධ මිල දී ගැනීම, ශ්‍රමය යොදා ගැනීම සහ ජාත්‍යන්තර හිතවතෙකු වීම රුසියාව හා ඉන්දියාව අතර සම්බන්ධතා වැඩිවීමට හේතුවක්. ඒ අනුව මේ සංචාරය අතරතුර රටවල් දෙක අතර වෙළෙඳ සහ ආර්ථික කටයුතු වෙනුවෙන් ගිවිසුම්ගත වීම ද සිදුවුණා. 2030 වසර දක්වා ඉන්දියා රුසියා ආර්ථික සහයෝගිතාවේ උපායමාර්ග සඳහා වූ වැඩසටහන සම්මත කරගෙන තිබෙන අතර ඩොලර් බිලියන 100ක වෙළෙඳ ඉලක්කයක් සම්පූර්ණ කිරීමයි වැඩපිළිවෙළේ අරමුණ.



## දිවි සැරියක නිමාව

මුළු ඡන්ද දායකයන් සංඛ්‍යාව මිලියන 127.6 ඉක්මවන බංගලි දේශයේ මහ මැතිවරණය 2026 පෙබරවාරි 12 දින පැවැත්වීමට නියමිත ව තිබෙනවා. එරට ජාතිකවාදී පක්ෂයේ වැඩබලන සභාපතිවරයා වූ Tarique Rahman වසර 17කට පසුව මේ මැතිවරණයට තරග කිරීමට පැමිණ තිබෙනවා. මුදල් විශුද්ධිකරණ ඇතුළු අපරාධ චෝදනා එල්ල වූ ඔහු 2008 වසරේදී බංගලි දේශයෙන් පලා ගොස් ලන්ඩනයේ ජීවත්වීමට පටන් ගත්තා. බංගලි දේශය ඇති වූ දේශපාලන පෙරළිය හේතුවෙනුයි පෙබරවාරි මස පැවැත්වෙන මහ මැතිවරණයට ඉදිරිපත් වීමට ඔහු යළි පැමිණියේ. ඒ, එල්ල වූ චෝදනා ඉවත් කිරීමෙන් අනතුරු ව. බංගලි දේශයට පැමිණ දින කිහිපයකට පසුව ඔහුගේ මව වන බංගලි දේශයේ පළමු අගමැතිවරිය වූ Begum Khaleda Zia මිය ගියා. ඒ වන විට ඇගේ වයස අවුරුදු 80ක්. බංගලි දේශ ජනාධිපතිවරයා ව සිටි සිය සැමියා වූ Ziaur Rahman ඝාතනයට ලක් වීමෙන් පසු 1991 වසරේදී එරට පළමු අගමැතිනිය ලෙසයි ඇය පත්වුණේ. ඇගේ පළමු ධුර කාලයේ කාන්තා අධ්‍යාපනය හා සමාජ සංවර්ධනය වැඩිදියුණු කිරීමට ඇය ක්‍රියා කළා. 1996 වසරේදී ආරම්භ වූ දෙවැනි ධුර කාලය සති කිහිපයකට සීමා වූ අතර 2001 වසරේදී යළිත් අගමැති ලෙස ඇය පත් වනවා. 2006 ඔක්තෝබර් මැතිවරණයට පෙර ඉල්ලා අස්වීමට ඇයට සිදුවූයේ දූෂණ චෝදනා එල්ල වීම හේතුවෙන්. 2014 වසරේ පැවති මැතිවරණයෙන් පසුව Khaleda Zia දූෂණ චෝදනාවලට ද සිරගත කළා. 2025 ජනවාරි මාසයේදී ඇයට නිදහස හිමි වූ අතර ඇය ප්‍රකාශ කළේ ඉදිරි මැතිවරණ ප්‍රචාරණයේ නිරත වන බව. කෙසේ වෙතත් වකුගඩු හා හෘද රෝග වැලඳීමෙන් ඇයට රෝහල් ගතවීමට සිදුවූ අතර ඒ හේතුවෙනුයි ඇය මිය ගියේ.

> රුසියාවෙන් තෙල් මිල දී ගැනීම හේතුවෙන් ඇමරිකාව ඉන්දියාවට අමතර සියයට 25ක තීරු බදු පනවා තිබෙනවා. ආයුධ මිල දී ගැනීම, ශ්‍රමය යොදා ගැනීම සහ ජාත්‍යන්තර හිතවතෙකු වීම රුසියාව හා ඉන්දියාව අතර සම්බන්ධතා වැඩිවීමට හේතුවක්. ඒ අනුව මේ සංචාරය අතරතුර රටවල් දෙක අතර වෙළෙඳ සහ ආර්ථික කටයුතු වෙනුවෙන් ගිවිසුම් ගතවීම ද සිදුවුණා. 2030 වසර දක්වා ඉන්දියා රුසියා ආර්ථික සහයෝගිතාවේ උපායමාර්ග සඳහා වූ වැඩසටහන සම්මත කරගෙන තිබෙන අතර ඩොලර් බිලියන 100ක වෙළෙඳ ඉලක්කයක් සම්පූර්ණ කිරීමයි වැඩපිළිවෙළේ අරමුණ.



## බෙත්ලෙහෙමේ නත්තල්

2023 වසරේ ගාසා තීරයේ යුද්ධය ආරම්භ වීම හේතුවෙන් නතර වූ බටහිර ඉවුරේ බෙත්ලෙහෙමේ නත්තල් සැමරුම වසර දෙකකට පසුව මෙවර පැවැත්වුණා. ඒ, ඓතිහාසික Nativity පල්ලිය ඉදිරිපිට යෝධ නත්තල් ගස ආලෝකමත් කරමින්. නත්තල් දින වීථි ආලෝකමත් කරමින්, බෙර වාදනය කරමින් කතෝලික බැතිමතුන් රැඳී සිටි අතර පලස්තීන සංගීතය මුසු වූ කැරොල් සංදර්ශනයක් ද

පැවැත්වුණා. පලස්තීන ජාතිකයන් මෙන් ම විදේශිකයන් 1900ක පමණ පිරිසක් රැස් ව සිටි මේ අවස්ථාවට බටහිර ඉවුරේ වෙනත් ප්‍රදේශවල සිටි ජනතාව පැමිණියේ වසර දෙකකට අධික කාලයක සිට පවතින දුක් වේදනා දුරු කර ගැනීමට. බෙත්ලෙහෙම අවට දැඩි ආරක්ෂක විධිවිධාන ද ක්‍රියාත්මක වුණා. සෝදිසි කිරීම් හේතුවෙන් ආරක්ෂක මුරපොළවල පැය ගණනාවක් රැඳී සිටීමට ජනතාවට සිදු වූ බවත් වාර්තා වෙනවා.



## දේශපාලන තහනම

පාකිස්තාන හිටපු අගමැති Imran Khanට දේශපාලනය තහනම් කිරීමේ යෝජනාවක් පංජාබ් සභාව ස්ථිර කළා. පංජාබ් පළාත් සභාව ලෙස ද හැඳින්වෙන පංජාබ් සභාව පංජාබ්හි උත්තරීතර ව්‍යවස්ථාදායක ආයතනය. මෙහි ආසන සංඛ්‍යාව 371ක් වන අතර කාන්තාවන් සඳහා වෙන් කර තිබෙන්නේ ආසන 66ක්. පාකිස්තාන හමුදාවේ අන්තර් සේවා මහජන සම්බන්ධතා අධ්‍යක්ෂ ජනරාල්, ජනරාල් Ahmad Shaudhry දෙසැම්බර් 05 දින පැවැති මාධ්‍ය හමුවකදී Imran Khanට දෝෂාරෝපණය කළේ හමුදා විරෝධී ප්‍රකාශ සිදු කරන බව පවසමින්. ඉන් දින කිහිපයකට පසුව මේ යෝජනාව සම්මත වුණා. සිරකර සිටින Imran Khan මෙන් ම ඔහුගේ පක්ෂය රජයේ සතුරන් බවටයි චෝදනා එල්ල වුණේ. Imran Khanගේ පක්ෂයේ සාමාජිකයන් මේ යෝජනාවට විරෝධය පළ කළත් පාලක පක්ෂය එය සම්මත කරගෙන තිබෙනවා. රටට එරෙහි ව ක්‍රියා කරන දේශපාලන හෝ දේශපාලන නොවන හෝ කණ්ඩායම්වලට එරෙහි ව පියවර ගත යුතු බවත් යෝජනාවේ සඳහන්.



## ගින්දර විශ්මය

මිනිසා ගින්දර භාවිතය ආරම්භ කළ කාලය ගැන නවතම අධ්‍යයනයක් සිදු කර තිබෙනවා. එයට අනුව නියැන්ඩතාල්වරුන් මීට වසර හාර ලක්ෂ පහළොස් දහසකට පෙර ගිනි උඳුන් භාවිත කර ඇති බවට සාධක බ්‍රිතාන්‍යයේ Barnham ප්‍රදේශයේ කැණීම්වලින් හමුවුණා. මීට පෙරදී උතුරු ප්‍රංශයේ ස්ථානයක වසර පනස් දහසකට පෙර ගිනි උඳුන් භාවිත කළ බවට තොරතුරු හමුවුණා. එහෙත් නව සොයා ගැනීමත් සමඟ කලින් ගණනයට වඩා වසර තුන් ලක්ෂ පනස්දහසක් පැරණි ඉතිහාස සාධක හමු වී තිබෙනවා. පහර දුන් විට ගිනි පුපුරු විසි වන ඛනිජ ද්‍රව්‍යයක් වන Iron pyrite කැබලි සහ රත් වූ මැටි ආදිය ඊට අයත්. ගින්නක් ඇති කිරීමේ අරමුණින් එම ප්‍රදේශයට ඛනිජ ද්‍රව්‍ය ගෙන ආ බවටයි එහිදී විශ්වාස කෙරෙන්නේ. ඒ අනුව පැරණි මිනිසා ගින්දර නිපදවා ගත් බවට ලැබුණු පැරණිතම සාධකය මෙය වනවා. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ මහාචාර්ය **Nick Ashton** ප්‍රවෘත්ති සේවයට සඳහන් කළේ මෙය විශ්මයජනක දෙයක් බව.




## වසරේ පුද්ගලයා

ටයිම් සඟරාවේ වසරේ පුද්ගලයා ලෙස 'කෘත්‍රිම බුද්ධියේ නිර්මාණ ශිල්පීන්' නම් කර තිබෙනවා. ඒ අනුව 2025 වසරේ එක් පුද්ගලයකු වෙනුවට කිහිපදෙනෙකු සිටීම විශේෂත්වයක්. ඒ අතර Nvidia ප්‍රධානී Jensen Huang, meta ප්‍රධානී Mark Zuckerberg, X අයිතිකරු Elon musk සහ AI ගෝඩ් මදර් ලෙස හැඳින්වෙන Fei Fei Li වනවා. 2026 වසරේ කෘත්‍රිම බුද්ධිය වගකීමෙන් යුතු ව භාවිත කිරීමේ අවශ්‍යතාව සමාජගත කිරීමත් මෙහි අරමුණක්. 2025 වසරේදී කෘත්‍රිම බුද්ධිය එල්ල කළ බලපෑම හේතුවෙන් මේ තීරණය ගත් බවයි ටයිම්ස් ප්‍රධාන කර්තෘ පවසන්නේ. ඇතැම් විශේෂඥයන් පවසන්නේ කෘත්‍රිම බුද්ධිය මිනිසාගේ ගැලවුම්කරුවකු හෝ අනාගත වසංගතයක් හෝ විය හැකි බව.




## ඔස්ට්‍රියානු නව නීතිය

වයස අවුරුදු 14ට අඩු ගැහැනු ළමයින් සඳහා පාසල්වලදී හිස් ආවරණ පැළඳීම තහනම් කිරීමේ නීතියක් ඔස්ට්‍රියාව සම්මත කළා. එය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සඳහා සිදු කළ බව රජය පවසනවා. මේ තීරණය රජය සහ පෞද්ගලික පාසල්වල ගැහැනු ළමයින්ට අදාළ වන අතර විචාරකයන් පෙන්වා දුන්නේ එමගින් මුස්ලිම් විරෝධී හැඟීම් මතු වන බව. 2020 වසරේදී වයස අවුරුදු 10ට අඩු ගැහැනු ළමයින් වෙනුවෙන් මෙවැනි තීරණයක් රජය ගත් අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය එය අවලංගු කළා. නව නීතියේ සඳහන් වන්නේ ගැහැනු ළමයින් හිජාබ් හෝ බුර්කා වැනි සාම්ප්‍රදායික හිස් වැසුම් තහනම් කර ඇති බව. යම් ශිෂ්‍යාවක් තහනම නොතකා සිටියහොත් පළමු අදියරේදී ඇයගේ නීතිමය භාරකරුවන් සමඟ සාකච්ඡා කළ යුතු අතර අඛණ්ඩ ව එසේ නීති කඩ කළහොත් ළමා හා තරුණ සුභ සාධන ඒජන්සියට දැනුම් දිය යුතුයි. අවසාන විසඳුම ලෙස දක්වා තිබෙන්නේ යුරෝ 800ක් දක්වා පවුල්වලට දඩ නියම කිරීම. මේ තහනම ගැහැනු ළමයින් 12000කට පමණ බලපාන බවයි ඔස්ට්‍රියා රජය පවසන්නේ. එරට පදිංචි ඉස්ලාම්

ප්‍රජාව පෙන්වා දෙන්නේ මෙය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව. නව නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ හා අත්හදා බැලීමේ කාලය 2026 පෙබරවාරි මාසයේදී ආරම්භ වීමටයි නියමිත.

## ඔක්ස්ෆර්ඩ් ගිය වචන




ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය 2025 වසර සඳහා නව වචන 600කට ආසන්න සංඛ්‍යාවක් හඳුන්වා දී තිබෙනවා. නව සංස්කෘති, මාර්ගගත ප්‍රවණතා මෙන් ම එදිනෙදා ප්‍රකාශන සඳහා ගෝලීය ව යොදා ගන්නා වචන ඊට අයත්. අප්‍රිකා කලාපය, අග්නිදිග ආසියා කලාපය මෙන් ම අයර්ලන්තයට අයත් වචන මේ අතර වනවා. එහි එක් වචනයක් වන්නේ Gigil. පිලිපීන පොප් සංස්කෘතියෙන් බිහිවී ඇති එහි තේරුම ලෙස දැක්වෙන්නේ හුරුබුහුටි දෙයකට ඇති අධික කැමැත්ත. මැලේසියාවේ හා සිංගප්පූරුවේ විශ්මය හෝ මෘදු කම්පනයක් යන තේරුම සහිත Alamak යන වචනය ශබ්දකෝෂයට එක් කර තිබෙනවා. දකුණු අප්‍රිකාවට අයත් yoh වචනයෙන් ප්‍රකාශ වන්නේ විශ්මය හෝ අවිශ්වාසය. මන්දගාමී හෝ උදාසීන හෝ අදහස ඇති ludraman අයර්ලන්ත ඉංග්‍රීසි යෙදුමක්. Tumbleweed ලෙස හැඳින්වෙන්නේ නිශ්ශබ්දතාව හෝ ප්‍රතිචාරයක් නොමැති බව දැක්වීමට යොදන වචනයක්. එය ඩිජිටල් යුගයේ මාර්ගගත අදහස් හුවමාරුව සඳහා භාවිත කෙරෙනවා. විවිධ කලාපීය රටවලින් ඉංග්‍රීසි භාෂාව පෝෂණය වන අයුරු මින් පැහැදිලි කරගත හැකියි. එසේ ම කලාපීය යෙදුම් විවිධ දේශ සීමා ඔස්සේ ගමන් කිරීමට ද මින් පහසු වී තිබෙනවා. අදහස් හුවමාරුව සඳහා ඩිජිටල් සන්නිවේදනයෙන් බිහි වන වචන යොදා ගන්නා ආකාරය ද මෙහිදී දැකිය හැකියි.

## සයිබර් ආරක්ෂණ යෙදුම




නව ස්මාර්ට් ෆෝන් සඳහා සයිබර් ආරක්ෂණ යෙදුමක් (App) අන්තර්ගත කිරීමට ඉන්දියාව තීරණය කළා. ඒ අනුව පාරිභෝගිකයන්ට දුරකතනය අලෙවි කිරීමට පෙර එම යෙදුම දුරකතනයට ඇතුළත් කළ යුතුයි. එය නම් කර තිබෙන්නේ Sanchar Saathi App ලෙස. එම යෙදුම යොදා ඇති බවට සහතික කිරීමට දුරකතන සමාගම්වලට දින 90ක කාලයක් ලබා දී තිබෙනවා. දුරකතන සම්පත් අනිසි ලෙස භාවිතය වැළැක්වීමට මේ පියවර ගත් බවයි ඉන්දියාව ප්‍රකාශ කළේ. කෙසේ වෙතත් මේ තීරණය විවේචනය කරන සයිබර් විශේෂඥයන් පවසන්නේ එමගින් පුරවැසියන්ගේ පෞද්ගලිකත්වය උල්ලංඝනය වන බව. අලුතෙන් යොදන මේ මෘදුකාංගය ඉවත් කිරීමට හෝ පාලනය කිරීමට හෝ පරිශීලකයාට හැකියාවක් නැහැ. ඉන්දීය සන්නිවේදන අමාත්‍යවරයා ප්‍රකාශ කරන්නේ පරිශීලකයන්ට මේ යෙදුම භාවිත කිරීමට අවශ්‍ය නැතිනම් එය ඉවත් කිරීමට විකල්පයක් ඇති බව. ඉන්දියාව යනු ජංගම දුරකතන සඳහා දැවැන්ත වෙළෙඳපොළක්. සොරකම් කළ හෝ අසාදු ලේඛනගත කළ උපකරණ අලෙවිය ද එරට දැකගත හැකියි. අපරාධ වැළැක්වීම සඳහා නව යෙදුම ඉවහල් වන බව බලධාරින් ප්‍රකාශ කර තිබෙනවා.

> ටයිම් සඟරාවේ වසරේ පුද්ගලයා ලෙස 'කෘත්‍රිම බුද්ධියේ නිර්මාණ ශිල්පීන්' නම් කර තිබෙනවා. ඒ අනුව 2025 වසරේ එක් පුද්ගලයකු වෙනුවට කිහිපදෙනෙකු සිටීම විශේෂත්වයක්. ඒ අතර Nvidia ප්‍රධානී Jensen Huang, meta ප්‍රධානී Mark Zuckerberg, X අයිතිකරු Elon musk සහ AI ගෝඩ් මදර් ලෙස හැඳින්වෙන Fei Fei Li වනවා. 2026 වසරේ කෘත්‍රිම බුද්ධිය වගකීමෙන් යුතු ව භාවිත කිරීමේ අවශ්‍යතාව සමාජගත කිරීමත් මෙහි අරමුණක්.



මිනිස් සමූහයක ස්වභාවය වන්නේ ව්‍යසනයකින් පසු ප්‍රබල ව නැඟී සිටීම. ව්‍යසනයට මිනිස් ජීවිත ද ජාතික සම්පත් ද බිලිවීම ඛේදවාචකයක්. විපත්තිය අභියස දන නොනැමීමයි මිනිස් ස්වභාවය. එසේ නොවූවානම් මිනිසා කිසිදාක මිහිතලයේ බලවත් ම සත්ත්වයා වන්නේ නැහැ. දශක ගනනාවක් රටක් ඇදගෙන ගිය අන්ධ මාවත ඉතිරි කර තිබෙන්නේ සමාජ, ආර්ථික, ආධ්‍යාත්මික නාය යෑම් පමණයි. මේ සියලු ගරාවැටීම්වලට එරෙහි ව ලාංකික ජාතිය නඟා සිටුවීමේ අභියෝගය වත්මන් පාලනය හමුවේ පවතිනවා. එසේ ම වසරකට ආසන්න ව පැමිණි නව මාවතේ සංවර්ධන සැලසුම් ද ආපදා තත්ත්වය නොසලකා පෙරට ගෙන යා යුතු වෙනවා. මේ සියල්ලෙහි අරමුණ රටක, ජාතියක සංවර්ධනය. සංවර්ධනය යන්නෙහි වපසරිය එක් රටකට සීමා වන්නේ නැහැ. එය සමස්ත මානව වර්ගයාගේ ම ජයග්‍රහණය හා බැඳෙන්නක්. එබැවින් මානව සමාජයේ අනාගතය ඉලක්ක කරමින් සංවර්ධනය යන්න නිවැරැදි ව අර්ථ දැක්වීම වැදගත්. මෙවර දෙසතිය කවරයේ කතාවෙන් සිදු වන්නේ සංවර්ධනය යන්න මානව හිතවාදී දැක්මකින් යළි සලකා බැලීම.

## ධනේශ්වර සංවර්ධනයේ ඒකායන අරමුණ

අප ජීවත් වන්නේ ධනේශ්වර සමාජ ආර්ථික ක්‍රමයක බව අවිවාදිත කරුණක්. මේ සශ්‍රීක මනරම් දූපත සියවසකට වඩා සෘජු යටත්විජිත පාලනයකටත් දශක හතකට වඩා නව යටත්විජිත පාලනයකටත් නතු ව තිබෙන රාජ්‍යයක්. පැවති පාලනය විසින් ජාත්‍යන්තර මූල්‍ය



# සංවර්ධනයේ අභියෝගය

ධනුෂ්ක හර්ෂන වික්‍රමරත්න

අරමුදලට රට දැඩි ව ගැට ගසමින් දැඩි කොන්දේසිවලට එකඟවෙමින් අවසන් පාවාදීම ද කර තිබුණා. එතෙක් දේශීය යටත්විජිත ගැති පාලකයන් ගෙන ආ ආර්ථික උපායමාර්ගය ආනයනය මත යැපෙන්නක්. තේ, පොල්, රබර් වැවිලි ආර්ථිකය ද බිඳ දමා තිබුණා. කර්මාන්ත යන්න ඇඟලුම් කර්මාන්තයට පමණක් කොටු කර තිබුණා. 'ශ්‍රී ලංකා තේ' යන්න පරදවා 'ශ්‍රී ලංකා ගෘහ සේවය' ඩොලර් සොයන මාවත වුණා. සම්භාව්‍ය ප්‍රභූ පංති පාලනයෙන් මිදී 1978 විවෘත ආර්ථිකය සමඟ නිර්මාණය කළේ පාදඩ ප්‍රභූ පංතියක්. සියල්ලෙහි තාර්කික අවසානය රට බංකොලොත් වීම. අවසාන වශයෙන් ශ්‍රී ලංකා නම් දිවයින මත පතිතවූ පසුගාමී ධනවාදයේ ඉරණම එසේ වුණා.

පසුගාමී වේවා, පූර්වගාමී වේවා ධනවාදයේ ඒකායන ඉලක්කය ලාභය නිසා ධනවාදය යනු වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයයි. එහි මිලදී ගැනීම් සහ අලෙවිය යන හෘදය සාක්ෂිය හැර අන් යමක් නැහැ. ධනවාදී සංවර්ධනය යනු මේ වෙළෙඳපොළට පහසුකම් හා ආරක්ෂාව සැලසීම. ධනවාදයට අවශ්‍ය පහසුකම් සැපයීම ද පසුගාමී රටක් ලෙස මේ රාජ්‍යයට අසීරු කාර්යයක් වුණා. පාදඩ ප්‍රභූ දේශපාලනය විසින් ඔඩුදුවන ලද වංචාව, දූෂණය, හොරකම නිසා ලංකාව ධනවාදයට ද බරක් වූ රටක් වුණා. ලංකාවේ ධනවාදය ප්‍රධාන වශයෙන් මුහුණ දුන් ගැටලු දෙකක් තිබෙනවා. ගෝලීය වශයෙන් ධනවාදය මුහුණදෙන එහි කල් ඉකුත් බව හෙවත් යල්පැන ගිය බව විසින් ජනිත අර්බුදයයි පළමු ගැටලුව. දෙවැන්න පසුගාමී පාදඩ ප්‍රභූ අරාජික පාලනයෙන් දේශීය ව පැන නැඟි අර්බුදය. ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ අනාගතය ආරම්භ කළ යුතු වන්නේ මෙතැන් සිට.

> සියලු සංවර්ධන ක්‍රියාවලදී සොබාදහමට අනිසි බාධා නොකළ යුතුයි. මුළුමනින් ම සොබාදහමේ වහලෙකු ද නොවිය යුතුයි. නැතිනම් එතැන බිහි වන්නේ ශිෂ්ටාචාරවත් මිනිසා අහෝසි වී යළි ම්ලේච්ඡයා. ඒ නිසා සංවර්ධනය යනු නගර කොන්ක්‍රීට් වනාන්තර ඉදිකිරීම හෝ යළි ඝන වනාන්තර බිහි කිරීම හෝ නොවෙයි. ඉදිකිරීම්වලින් ද වනාන්තර ව්‍යාප්තියෙන් ද යුක්ත ගම සහ නගරය යැයි ප්‍රතිවිරෝධයක් නොමැති මිනිස් ජනාවාසයි බිහි කළ යුත්තේ.

## විශ්වයේ පැවැත්ම

මිහිතලයේ ශාක ද සත්ත්වයන් ද අනුක්‍රමයෙන් බිහි වන්නේ මෙයින් වසර බිලියන 3.8කට පෙර සිට බව විද්‍යාව හා එහි භාෂාව වන ගණිතය හඳුනාගෙන තිබෙනවා. පරිසරය නම් සජීවී පද්ධතිය තුළ සත්ත්ව පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස මිනිස් සත්ත්වයා දක්වා ජීවය සංවර්ධනය වුණා. මිනිසා තම ම්ලේච්ඡ සත්ත්ව ස්වභාවයෙන් වේගයෙන් දුරස් වෙමින් සංස්කෘතික සත්ත්ව ස්වභාවයට පිවිසෙන්නේ ඔහු සොබාදහම දෙන දෙයින් පමණක් සෑහීමට පත්වන්නකු නොවන තැන් සිට. එතැන් සිට ද්‍රව්‍ය සංවර්ධනයේ සොබාදහමට නතු වූ පංගුව ඉක්මවා සමාජය යන්නට අයත් නව පංගුවක් බිහි වෙනවා. නිෂ්පාදනය, සංවර්ධනය ආදී සංකල්ප වර්ධනය වන්නේ මේ සමාජයේ. සංස්කෘතික ලෝකයේ නිමැවුම්කරුවා වන මිනිසා කාර්ය පහසු කරන උපකරණ, උපකරණ නිමවන යන්ත්‍ර නිපදවන අතර ඔහු වර්ධනය කර ගන්නේ සිතන ද්‍රව්‍ය වශයෙන් තම චින්තනය. ඔහු විද්‍යාව සොයා ගන්නා අතර ම තාක්ෂණය හඳුනාගෙන ඉන් විශ්ව මූලධර්ම මත පදනම් ව වැඩ වේගය ද වැඩ පහසුව ද හසුරුවනවා. ඔහු දැන් සංස්කෘතිකයි. කලාව රස විඳින, ගී ගයන, නටන, කතන්දර කියා සල්ලාපයේ යෙදෙන මේ සංස්කෘතික මිනිසා දැනුම සහ බුද්ධිය හුවමාරු කරගන්නා අතර ම ගොඩනඟා ගන්නේ විවිධ සමාජ සම්බන්ධතා. එබැවින් පුද්ගල චින්තනය අභිභවන සමාජ චින්තනයක් ඔහු සතුයි. ඔහුට දැන් ද්‍රව්‍යමය ශරීරය තුළ මොළය නම් ඉන්ද්‍රිය පදනම් ව අධ්‍යාත්මයක් තිබෙනවා. අධ්‍යාත්මය යනු මොළයේ ස්නායු සෛල ක්‍රියාකාරිත්වය පමණක් නොවෙයි හැඟීම් දැනීම්වල තාර්කික මානව ගුණය ද වනවා. හෘදය සාක්ෂිය නම් මානව මිම්මක් ඔහුට තිබෙනවා. එයයි සමාජ සංවර්ධනයේ

ඵලය. ඒ නිසා රටක සංවර්ධනය යනු සංවර්ධනයේ මූලධර්ම හා විකාශනය පසෙකලා අසිහියෙන් කළ හැක්කක් නොවෙයි.

## සංවර්ධනයට විශ්ව දැක්මක්

ගහකොළ, සතා සීපාවාට මෙන් ම මිනිස් සත්ත්වයාට ද සොබාදහමේ පංගුවක් හිමියි. ඕනෑ ම ජීවයක් සොබාදහම සමඟ අන්තර් ක්‍රියාකාරිත්වයක යෙදෙනවා. එනම් සොබාදහමේ පවත්නා සියල්ල අතර අන්තර් ක්‍රියාකාරිත්වයක් සහ අන්තර් රඳා පැවැත්මක් තිබෙනවා. එම ක්‍රියාකාරිත්වය හේතුවෙන් සත්ත්වයාට පවතින්නේ අභියෝග. ලොව අයිස් යුග පැවතුණා. උල්කාපාත කඩාවැටීම්, භූ චලන, නාය යෑම්, ගිලා බැසීම් යන මේ සියල්ල නිසා සිදු වුණේ ජීවයට හානි. පෙරළා සත්ත්ව ක්‍රියාකාරිත්වය සොබාදහමට අභියෝග වුණා. එළුවන් වැනි ශාක භක්ෂක සත්ත්ව ගහන අසීමාන්තික ව වර්ධනය වීමෙන් සමස්ත හරිත පරිසරය ම වැනසී ගිය අවස්ථා දක්නට පුළුවන්. මිනිසා වෙන්කොට පරිසරය ගැන කතා කිරීම වරදක් මෙන් ම අපරාධයක්. මන්ද ඔහු ඉන් පිටමන් කළ නොහැකි නිසා. ඔහු ද පරිසරයට අයත් ජීවියෙක්. මිනිසා යළි ම්ලේච්ඡත්වයට ගොස් සතුන් හා සමාන ව හැසිරිය යුතු යැයි පැවසීම ද මෝඩකමක්. මිනිසා ද පරිසරය ද සතුරු නොවන ආකාරයෙනුයි පැවැතිය යුත්තේ. එහෙත් එය වෙන් ව සහ එක් ව පැවතිය යුතුයි. ඔහු ද සොබාදහමේ අභියෝගවලට මුහුණදෙමින් එය පාලනය කරනවා. ඒ සඳහා සොබාදහමේ පොදු මූලධර්ම හඳුනා ගනිමින් ඒවා ලීවරකොටගෙන පරිසරය තමන්ට අභියෝගයක් නොවන සේ පැවතීමට ක්‍රියා කළ යුතුයි. මිනිස් සමාජය කෘෂිකර්මාන්තයේ යෙදිය යුතුයි. වාරිකර්මාන්තයේ යෙදිය යුතුයි. මාර්ග සංවර්ධනය කළ යුතුයි. ප්‍රවාහනය, වෛද්‍ය ක්‍රම වර්ධනය කළ යුතුයි. එහෙත් ඒ ඔස්සේ සොබාදහමේ සමතුලිතය බිඳවැටීමට ඉඩ නොතැබිය යුතුයි. තාක්ෂණ දියුණුව ඔස්සේ මිනිස් සමාජයට බාධා නොවන සේ ස්වාභාවික ක්‍රියාවලට පැවැතීමට පහසුකම් සැපයිය යුතුයි. ඔහු සොබාදහමේ හවුල්කරුවා මිස ආඥාදායකයා නොවෙයි. සියලු සංවර්ධන ක්‍රියාවලදී සොබාදහමට අනිසි බාධා නොකළ යුතුයි. මුළුමනින් ම සොබාදහමේ වහලෙකු ද නොවිය යුතුයි. නැතිනම් එතැන බිහි වන්නේ ශිෂ්ටාචාරවත් මිනිසා අහෝසි වී යළි ම්ලේච්ඡයා. ඒ නිසා සංවර්ධනය යනු නගර කොන්ක්‍රීට් වනාන්තර ඉදිකිරීම හෝ යළි ඝන වනාන්තර බිහි කිරීම හෝ නොවෙයි. ඉදිකිරීම්වලින් ද වනාන්තර ව්‍යාප්තියෙන් ද යුක්ත ගම සහ නගරය යැයි ප්‍රතිවිරෝධයක් නොමැති මිනිස් ජනාවාසයි බිහි කළ යුත්තේ. මිනිසා පරිසරයේ සතුරෙකු යැයි සිතන චින්තනය වෙනුවට මිනිසා ද පරිසරයේ පංගුකරුවකු බව සිතන සංවර්ධනයක් පිළිබඳ දැක්ම මුවහත් කරගත යුතුයි.

## ගාමක බලය

නිෂ්පාදන ක්‍රියාවලියයි සංවර්ධනයේ ගාමක බලය වන්නේ. මිනිසා, මිනිස් අවශ්‍යතා තෘප්තිමත් කරන භාණ්ඩ නිම විය යුතුයි. ආහාර බඳුන් නිමවන්නට පෙර මිනිසා පස්වල විශේෂ ගුණ හඳුනා ගත යුතුයි. ඒවා ශක්තිමත් කරන්නට ගින්න වැනි මාධ්‍ය හඳුනාගත යුතුයි. ජලයේ ගුණ හඳුනා ගත යුතුයි. කොටින් ම ද්‍රව්‍යවල ගුණ හඳුනාගත යුතුයි. එතැනදී විද්‍යාව උපදිනවා. ඉන්පසු නිශ්චිත මැටි වර්ගය පදම් කරන්නට ද හැඩගන්වන්නට ද ස්ථාවර කරන්නට ද තත්ත්වය සහතික කරන්නට ද තාක්ෂණය උගත යුතුයි. ඉන්පසු ආහාර බඳුන් පිළිබඳ ශිල්පයත් කලාවත් ඒ හා බැඳෙමින් ආහාර සංස්කෘතියක් ද බිහිවෙනවා. ඒ සඳහා මිනිසා ආහාර හා එහි ගුණ ද හඳුනාගත යුතුයි. මේවා කෘත්‍රිම භාණ්ඩ යැයි පැවසුව ද ඒවා වෙනස් කළ සොබාදහම. ආහාර බඳුන් නිපදවන ශිල්පයට ප්ලාස්ටික් භාජන එක්වත් ම ප්‍රතිවිරෝධය පැන නගිනවා. එහෙත් ශරීරයට ද පරිසරයට ද හානි කරන ප්ලාස්ටික් ද සොබාදහමේ රසායනික ගුණයක ප්‍රතිඵලයක්. එය මිනිස් දිවිය හා පරිසරය සමඟ ප්‍රතිවිරෝධී වේනම් අප කළ යුත්තේ නැවත පොල් කට්ට භාවිතයට පෙළඹීම නොව ප්ලාස්ටික් භාවිතය අවම කිරීම හා ආදේශක සෙවීම. සංවර්ධනය යනු එහි ඵලවිපාක සොබාදහම හා ගැටෙන විට නැවත වනාන්තරගත වීම නොව සොබාදහමට සතුරු බව අතහැර එය තම සංවර්ධනයේ මූලාශ්‍ර සපයන හිතවතා

> සංවර්ධනය යනු මිනිස් සමාජය උසස්තම සතුට සහිත ජීවිතයක් දෙසට ගෙන යන මහා ව්‍යායාමයක්. මෙය මානව ප්‍රේමය මුල් වූ අරමුණු සහගත සාමූහික ප්‍රයත්නයක්. ඒ සඳහා සාමූහික හැඟීම් සහිත සමාජ පරිවර්තනය පිළිගන්නා නව මිනිසෙකු අවශ්‍ය වෙනවා. පවතින මිනිස් සමාජයේ වටිනාකම් මනින මිම්ම වන්නේ ලාභය සහ පුද්ගලික වාසිය. නව සමාජය ගොඩනඟන නායකත්වය ද පාර්ශ්වකරුවන් ද සාමූහිකත්වය ද ප්‍රතිලාභවලින් තොර කැපවීම ද සහිත විය යුතුයි. සාමූහිකත්වය, සටනේදී ප්‍රබල අවියක්.



බවට පත් කර ගැනීම. කාබනික ඉන්ධන හානිකරනම් වෙනත් සොබාදහමේ ශක්තීන් සොයාගනු මිසෙක මිනිසා යළි බර බාගෙට, ලී ඩක්කුවට පසු නොබැසිය යුතුයි. මිනිස් ජනගහනය වැඩි වීමෙන් මළ අපද්‍රව්‍ය ගොඩගැසීමේ ගැටලුවට විසඳුම උපත් පාලනය ද නැත්නම් විද්‍යාව හා තාක්ෂණයේ පිහිටෙන් එය විසඳා ගැනීම ද? මිනිසා තාක්ෂණය සොයා ගන්නේ තම නිෂ්පාදන ක්‍රියාවලියේ ඵලදායකත්වය වැඩි කිරීමට හා වැඩ පහසු කිරීමට. මේ ක්‍රියාවලියේදී මිනිසා තමාගේ දැනුම ද අත්දැකීම් ද පුළුල් කරගන්නවා. ඒ අනුව ඔහු නිෂ්පාදන උපකරණ ද අමුද්‍රව්‍ය ද යන්ත්‍ර සූත්‍ර ද යටිතල පහසුකම් සපයන සේවා ද සංවර්ධනය කර ගන්නා අතර එයට සමාන්තර ව මිනිස් පරිසරය වර්ධනය කරනවා. ඒ නිසා සංවර්ධනයේ ගාමක බලය වන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය. ඉන් වියුක්ත සංවර්ධනයක් නැහැ.

## සමාජමය සතුට

මිනිසා තම මූලික අවශ්‍යතා සපයා ගැනීම ඔස්සේ තම පැවැත්ම තහවුරු කරගන්නවා. එය කුස පුරවා ගැනීමේ සිට වඩා උසස් ආහාර සංස්කෘතියක් දක්වා ද පා ගමනේ සිට විදුලි වේගය පරයන ගමන් වේගය දක්වා ද ඖෂධ ප්‍රතිකාරයේ සිට රෝග වැළැක්වීම දක්වා ද සිරුර සැරසිල්ලේ සිට විලාසිතා සංස්කෘතියක් දක්වා ද හස්ත කර්මාන්තයේ සිට කෘත්‍රිම බුද්ධිය දක්වා ද ජීවිතය ඔසවා තබනවා. ඔහු සොයන්නේ තවත් ලාභ ලබන වෙළෙඳාමක් හෝ කර්මාන්තයක් හෝ නොව විවේකය, විනෝදය, තෘප්තිමත්භාවය, ඉහළ ම තලයේ සතුට, සංවාදය. නිෂ්පාදනය වර්ධනයේ අවසාන අරමුණ එයයි. මේ සඳහා මිනිස් සමාජය අවස්ථා ගණනාවක් පසු කළ යුතු වෙනවා. පළමු ව මිනිසා ශ්‍රම සූරාකෑමෙන් විමුක්තිය ලද යුතුයි. ශ්‍රමය විකිණීම වෙනුවට ශ්‍රමය සමාජගත කිරීම වැදගත්. ශ්‍රම ක්‍රියාවලිය පුද්ගලික නොවන සමාජමය වූවක් බැවින් ශ්‍රම විමුක්තිය සමාජමය වූවක්. එය යථාර්ථයක් වන දිසාවට සමාජ පරිවර්තනයක් සමාජයේ අර්බුදවල ප්‍රකාශනය විසින් ඉල්ලනු ලබනවා. එවිට ජීවිතය යනු සමාජ ධනය නිෂ්පාදනය, තාක්ෂණ දියුණුව, මානව සමාජයේ විවේකය, විනෝදය, බුද්ධිමය සංවාදය, සතුටු සාමීචිය හා පරම සතුට යන ඒවා බවට පත්වෙනවා. වෙළෙඳපොළ හා ලාභය වෙනුවට සාමූහිකත්වය හා සමාජ සාධාරණත්වය බිහිවෙනවා. එයයි සංවර්ධනයේ අවසාන ඉලක්කය.



## සමාජ පරිවර්තනය මෙහෙයවන්නා

ඉහත සියල්ල කැටිකොට ගත් කල සංවර්ධනය යනු මිනිස් සමාජය උසස්තම සතුට සහිත ජීවිතයක් දෙසට ගෙන යන මහා ව්‍යායාමයක්. මෙය මානව ප්‍රේමය මුල් වූ අරමුණු සහගත සාමූහික ප්‍රයත්නයක්. ඒ සඳහා සාමූහික හැඟීම් සහිත සමාජ පරිවර්තනය පිළිගන්නා නව මිනිසෙකු අවශ්‍ය වෙනවා. පවතින මිනිස් සමාජයේ වටිනාකම් මනින මිම්ම වන්නේ ලාභය සහ පුද්ගලික වාසිය. නව සමාජය ගොඩනගන නායකත්වය ද පාර්ශ්වකරුවන් ද සාමූහිකත්වය ද ප්‍රතිලාභවලින් තොර කැපවීම ද සහිත විය යුතුයි. සාමූහිකත්වය, සටනේදී ප්‍රබල අවියක්. ගොඩනැඟීමේදී ප්‍රබල යන්ත්‍රයක්. නිවැරැදි දැක්ම ද මෙහිදී සුවිශේෂයි. හිරු, අපට ප්‍රයෝජනවත් වන්නේ හිරුගේ ශක්තිය අප නිසියාකාර ව හඳුනාගත් පසුව. සංවර්ධනයේදී සුළඟ බලවේගයක් ලෙස හඳුනා ගැනීම පමණක් නොව එය සංවර්ධනයට හවුල් කරගන්නා උපාය ඥානයක් අවශ්‍ය වෙනවා. එසේ නොකොට එය හසුරුවාගත නොහැකි ව එය විශ්වයේ ගුප්තමය බලයක් යැයි එයට ස්තෝත්‍ර ගායනා නොකළ යුතුයි. මිනිසා ද විශ්වයට අයත් බැවින් විශ්වයේ වන බලය මිනිසා සතු ව ද පවතිනවා. එබැවින් අවශ්‍ය නව මිනිසා දාර්ශනික තර්ක ඔස්සේ සමාජයේ සංවර්ධනය හඳුනා ගන්නා හා තාර්කික සුබවාදයක් සහිත අයෙක්. ඔහු අනාගත සමාජය පිළිබඳ පරමාදර්ශයක් විය හැකි නමුත් මනෝරාජ්‍යයක රජකු නොවෙයි. ඔහු දිනන්නේ ද පරදින්නේ ද පසුබසින්නේ ද සාමූහික මිනිසෙකු ලෙස. ඔහු දිනන්නේ මානව ප්‍රේමයේ උසස් හැඟීම. එවැනි මිනිස් සමූහ ගොඩනැඟිය හැකි බව දිට්වා ආපදාවෙන් පසු සාමූහික මිනිස් ක්‍රියාකාරිත්ව මොනවට තහවුරු කර තිබෙනවා.

## සංවර්ධනයේ සුක්කානම

සංවර්ධනය පිළිබඳ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සැලසුම් සහගත වූවක්. එම සැලැස්ම ආරම්භ කරන්නට සිදු ව තිබුණේ රට වැටුණු තැන සිට. එබැවින් සංවර්ධනය යනු සැලසුම් සහගත සමාජ පරිවර්තනය වුව ද පැවැති ක්‍රමයේ සමාජ ආර්ථික දේහයේ සිදුරු වසන්නට ආණ්ඩුවට සිදු ව තිබෙනවා. සමාජ පරිවර්තනයක් වුව ද ඇරඹිය යුතු වන්නේ පැවැති සමාජ ක්‍රමයේ අවසාන පියවරේ සිට. එය ප්‍රපාතයක්නම් පළමු ව අප ගොඩ ආ යුතුයි. විශ්වයේ කිසිදු සංවර්ධන මාවතක් සරල රේඛීය නැග්මක් නොවෙයි. එය පහළ සිට ඉහළ නගිමින් පියවරෙන් පියවර පුළුල් වන කවවලින් සැදි සර්පිලයක්. එබැවින් පළමු ලක්ෂ්‍යයෙන් ඉහළ නගින සර්පිලය දෙවැනි ව පුළුල් කවයක ගමන් කරමින් ආරම්භක ස්ථානයට ඉහළින් යළි ගමන් කරන සේ පෙනෙනු ඇති. ගව පාලනය ඊට උදහරණයක්. එය කඩා වැටුණු තත්ත්වයෙන් ඇරඹී සැලසුම් සහගත ආර්ථිකය තුළ සංවර්ධන සර්පිලයේ එක් පියවරක් ඉහළට යනු ඇති. එහිදී නව සත්ත්ව ගොවිපළ සඳහා ඉදිකිරීම්, ආහාර, ප්‍රතිකාර ආදී පහසුකම් දිරිගන්වමින් තව පියවරකින් සත්ත්ව වගාව පුළුල් වනු ඇති. තව අදියරකදී කිරි ආශ්‍රිත නිෂ්පාදනවල පොදු සමාජ පරිභෝජනය වැඩි කළ හැකියි. එය විසින් ගව පාලනය නව සංවර්ධන තලයකට එසවෙනු ඇති. මේ දක්වා යන්ත්‍ර භාවිතය අඩු විය හැකි නමුත් එය යන්ත්‍ර භාවිතය ඔස්සේ සංවර්ධනයේ නව පියවරකට යා හැකියි. දේශීය වෙළෙඳපොළේ සත්ත්ව නිෂ්පාදන ආශ්‍රිත ආහාර සඳහා ඉල්ලුම සංතෘප්ත කරමින්

විදේශ වෙළෙඳපොළට සෙමෙන් පියවර තැබිය හැකියි. තවදුරටත් සත්ත්ව පාලනය මස් කර්මාන්තය දෙසට ද වර්ධනය කළ හැකියි. ඒ සංවර්ධන සර්පිලයේ කිසිදු කවයක් අභියෝග නොමැති ව ඉහළ තලයට එසවෙන්නේ නැහැ. කර්මාන්තය වර්ධනයේදී ගොවියාගේ විද්‍යාත්මක දැනුම, පාරිභෝගිකයාගේ ආකල්පවල පසුගාමීත්වය ආදී කරුණු පවා අභියෝග බවට පත්වෙනවා. ගෝලීය ආර්ථික බලපෑම්, ආපදා, ගව රෝග වසංගත තත්ත්ව ආදී අභියෝග අහඹු බවට පත්වන්නට ඉඩ නොදී පෙර සූදානම් සහිත ව සැලසුම් විය යුතුයි. දුප්පත් ආර්ථිකයේ මේ කිසිවක් එකවර විය නොහැකි නමුත් සමාජ පරිවර්තනයක්නම් සැලසුම් සහගත ව ඉලක්ක සහගත ව ඉදිරියට යා යුතුයි.

> විශ්වයේ කිසිදු සංවර්ධන මාවතක් සරල රේඛීය නැග්මක් නොවෙයි. එය පහළ සිට ඉහළ නගිමින් පියවරෙන් පියවර පුළුල් වන කවවලින් සැදි සර්පිලයක්. එබැවින් පළමු ලක්ෂ්‍යයෙන් ඉහළ නගින සර්පිලය දෙවැනි ව පුළුල් කවයක ගමන් කරමින් ආරම්භක ස්ථානයට ඉහළින් යළි ගමන් කරන සේ පෙනෙනු ඇති.

## ආධ්‍යාත්මික වර්ධනය

සංවර්ධනය යනු හුදු භෞතික ක්‍රියාවලියක් නොව සජීවී මිනිස් සබඳතා ගොන්නක්. සංවර්ධනය යන්න සජීවි මිනිස් සබඳතා ගොන්නක්නම් එහි පවතින්නේ ආධ්‍යාත්මික බැඳීම් සමූහයක්. එම බැඳීම් සාමූහිකත්වය පුළුල් වන්නේ ආධ්‍යාත්මික සංවර්ධනය සමඟ. භෞතික සංවර්ධනය සමඟ මිනිසාගේ චර්යා උසස් වන අතර ඔහු විද්‍යාව ඉගෙන අවිද්‍යාව බැහැර කරනු ඇති. තාක්ෂණය උගෙන ශ්‍රම සූක්ෂ්ම බව අඩු කරනු ඇති. මිනිසා සංස්කෘතික වශයෙන් ඉහළට එසවෙනු ඇති. මේ සියල්ලෙහි යතුර මමත්වයේ පුරුද්දෙන් බැහැර ව සාමූහිකත්වයේ පුරුද්දෙහි පැතිරීම. එයට සරිලන අධ්‍යාපන වෙනස්කම් මිනිස් සමාජ විඥානය උසස් කරනු ඇති. එබැවින් සංවර්ධනයේ අවසන් ඵලය ලෙස ඉතා ඉහළ සමාජමය මිනිස් හෘදය සාක්ෂියක් සහිත සාමූහික මනුෂ්‍යත්වයක් ගොඩනැගෙනු ඇති.





ආචාර්ය
**එල්. ඩී. සරත් විතාරණ**
සමාජ විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

ආසියානු, අප්‍රිකානු රටවලට අදාළ ව දෙවැනි ලෝක යුද්ධයෙන් පසු සංවර්ධනය පිළිබඳ කතාබහේදී සංකල්පයක් ලෙස මුලින් ම ගොඩනැගෙන්නේ ආර්ථික සංවර්ධනය. එනම් රටක ආර්ථිකය දියුණු කිරීමයි මූලික වශයෙන් ම සංවර්ධනය ලෙස සැලකුවේ. එහිදී එක්සත් ජාතීන්ගේ සංවිධානය විශේෂයෙන් සංවර්ධනය ගැන අවධානය යොමු කළා. 1950 දශකය වන විට එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ආර්ථික විද්‍යාඥයන් බොහෝදුරට කතා කළේ ආර්ථික වර්ධනයක් ගැන. දෙවැනි ලෝක යුද්ධයෙන් පසු ව පැවති පසුගාමී තත්ත්වයත් සමඟ එම රටවල ආර්ථිකයට විශාල තල්ලුවක් දිය යුතු බව ඔවුන්ගේ අදහස වුණා.

1960 දශකය, සංවර්ධනයේදී කේන්ද්‍රීය සංධිස්ථානයක් වුණා. එක්සත් ජාතීන්ගේ සංවිධානය ඔවුන්ගේ පළමු සංවර්ධන දශකය ඉදිරිපත් කරන්නේ එම වකවානුවේදී. එහිදී මූලික වශයෙන් අවධානය යොමු වූයේ ආර්ථික වෘද්ධිය වෙත. 1961 වසරේදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට මේ යෝජනාව ඉදිරිපත් වීමත් සමඟ වාර්ෂික ව 5%ක ආර්ථික වෘද්ධියක් අත්පත් කරගැනීම මූලික අපේක්ෂාවක් ලෙස සැලකෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක බැංකුව, ජාත්‍යන්තර

# තිරසර සංවර්ධනයක්

මූල්‍ය අරමුදල මැදිහත්වීමෙන් ඒ සඳහා වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා. 1960 දශකයේ මැදභාගය වන විට පැහැදිලි වන්නේ ආර්ථික වර්ධන වේගය අත්පත් කරගැනීම තරමක් දුෂ්කර කාර්යයක් බව. සංවර්ධනය යන සංකල්පයෙන් බලාපොරොත්තු වන ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම, සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම වැනි කාර්ය මේ ඉලක්කය යටතේ ඉෂ්ට නොවන බවයි පෙනී ගියේ. ඒ වන විට ලෝක බැංකුවේ හිටපු සභාපතිවරයා පෙන්වා දී ඇත්තේ මේ 5%ක ආර්ථික වර්ධන වේගයක් අත්පත් කරගැනීමේ ඉලක්කය සාර්ථක නොවන බව. ඉන්පසු 1969 වසරේදී ඩඩ්ලි සියර්ස් නම් බ්‍රිතාන්‍ය ආර්ථික විශේෂඥයකු ද Meaning of development

> සංවර්ධන ක්‍රියාවලියේදී අවසාන වශයෙන් ආර්ථික සංවර්ධනයක් ඇති වීම ප්‍රමාණවත් නොවන බවත් මානව ශක්‍යතා වර්ධනය විය යුතු බවත් පිළිබඳ මතය ගෙන එන්නේ ඉන්දියාවෙන්. සංවර්ධන ක්‍රියාවලියේදී සිදුවිය යුත්තේ ආර්ථික සංවර්ධනයක් පමණක් නොවන බවටත් මානව සංවර්ධනයක් සිදු විය යුතු බවටත් වන මතය තවදුරටත් වර්ධනය කරන්නේ පාකිස්තානයේ ආර්ථික විශේෂඥයකු වූ මහමුද් උල්හක්. මේ අනුවයි 1990 දශකයේදී මානව සංවර්ධනය යන සංකල්පය වර්ධනය වන්නේ.

නම් ලිපියෙන් රටක දුගීභාවය සහ මන්දපෝෂණය, ආදායම් විෂමතාව, විරැකියාව යනුවෙන් රටක් සංවර්ධනය වන විට මූලික වශයෙන් විසඳුම් ලැබිය යුතු ප්‍රශ්න 03ක් පිළිබඳ කතා කරනවා. රටක දුගී බව හා මන්දපෝෂණය, ආදායම් විෂමතාව, විරැකියාව අඩු වී තිබෙනවානම් එය සංවර්ධනය ලෙස සැලකිය හැකි බවත් එසේ නොමැති ව රටක ආර්ථිකය වර්ධනය වූ පමණින් රටේ සංවර්ධනයක් සිදු වූ බව පිළිගත නොහැකි බවත් එහිදී ලෝකයට ඒත්තු ගැන්වෙනවා.

මේ සමඟ සංවර්ධනය යන සංකල්පය යොමු වන්නේ වෙනස් දිශාවකට. 70 දශකයේදී එක්සත් ජාතීන්ගේ සංගමය දෙවැනි සංවර්ධන දශකය ඉදිරිපත් කරන විටදීත් මූලික වශයෙන් ම ඉදිරිපත් කරනවා ආර්ථික වර්ධන වේගය පවත්වාගත යුතු බව. එසේ ම ඩඩ්ලි සියර්ස් මතු කළ කාරණාත් අවධාරණය කළ යුතු ක්ෂේත්‍ර ලෙස හඳුනා ගන්නවා. 1976 වසරේදී ලෝක කම්කරු සංවිධානය ඉදිරිපත් කරන මූලික අවශ්‍යතා එළඹුමේදී අවධාරණය කරන්නේ සංවර්ධන ක්‍රියාවලියේදී අවම වශයෙන් ආහාර, නිවාස, රැකියා, අධ්‍යාපන වැනි ජනතාවගේ මූලික අවශ්‍යතා ලෙස ඉටු වන ක්‍රියාවලියක් සිදු විය යුතු බව

1950, 60, 70 දශකවලදී එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර සංවර්ධන නියෝජිත ආයතන ක්‍රියා කළේ පොදු න්‍යාය පත්‍රයකට අනුව. එහෙත් 80 දශකයේදී මේ තත්ත්වය වෙනස් වෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානය මානව සංවර්ධනය, තිරසර සංවර්ධනය වැනි ක්ෂේත්‍රවලටත් ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතන නව ලිබරල්වාදී ආකෘතියකටත් යොමු වෙනවා.

1982 වසරේදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමේදී පත් කරනවා පරිසරය සහ සංවර්ධනය පිළිබඳ ලෝක කොමිසමක්. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ව එවැනි කොමිසමක් පත් කිරීම සඳහා හේතු වුණේ එතෙක් අනුගමනය කළ සංවර්ධන ක්‍රියාමාර්ග ඔස්සේ ඇතිවූ බරපතළ ගැටලු තත්ත්ව. විශේෂයෙන් මේ කාල සීමාවේ වනාන්තර විනාශය, අම්ල වැසි, රසායනික ද්‍රව්‍ය වැනි දේ නිසා බරපතළ සමාජීය, ආර්ථික, සෞඛ්‍ය ගැටලු ඇති වෙනවා. කාන්තාරීකරණය වැනි දේ වර්ධනය වෙනවා. මේ සමඟයි පරිසරය සහ සංවර්ධනය අතර තුලනයක් තිබිය යුතුයි යන සංකල්පය ලෝකය පිළිගන්නේ.

මේ කොමිසමේ වාර්තාව එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට ඉදිරිපත් කරන්නේ 1987 වසරේදී. තිරසර සංවර්ධනයේදී මූලික වශයෙන් පරිසරය සහ සංවර්ධනය අතර තුලනයක් තිබිය යුතු බව අපේක්ෂා කළා. එම වාර්තාවේ ඉදිරිපත් කරනවා සංවර්ධනයේදී ධනවත් ජාතීන් බවට දුගී ජාතීන් පත්වීම කළ යුත්තේ කෙසේද යන්න. සංවර්ධනය යන මාතෘකාවේදී අපට පරිසරය අමතක කළ නොහැකියි. සමාජවාදී ලෝකය සහ ධනවාදී ලෝකය සංවර්ධනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විට පාරිසරික තිරසරභාවය සම්බන්ධයෙන් අනිවාර්යයෙන් ම අවධානය යොමු කළ යුතු බවත් ඒ සඳහා පුළුල් උපායමාර්ගික එළඹුමක් අවශ්‍ය බවත් මෙහිදී අවධාරණය කෙරෙනවා.

සංවර්ධන ක්‍රියාවලියේදී අවසාන වශයෙන් ආර්ථික සංවර්ධනයක් ඇති වීම ප්‍රමාණවත් නොවන බවත් මානව ශක්‍යතා වර්ධනය විය යුතු බවත් පිළිබඳ මතය ගෙන එන්නේ ඉන්දියාවෙන්. සංවර්ධන ක්‍රියාවලියේදී සිදුවිය යුත්තේ ආර්ථික සංවර්ධනයක් පමණක් නොවන බවටත් මානව සංවර්ධනයක් සිදු විය යුතු බවටත් වන මතය තවදුරටත් වර්ධනය කරන්නේ පාකිස්තානයේ ආර්ථික විශේෂඥයකු වූ මහමුද් උල්හක්. මේ අනුවයි 1990 දශකයේදී මානව සංවර්ධනය යන සංකල්පය වර්ධනය වන්නේ. ඒ සමඟ එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ සංවර්ධන වැඩසටහනට අනුබද්ධ ව මුල් වතාවට මානව සංවර්ධන වාර්තාවක් ප්‍රකාශයට පත් වෙනවා 1991 වසරේදී. එදා සිට අද දක්වා ම මානව සංවර්ධන වාර්තාව වාර්ෂික ව ප්‍රකාශයට පත් වීම විශේෂත්වයක්. මානව සංවර්ධනයේදී මූලික වශයෙන් ම සංවර්ධනය වඩාත්

ප්‍රජාතාන්ත්‍රික විය යුතුයි. සංවර්ධනයට සහභාගි වීමේ හැකියාව ජනතාවට පැවැතිය යුතුයි. ජනතාවගේ තෝරා ගැනීමේ පරාසය පුළුල් විය යුතුයි. ආදායම, රැකියා අවස්ථා, අධ්‍යාපනය, සෞඛ්‍ය, පිරිසුදු සහ ආරක්ෂිත පරිසරයක ජීවත් වීම සඳහා ඇති ඉඩකඩ වැනි දේ වර්ධනය විය යුතුයි. අවසාන වශයෙන් සංවර්ධනය සම්බන්ධයෙන් ගන්නා තීරණවලට සහභාගි වීම සඳහා අයිතියක් ප්‍රජාවට තිබිය යුතුයි. මානව නිදහස, ආර්ථික නිදහස, දේශපාලන නිදහස පැවතිය යුතුයි.

දීර්ඝ සහ සෞඛ්‍ය සම්පන්න ජීවන තත්ත්වයක්, අධ්‍යාපනය සහ දැනුම, ජනතාවට ගෞරවයෙන් යුතු ව ජීවත් වීමට ඇති ඉඩකඩ යන සංරචක සංවර්ධනයේ මූලිකාංග විය යුතු බවත් මේ මානව සංවර්ධන වාර්තාවෙන් ඉදිරිපත් කළා. එහිදී සංවර්ධනය මැනීම සඳහා නිර්ණායකත් ඉදිරිපත් කළා. එම නිර්ණායක භාවිත කරමින් මානව සංවර්ධනයට අනුව ලෝකයේ රටවල් වර්ගීකරණයක් ද 1991 වසරේ සිට සිදු වුණා.

මේ වකවානුව දක්වා රටවල් හුදෙකලාව සංවර්ධනය අත්පත් කරගැනීම යන සංකල්පයේ සිටිය ද 2000 වර්ෂය වන විට ලෝකය තේරුම් ගන්නවා තනි තනි රටවල් ලෙස සංවර්ධනය අත්පත් කරගැනීම සාර්ථක නොවන බව. එබැවින් ගෝලීය වශයෙන් සංවර්ධනයක් අත්පත් කරගැනීම සඳහායි ලෝකය සහස්‍ර සංවර්ධන අරමුණු ඉලක්ක කර ගත්තේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය මේ අදහස පිළිගත්තා 2000 වසරේදී. 2000 සිට 2015 වසර දක්වා සංවර්ධන සැලැස්මක් අනුව එය ක්‍රියාත්මක වෙනවා. එහිදී ලෝකයේ සැලකිය යුතු වෙනස්කම් රැසක් සිදු වී තිබෙනවා.

අන්ත දරිද්‍රතාව මුලිනුපුටා දැමීම, පාසල් නොයන දරුවන් පාසල් අධ්‍යාපනයට එකතු කරගැනීම, කාන්තාවන් දේශපාලනයට දායක කර ගැනීම, නිවාරණය කළ හැකි ලෙඩරෝගවලින් මිය යන සංඛ්‍යාව අඩු කිරීම සහ අලුත් රෝග තර්ජනවලින් වන හානි අවම කරගැනීම, සෞඛ්‍ය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම වැනි ක්‍රියාමාර්ග ඒ අතර ප්‍රධාන වෙනවා.

සංවර්ධනය තවදුරටත් ලෝකයේ එක කොනකට පමණක් සීමා කරන්නට බැහැ. ඒ, අසංවර්ධිත ලෝකයේ ක්‍රියාකාරකම් (උදා - අනවසර සංක්‍රමණිකයන්) සංවර්ධිත ලෝකයට බලපෑම් එල්ල කරන නිසා.

රටවල් දුගීභාවයට පත් වන විට සිදු වන ගංගා දූෂණය, පාරිසරික උෂ්ණත්වය ඉහළ යෑම වැනි දේ සියලු ම දියුණු රටවලටත් බලපෑ හැකියි. එවිට එය ගෝලීය තර්ජනයක් බවට පත් වෙනවා. එවැනි තත්ත්වයක් යටතේ ගෝලීය වශයෙන් සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායකත්වයක් ලබා දීමයි වැදගත් වන්නේ. ඒ අනුව සංවර්ධනය සඳහා ගෝලීය සහසම්බන්ධතාවක් වර්ධනය කරගැනීම ද සහස්‍ර සංවර්ධන අරමුණුවල මූලික අපේක්ෂාවක් බවට පත් වුණා.

2010 වසර වන විට සංවර්ධනය පිළිබඳ සංකල්පය තවදුරටත් වෙනස් වෙනවා. එහිදී සංවර්ධන සංකල්පයට තින් එකතු වෙනවා මිනිස්සු සතුටින් සිටීම සංවර්ධනයේ මූලික සංරචකයක් බවට පත් විය යුතුයි යන සංකල්පය. 2015 වසර වන විට ගොඩනැගෙන්නේ සංවර්ධනය තිරසර විය යුතුයි යන සංකල්පය.

**කාංචනා සිරිවර්ධන**




මහාචාර්ය

**එස්. එල්. ජේ. ප්‍රනාන්දු**

භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

රුහුණ විශ්වවිද්‍යාලය


සංවර්ධනයේදී විශේෂ අවධානයක් ලැබිය යුතු කාරණයක් භූමි පරිභෝජනය සහ ඉඩම් භාවිතය. එහිදී පළමු ව ශ්‍රී ලංකාවේ භූමිය පිළිබඳ යම් අදහසක් ලබාගැනීම වැදගත්. නිවර්තන කලාපයේ උත්තර අර්ධගෝලයේ පිහිටි, භූ විෂමතාව අතින් ඉතා සංකීර්ණ ඉන්දියන් සාගරයේ පිහිටා තිබෙන දූපතක් ශ්‍රී ලංකාව. මීට අවුරුදු මිලියන 26කට පමණ පෙර ඉන්දියාවේ ඩෙකෑන් සානුවට සම්බන්ධ ව පැවැති භූමියක් වන ශ්‍රී ලංකාව වෙන ම දූපතක් හැටියට වෙන් වී ඇත්තේ මයෝසීන කාලයේදී. ස්වාධීන භූමි ඒකකයක් ලෙස නිර්මාණය වන විට අපේ භූමිය තීරණය වීමට උතික්ෂිප්තවීම ප්‍රධාන බලපෑමක් එල්ල කළා. එනම් භූමිය එකවර ඉහළ නැගීමක් සිදු වී තිබෙනවා අවස්ථා තුනකදී. ඒ අවස්ථා තුන හේතුවෙන් ශ්‍රී ලංකාවේ භූමිය කොටස් තුනකට වර්ග වී තිබෙනවා වෙරළතැන්න, මධ්‍යම තැන්න සහ උස්බිම් තැන්න වශයෙන්.



# නීතිය බලාත්මක කරන්න

භූමියේ මේ පවතින විෂමතාව මත භූමි පරිභෝජනය සහ ඉඩම් භාවිතය වෙනවා. භූමියේ විෂමතාව තීරණය කරන සාධකයක් ලෙස දේශගුණයත් සලකා බැලිය හැකියි. තෙත් කලාපය, වියළි කලාපය, අර්ධ ශුෂ්ක කලාපය වශයෙන් දේශගුණය පදනම් කරගෙන භූමිය බෙදා දක්වනවා කොටස් තුනකට. මේ අනුව භූ විෂමතාව හා දේශගුණය යන සාධක දෙක ම අනුව භූමි පරිභෝගය තීරණය වී තිබෙනවා.

භූමි පරිභෝගය සහ භූමි ආවරණය අනුව සමස්ත ශ්‍රී ලංකාව කොටස් දෙකකට සලකා බැලුවහොත් ස්වාභාවික බිම් සහ මානව කාරක බිම් ලෙස කොටස් දෙකක් හඳුනාගන්න පුළුවන්. ස්වාභාවික බිම්වලින් කෙරෙන්නේ මිනිසාට අවශ්‍ය සම්පත් ලබාදීම සහ ජීවත්වීම සඳහා අවශ්‍ය ආරක්ෂාව සලසා දීම. මානව කාරක බිම් යනු මිනිසුන් විසින් ගොඩනගන ලද භූමි. ඕනෑ ම රටක ස්වාභාවික බිම් සම්බන්ධයෙන් අවධානය යොමු නොකිරීමෙන් තිරසර සංවර්ධනයට බාධා වන ආකාරයේ ගැටලු මතු වෙනවා. ශ්‍රී ලංකාවේ ද භූමි භාවිතයේ තිබෙන ඍණාත්මක පසුබිම හේතුවෙන් භූමිය මගින් ඇති කෙරෙන යම් යම් විපත් ජීවිත හානිවලට, දේපළ හානිවලට මග පාදා තිබෙනවා.

මෙරට භූමි භාවිතය සම්බන්ධයෙන් ඇති නෛතික රාමුව දෙස අවධානය යොමු කිරීමේදී 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත, 1950 අංක 19 දරන ඉඩම් අත්පත් කරගැනීමේ පනත සහ එහි ම 2000 අංක 49 දරන සංශෝධිත පනත, නගර සහ ගම් සැලසුම් ආඥා පනත, 2004 අංක 06 දරන ජාතික භෞතික සැලසුම් පනත, 1951 අංක 25 දරන පාංශු සංරක්ෂණ පනත, 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ කළමනාකරණ පනත (1999දී සංශෝධිත) වැනි නීති වැදගත්.

මේ සම්බන්ධයෙන් සකස් කළ නෛතික රාමුවක් තිබුණ ද එම නීති නිසි ලෙස ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ගැටලු මතු වන අවස්ථා බහුල ව හඳුනාගන්නට පුළුවන්. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ඉඩම් භාවිතය පිළිබඳ නිශ්චිත බවක් නැත්තේ නාගරික සංවර්ධන සැලසුම්වල පැවැති දුර්වලතා නිසා. සාමාන්‍ය වර්ෂාපතනයකදී පවා නාගරික ප්‍රදේශ ඉක්මනින් ජලයෙන් යටවෙනවා.

> භූමි භාවිතය සම්බන්ධ ව පවතින ගැටලුවක් ලෙස ස්වාභාවික බිම් හා ස්වාභාවික තෙත් බිම් කලාප ගොඩකිරීම සහ ඒවා ඉදිකිරීම් සඳහා භාවිත කිරීම පෙන්වා දිය හැකියි. බොහෝ ගැටලු නිර්මාණය වී ඇත්තේ මිනිසුන්ගේ භූමි පරිහරණයේ අදූරදර්ශී බව නිසා. ශ්‍රී ලංකාවේ භූමි පරිහරණය පිළිබඳ කතාබහ කිරීමේදී ශ්‍රී ලංකාවට සැලකිය යුතු ආදායමක් ලැබෙන සංචාරක කර්මාන්තය පිළිබඳ කතාබහ ද මඟ හැරිය නොහැකියි. සංචරණය සඳහා ඇති විභව භූමි තිබෙනවා තව ම කිසිදු ප්‍රයෝජනයක් ලබාගෙන නොමැති.

භූමි භාවිතය සම්බන්ධයෙන් ඇති ප්‍රධානම නීති රාමුව අපේක්ෂිත මට්ටමෙන් කළමනාකරණය කරගැනීමට සහ ක්‍රියාත්මක කරගැනීමට නොහැකි වීම හේතුවෙන් ඉඩම් සම්බන්ධයෙන් පැනනැඟී ඇති සියලු ගැටලු අවසානයේ බලපාන්නේ මිනිස් ජීවිතවලට සහ දේපළවලට. ඒ නිසා භූමි භාවිතය හා භූමි පරිහරණය සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් ඇති ව ක්‍රියා කළ යුතුයි.

මෙහිදී අපට වැදගත් වන්නේ භූමි ආවරණය පිළිබඳ සලකා බලා භූමි භාවිතය සිදු කිරීම.

වනාන්තර, තෘණ භූමි සහ කුඩා වනාන්තර, තෙත්බිම්, ජලාශ, නගර සහ ගම්මාන, කෘෂි වගාබිම්වලින් භූමිය ආවරණය වී තිබෙනවා. එසේ ආවරණය වී ඇති භූමිය කෘෂිකර්මය, ක්‍රීඩා සහ විනෝදය, මානව ජනාවාස, මාර්ග ජාලය ගොඩනැඟීම, කර්මාන්ත හා සේවා ඇති කිරීම, සංරක්ෂිත බිම් හා කලාප ඇති කිරීම, ජල කළමනාකරණය වැනි අවශ්‍යතා සඳහා භාවිත කරනවා.

ස්වභාවයෙන් ම ලැබුණු භූමි ආවරණය භාවිත කිරීමේදී ඇතිවන දෝෂ හේතුවෙනුයි භූමි භාවිතය තිරසර මාවතකට යොමු නොවන්නේ. රටක භූමි භාවිතය තිරසර මට්ටමකට ළඟාවීමෙන් එරට සංවර්ධනය ඉතා ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට හැකියාව ලැබෙනවා. නෙදර්ලන්තය ඒ සඳහා ඉදිරිපත් කළ හැකි කදිම නිදසුනක්.

භූමි භාවිතයේදී භූ විෂමතාව ගැන ද විශේෂයෙන් සැලකිලිමත් විය යුතුයි. මේ පිළිබඳ නිසි අවධානයක් නොමැති ව නාය යෑම් සම්බන්ධයෙන් යම්කිසි විභවතාවක් ඇති භූමිවල ජනාවාස ඇති කරගැනීම, බෑවුම් කලාපවල ඉදිකිරීම් වැනි හේතු මත සිදු වන විනාශ පිළිබඳ පසුගිය කාලයේ බොහෝ අත්දැකීම් ලැබුණා.

2003 වසරේ ශ්‍රී ලංකාවේ ඇති වුණා විශාල ගංවතුරක් සහ නාය යෑම් කලාප. එහිදී දෙණියාය, දියදාව ප්‍රදේශයේ එක ම ස්ථානයේ නායයෑම් 11ක් සිදු වුණා. ඒ නාය යෑම් ඇති වීමට ප්‍රධාන ම හේතුව වුණේ එකිනෙකට සම්බන්ධ ව තිබුණු බෑවුම් කලාප කපා මාර්ග ඉදිකිරීම සහ ජනාවාස ගොඩනැඟීම. අධික බෑවුම් ප්‍රදේශවල සිදු කරන ඉදිකිරීම්, ස්වාභාවික විපත් ඇතිවීම සඳහා තීරණාත්මක සාධකයක්.

භූමි භාවිතය සම්බන්ධ ව පවතින තවත් ගැටලුවක් ලෙස ස්වාභාවික බිම් හා ස්වාභාවික තෙත් බිම් කලාප ගොඩකිරීම සහ ඒවා ඉදිකිරීම් සඳහා භාවිත කිරීම පෙන්වා දිය හැකියි. බොහෝ ගැටලු නිර්මාණය වී ඇත්තේ මිනිසුන්ගේ භූමි පරිහරණයේ අදූරදර්ශී බව නිසා. ශ්‍රී ලංකාවේ භූමි පරිහරණය පිළිබඳ කතාබහ කිරීමේදී ශ්‍රී ලංකාවට සැලකිය යුතු ආදායමක් ලැබෙන  සංචාරක කර්මාන්තය පිළිබඳ කතාබහ ද මඟ හැරිය නොහැකියි. සංචරණය සඳහා ඇති විභව භූමි තිබෙනවා තව ම කිසිදු ප්‍රයෝජනයක් ලබාගෙන නොමැති.

සැමවිට ම ස්වභාවධර්මයේ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධයක් ඇතිවයි භූමි පරිහරණය සහ ඉඩම් භාවිතය කළ යුත්තේ. නොඑසේනම් භූමි භාවිතය නිසා ඇතිවන ගැටලු මිනිස් ජීවිතවලට, දේපළවලට, පරිසරයට හානිකර ලෙස බලපානවා. ශ්‍රී ලංකාවේ හඳුනාගෙන තිබෙන නාය යෑම් අවදානම් කලාප 14184න් වැඩි ම අවදානමක් ඇති කලාප 230ක් තිබෙනවා. ඉන් 20ක් පාෂාණ පතන කලාප. මේ නිසා බලපෑමට ලක්වූ පවුල් 60000ක් පමණ සිටිනවා. ඉන් 15000ක් ම සිටින්නේ ඉහළ ම අවදානම් සහිත කලාපවල. විභව නාය යෑම් ප්‍රදේශ හඳුනාගෙන තිබෙන බැවින් ඊළඟට සලකා බැලිය යුත්තේ ඒ වෙනුවෙන් අනුගමනය කළ යුතු විකල්ප පිළිබඳ. රක්ෂිත භූමි බවට පත් කළ යුතු එම කලාපවල ඉදිකිරීම් සම්පූර්ණයෙන් ම නතර කළ යුතුයි. අවදානමට ලක් වූ ප්‍රදේශවලින් ජනතාව ඉවත් කළ යුතුයි. ඉන්පසු අවධානය යොමු කළ යුත්තේ නැවත පදිංචි කිරීම සහ සුරක්ෂිත නිවාස සම්බන්ධයෙන්.

භූමිය පරිභෝජනය කිරීමේදී සහ ඉඩම් භාවිත කිරීමේදී නිරන්තරයෙන් ජනතාව දැනුවත් කිරීම සහ ජනතාවගේ සහභාගිත්වය ලබාගැනීම අවශ්‍යයි. විශේෂයෙන් තිරසර කෘෂිකාර්මික පිළිවෙතක් ද අනුගමනය කළ යුතුයි. භූමි පරිභෝජනය සම්බන්ධ සැලසුම් සහ ඊට අදාළ නීතිමය පැතිකඩ වඩා තදින් ක්‍රියාත්මක කිරීමෙන් ඉදිරියේදී මතු විය හැකි බොහෝ විපත් වළකාගත හැකි වනු ඇති.

**කාංචනා සිරිවර්ධන**

# නව චින්තනයකින් සමාජ කතිකාවක්



**සිතුම්ණි රත්නමලල**
වරලත් වාස්තු විද්‍යාඥ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
මොරටුව විශ්වවිද්‍යාලය

භෞතික සංවර්ධනය යනු සංවර්ධනයේ එක් ප්‍රධාන අංශයක්. භෞතික සංවර්ධනය ලෙස අප සමාන්‍යයෙන් අර්ථ දක්වන්නේ ගොඩනැගිලි, මංමාවත්, පාලම්, බෝක්කු ඉදිකරමින් ස්වාභාවික පරිසරයෙන් ඈත් ව ලෝකය මිනිසා විසින් නිර්මාණය කරන ලද්දක් බවට පත් වීමක්. එනම් වඩා හොඳ ජීවිතයක් ලබාගැනීම සඳහා පවතින පරිසරය වෙනස් කරමින් අලුත් පරිසරයක් ගොඩනඟා ගැනීම.

16, 17 වැනි සියවස් වන තුරු මේ භෞතික සංවර්ධනය ලෝකයේ පැවැතියේ අධිවේගී තත්ත්වයක නොවෙයි. එහෙත් කාර්මික විප්ලවය යනාදියෙන් පසු භෞතික සංවර්ධනය ඉතා වේගවත් වුණා. ඒ අනුව මිනිසා ස්වාභාවික පරිසරය වේගයෙන් වෙනස් කරන්න පටන් ගත්තා.

භෞතික සංවර්ධනය සහ පරිභෝජනවාදය සමඟ අද වන විට ලෝකය විශාල අර්බුදයකට මුහුණ දී තිබෙනවා. පරිසරය වෙනස් කරමින්, සම්පත් උරා ගනිමින් අප මේ යන ගමනේ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ලෝකය දිගින් දිගට ම වෙනස් වෙනවා. ග්ලැසියර් දිය වීම, ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම, වායුගෝලය දූෂණය වැනි කාරණා සමඟ මේ භෞතික සංවර්ධනය තවදුරටත් කරගෙන යනවා ද? එසේනම් ඒ කෙසේද? යන ප්‍රශ්නයට අද අපට ගෝලීය වශයෙන් පිළිතුරක් අවශ්‍ය වී තිබෙනවා. ගෝලීය පිළිතුරක් වශයෙන් තිරසර සංවර්ධනය වැනි සංකල්ප ගැන කතා කරන්නේ ඒ අනුව.

මේ ගෝලීය ප්‍රශ්නයේදී රටක් ලෙස තිබෙනවා භෞතික සංවර්ධනය හා ඉදිකිරීම් සම්බන්ධයෙන් අපට ම ආවේණික වූ ප්‍රශ්න. විශේෂයෙන් අප සංවර්ධනය සිදු කරන්නේ නිසි සැලසුමක් ඇති ව ද? දැනුමක් ඇතුව ද? යන කාරණය සම්බන්ධයෙන් වන ප්‍රශ්නය මෙහිදී ප්‍රබලයි.

අධිවේගී භෞතික සංවර්ධනය අද වන විට ලෝකයට ම ගැටලු ඇති කර තිබෙන බව සැබෑවක්. ඇතැම් රටවලට සංවර්ධන ගැටලු මතු කරන්නේ ඔවුන් නිසි සැලසුම් සහ දැනුම භාවිත කරමින් බොහෝ දුර ගිය පසු. එහෙත් රටක් ලෙස අප සංවර්ධන වැඩසටහන්වල මුල සිට ම ගැටලු මතු කරගන්නේ නිසි සැලසුම් සහ දැනුවත්භාවයෙන් තොර ව ක්‍රියාත්මක වීමෙන්.

නිදසුනක් ලෙස කොළඹ නගරය තවත් වැඩි පිරිසකට ජීවත් විය හැකි සුවපහසු තැනක් බවට පත් කරගැනීමේ හැකියාව අවම වී ඇත්තේ අදාළ ඉදිකිරීම්වලදී අප නිසි ලෙස සැලසුම් සකස් කර නොමැති වීම හේතුවෙන්. අප තව ම භාවිත කරන්නේ සුදු ජාතිකයන් සැලසුම් කළ කොළඹ මළ අපවහන පද්ධතිය. එතැනින් පසුව එය අද

දවසට ප්‍රමාණවත් ලෙස සැලසුම් කරගැනීමට තව ම පොහොසත් වී නැහැ. මෙරට දුම්රිය පද්ධතිය සැලසුම් කළේත් සුදු ජාතිකයන්. එය සැලසුම් කළේ ඔවුන්ගේ අවශ්‍යතා අනුව. එදා සැලසුම් කළ දුම්රිය පද්ධතිය ම අදටත් භාවිත කිරීම වෙනුවට අද රටේ අවශ්‍යතාවට ගැළපෙන පරිදි ලාබදායක හා ගුණාත්මක සේවයක් ලබාදිය හැකි අයුරින් එම පද්ධතිය සැලසුම් කරගැනීමට රටක් ලෙස අප තව ම පොහොසත් වී නැහැ.

බොහෝ ගැටලු මතුවන්නේ සැලසුම් නොකොට සිදු කරන සංවර්ධනය හේතුවෙන්. පසුගිය ආපදා තත්ත්වයේදී සිදු වූ ආපදාව ස්වාභාවිකයි. සිදු වූ හානිය ස්වාභාවික නැහැ. එම හානිය 50%කින් අඩු කරගන්නට ඉඩ තිබුණා ජනාවාස ඇති කරගත යුතු සහ නොගත යුතු තැන් ගැන අපට නිශ්චිත සැලසුමක් තිබුණානම්.

සැලසුම් සකසන විට අපට ආධ්‍යාශයක් තිබිය යුතුයි. ආධ්‍යාශය හැම විට ම දේශපාලනිකයි. දේශපාලනයෙනුයි තීරණය කරන්නේ ජන කණ්ඩායමක් හෝ ලෝකයේ සමස්ත ජනතාව හෝ කුමන දේවල් අගය කරගෙන කුමන දිශාවකට ගමන් කළ යුතු ද යන වග. ඒ අනුව දේශපාලනික දැක්මක් ඇතුව ආධ්‍යාශ සකස් කරගෙන, එම ආධ්‍යාශ මත සැලසුම් සකස් කළ යුතුයි. ඉන්පසුව ක්‍රියාත්මක විය යුතුයි.

මේ අනුව බලන විට අප දේශපාලනික වශයෙන් සිටින ආස්ථානය කුමක් ද? කියන කාරණය මත තීරණය වෙනවා භෞතික වශයෙන් කුමන ආකාරයේ පරිසරයක් ද අප සකස් කරගත යුත්තේ යන්න. දිගුකල් පැවතිය හැකි, දිගු කාලයක් තිස්සේ ජීවය පවත්වාගත හැකි දේ සමගයි අපේ සංවර්ධනය සිදු විය යුත්තේ. එහිදී කිසිවකුත් අසාධාරණයට ලක් නොවිය යුතුයි. භෞතික සංවර්ධන සැලසුම්වලදී ස්වාභාවික පරිසරය, සතා සීපාවා, ගහකොළ, ඇළදොළ මේ සියල්ල දෙස ම සාධාරණ ඇසක් යොමු කරන්නට අපට හැකි විය යුතුයි. අපේ භෞතික සංවර්ධනය අත්පත් කරගැනීමේදී පරිසරයේ සජීවී, අජීවී සියලු දෙනාගේ හඬට සවන්දීමේත් ඒ හඬ එකතු කරගැනීමේත් වගකීමක් අපට තිබෙනවා.

මේ හඬ අවදි කරගැනීමේදී පර්යේෂණ ඉතා වැදගත් සාධකයක්. සංවර්ධනයේදී අපට පර්යේෂණ සහ දත්ත අවශ්‍යයි. මේ සමග ඇති වන කථිකාවක් ඇතිවයි රටේ සංවර්ධන සැලසුම් කරා යා යුත්තේ. මෙපමණ කාලයක් මෙහි යම් යම් කොටස් මගහැරී තිබෙනවා. ඒ නිසා ම විවිධ ගැටලු අප ම මතු කරගෙන තිබෙනවා. නිදසුනක් ලෙස කොළඹ යනු වගුරුබිමක්. රැම්සා පද්ධතියක්. අප මේ රැම්සා පද්ධතියේ හඬ නොසලකා හැර ක්‍රියා කිරීමෙන් පොළොවෙ තිබෙන වතුර උරාගැනීමේ ධාරිතාව අවම කරගෙන තිබෙනවා. ඒ හේතුවෙනුයි සුළු වැසි තත්ත්වයකදී පවා කොළඹ ජලයෙන් යට වන්නේ. මෙවැනි අසංවේදී සැලසුම් හේතුවෙන් රටක් ලෙස අපට මුහුණ පාන්නට වී තිබෙන ගැටලු රැසක් තිබෙනවා.

> භෞතික සංවර්ධනය සහ පරිභෝජනවාදය සමඟ අද වන විට ලෝකය විශාල අර්බුදයකට මුහුණ දී තිබෙනවා. පරිසරය වෙනස් කරමින්, සම්පත් උරා ගනිමින් අප මේ යන ගමනේ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ලෝකය දිගින් දිගට ම වෙනස් වෙනවා. ග්ලැසියර් දිය වීම, ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම, වායුගෝලය දූෂණය වැනි කාරණා සමඟ මේ භෞතික සංවර්ධනය තවදුරටත් කරගෙන යනවා ද? එසේනම් ඒ කෙසේද? යන ප්‍රශ්නයට අද අපට ගෝලීය වශයෙන් පිළිතුරක් අවශ්‍ය වී තිබෙනවා. ගෝලීය පිළිතුරක් වශයෙන් තිරසර සංවර්ධනය වැනි සංකල්ප ගැන කතා කරන්නේ ඒ අනුව.

ඒ නිසා ම රටේ සංවර්ධනය සහ ඉදිකිරීම් ගැන කතා කරන විට අප විශේෂයෙන් ම යොමු විය යුතුයි සංවේදී සැලසුම් නිර්මාණයට. ප්‍රශස්ත සංවර්ධන ක්‍රියාදාමයකට යොමු වීමට නම් සිදු වෙනවා සියලු දෙනාගේ අදහස් එකතු කරගනිමින් රටට ගැළපෙන සැලසුම් සකස් කිරීමට.

එවැනි සැලසුම් අනුව තිරසර සංවර්ධනයට ගැළපෙන පරිදි කළ ඉදිකිරීම් සම්බන්ධයෙන් ආදර්ශයට ගත හැකි රටවල් ගැන කතා කරනවානම් භූතානය ඊට කදිම නිදසුනක්. භූතානය වැඩි වශයෙන් උත්සාහ කරන්නේ භෞතික ඉදිකිරීම් අවම කර ගනිමින්, වනාන්තර ප්‍රමාණ වැඩි කර ගනිමින්, සතුටින් සිටින ජනතාවක් වෙනුවෙන් අවශ්‍ය පරිසරයක් නිර්මාණය කරගැනීමට.

රටක් ලෙස අපටත් සිදු වෙනවා ඉදි කිරීම් කුමක් සඳහා ද අවශ්‍ය? ඉදිකිරීම් කරන විට භාවිත කළ හැකි අමුද්‍රව්‍ය මොනවා ද? වඩා ප්‍රශස්ත ලෙස ඉදිකිරීම් සිදු කරන්නේ කෙලෙස ද? වැනි කාරණා පිළිබඳ නිවැරදි තීරණවලට එළඹීමට. ශ්‍රී ලංකාව විශාල ජන ඝනත්වයක් ඇති රටක්. අපේ රටේ භූමි ප්‍රමාණයට සාපේක්ෂ ව රටේ විශාල ජනගහනයක් ජීවත් වෙනවා. එසේනම් අප භූමිය ආරක්ෂා කරගත යුතුයි. මන්ද භූමිය ඇත්තේ හුදෙක් මිනිස් ජනාවාස ඉදිකිරීමට පමණක් නොව කැළෑ වැවීමට, සතුන්ට ජීවත් වීමට, කර්මාන්තවලට, කෘෂිකර්මාන්තයට එය අවශ්‍යයි. එයින් වැඩි ප්‍රමාණයන් නිසි සැලසුම් විරහිත ව ජනාවාස ඉදිකිරීමට පමණක් වැය කළහොත් එයින් සමාජීය, ආර්ථික, පාරිසරික වශයෙන් හානියක් සිදු වනවා.


ඒ නිසා මේ සියලු දේ වෙනුවෙන් රටේ ඉඩම් ඉතුරු කරගෙන, ඉදි කිරීම් සහ සංවර්ධනය කළමනාකරණය කරගැනීමටනම් අපට සිරස් ජනාවාසවලට වැඩි වශයෙන් යොමු වීම, අලුත් සහ වෙනස් අමුද්‍රව්‍ය යොදා ගැනීම, අලුත් ඉදිකිරීම් ක්‍රමවේද යොදා ගැනීම වැනි නව අදහස් අවශ්‍යයි.

ඉදිකිරීම් සම්බන්ධයෙන් නව චින්තනයක් ඇති කරගත යුතු වෙනවා. එය සමාජ කතිකාවක් බවට පත් කරගනිමින්, රටක් ලෙස අපට සැබෑවට ම අවශ්‍ය ඉදිකිරීම් පමණක් නිසි සැලසුම් අනුව සිදු කිරීමෙන් සංවර්ධනය කරා එළඹුම රටේ හෙට දවස වෙනුවෙන් වැදගත් වනු ඇති.

**කාංචනා සිරිවර්ධන**

# තල් පොල් සංවාදය

බිනූ දිලාරා ගමගේ



තල්, පොල් භෝග ආශ්‍රිත ව පර්යේෂණ සහ ව්‍යාපෘති සංවාදයක් අතුරුගිරියේ ජාතික වැවිලි කළමනාකරණය පිළිබඳ ආයතනයේදී (2025 නොවැම්බර් 04) පැවැත්වුණා. මෙහිදී ප්‍රධාන අපේක්ෂාව වූයේ තල්, පොල් වගා ආශ්‍රිත වෘත්තිකයන් හා එම ක්ෂේත්‍රයේ පර්යේෂකයන් අතර පවතින සම්බන්ධීකරණ හිඩැස බොහෝදුරකට අවම කරමින් පර්යේෂණය කර ලබාගත් නව දැනුමින් නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම. ඒ අනුව තල්, පොල් වගා ආශ්‍රිත නිෂ්පාදන වෙළෙඳපොළට ගැළපෙන ලෙස වඩාත් ගුණාත්මක, ඵලදායී හා වටිනාකම් එකතු කළ හැකි නව තාක්ෂණික ක්‍රම හා භාවිතාවන් හඳුන්වා දීමත් ඒ සඳහා ක්ෂේත්‍රයේ පර්යේෂකයන් හා වෘත්තිකයන් ඒකරාශී කිරීමත් සිදු කෙරුණා. මෙය පොල්, තල් වගා ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ අවශ්‍යතා, ඔවුන් මුහුණදෙන දුෂ්කරතා, අනාගත අපේක්ෂා මොනවා ද යන්න පිළිබඳ ව පර්යේෂකයන් දැනුවත් කෙරුණු අවස්ථාවක්.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය රොහාන් ප්‍රනාන්දු පවසන්නේ පෞද්ගලික අංශය පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා සම්බන්ධ කර ගැනීම ප්‍රධාන අරමුණක් බවත් එහෙත් පර්යේෂණයක් ආරම්භ කිරීමට අවශ්‍ය මූල්‍යමය දායකත්වය ඔවුන්ගෙන් අපේක්ෂා කළ නොහැකි නිසා වැවිලි අමාත්‍යාංශය යටතේ අදාළ පර්යේෂණ සිදු කර වාණිජ්‍යමය වටිනාකමක් ලැබෙන මට්ටමකට ගෙන ගියහොත් ඔවුන්ගෙන් වැඩි සහයෝගයක් ලබා ගැනීමට හැකියාව පවතින බවත්.

මේ සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව අදියර හයක් යටතේ ක්‍රියාත්මක වන ක්‍රමවේදයක් අනුගමනය කරනවා. පළමු වැනි අදියරය විදිහට විද්‍යාත්මක පර්යේෂණවලට අදාළ ප්‍රතිපත්ති සකස් කරන අතර මෙහි වඩාත් වැදගත් කොටසක් ඉටු කරන්නේ දෙවැනි අදියරේදී. ඒ, ජාතික අවශ්‍යතාවලට මුල් තැන දී ඊට සමගාමී ව වැඩි අවධානයක් යොමු කළ යුතු පර්යේෂණ ක්ෂේත්‍ර මොනවාද යන්න හඳුනා ගැනීම. රජය වෙන් කර තිබෙන අරමුදල් ලබා දීම සිදු වන්නේ එලෙසින් හඳුනා ගන්නා ක්ෂේත්‍රවලට අදාළ ව සිදු කරන පර්යේෂණ සඳහා පමණක් බවයි සභාපති මහාචාර්ය රොහාන් ප්‍රනාන්දු අවධාරණය කරන්නේ. ඒ, තුන් වැනි අදියරය විදිහට. මෙහි හතර වැනි අදියර වන්නේ අරමුදල් වෙන් කරන ලද පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා සම්පත් සපුරා දීම හා ඒවාට සමීප විය හැකි ආකාර පිළිබඳ මාර්ගෝපදේශන ලබා දීම. පර්යේෂණ සඳහා ව්‍යවසායකයන් සම්බන්ධ කර ගැනීම සිදු වන්නේ මේ වැඩපිළිවෙළේ පස් වැනි අදියරයට අදාළ ව. අදහස් දක්වන සභාපති මහාචාර්ය රොහාන් ප්‍රනාන්දු; "මේ පර්යේෂණ නිමැවුම් සියල්ල වෙළෙඳපොළ කරා ගෙන යන බවට සහතික වෙන්න බැහැ. එහෙත් වාණිජ්‍යමය වටිනාකම් නිර්මාණය කළ හැකි පර්යේෂණ ප්‍රතිඵල මෙහිදී ව්‍යවසායකයන් අතට පත් කෙරෙනවා. දැනට මෙය ක්‍රියාත්මක වන්නේ ජනාධිපති කාර්යාලය යටතේ 'National Initiative Research & Development Commercialisation (NIRDC)' ඒකකයෙන්. 2025 අය වැයෙන් මේ සඳහා රුපියල් බිලියනයක මුදලක් වෙන් කෙරුණා. හය වැනි අදියරේදී සිදු වන්නේ මේ පර්යේෂණ නිමැවුම් සමාජගත කිරීම මෙහෙයවීම."

පර්යේෂණ සංවාදයේදී පොල් හා තල් වගා ආශ්‍රිත නිමැවුම්වල ඇති වෙළෙඳපොළ වටිනාකම් පිළිබඳ දැනුවත්

පොල් සැකසුම් අංශයේ මැදිහත්වීමෙන් තවත් නිෂ්පාදන හා සොයා ගැනීම් රැසක් හඳුන්වා දුන්නා. ඒ අතර විජලනය කරන ලද පොල් මද භාවිතයෙන් පොල් බටර් ස්ප්‍රෙඩ් නිෂ්පාදනය නිර්මාංශ ආහාර පරිභෝජනය කරන්නන්ට වඩාත් ගැළපෙන්නක්. ඉහළ අගයක පවතින ගෘහස්ථ පොල් කිරි පරිභෝජනය නිසා පොල් අපතේ යාම අවම කිරීමට නැවුම් ක්‍රීම් කළ පොල් නිෂ්පාදනයක් ඉදිරිපත් කෙරුණා. මෙය ඉතා පහසුවෙන් නිෂ්පාදනය කළ හැකි වන අතර භාවිතයට සූදානම් උකු පොල් කිරි නිෂ්පාදනයක් ලෙස වෙළෙඳපොළට නිකුත් කිරීමට පුළුවන්.

කිරීමට වැඩි අවධානයක් යොමු වුණා. කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ අංශයෙන් පොල් තෙල් දේශීය වෙළෙඳපොළට නිකුත් කිරීමේදී ආහාර සුක්ෂිතතාව සහතික කරන ලද ඇසුරුම්කරණයක් හා ලේබල් කිරීමක් සඳහා පාරිභෝගිකයන්ගෙන් මුදලක් අය කිරීම සම්බන්ධයෙන් දක්වන කැමැත්ත ඇස්තමේන්තුගත කර තිබෙනවා. එහිදී අවධානයට යොමු වී ඇත්තේ පාරිභෝගික දැනුවත්භාවය හා සුරක්ෂිතභාවය වැඩි කිරීම, විශ්වාසය හා විනිවිදභාවය වැඩිදියුණු කිරීම, සෞඛ්‍ය හා ආසාත්මිකතා දැනුවත් කිරීම, සංස්කෘතික හා සංවේදීතාව වැඩි කිරීම වැනි සමාජීය වැදගත්කම් ගණනාවක් පිළිබඳ ව. ඇසුරුම්කරණයේදී පරිසර හිතකාමී ද්‍රව්‍ය භාවිත කිරීමේ අවශ්‍යතාවත් අවධානයට ලක් වුණා. ප්‍රවේණි හා ශාක අභිජනන අංශය CRISL2020 යනුවෙන් මලයානු රතු කුන්දිරා සහ ශ්‍රී ලංකා උස වර්ගය සමඟ දෙමුහුන්කරණය කර නව දෙමුහුන් පොල් ප්‍රභේදයක් හඳුන්වා දී තිබෙනවා. එම ප්‍රභේදය වසර 3-4 අතර කාලයකදී පීදුණු පසුව වසරකට එක් ගසකින් ලබා ගත හැකියි ගෙඩි 190ක අස්වැන්නක්.

ශෂ්‍ය විද්‍යා අංශය තැඹිලි කෝම්බ භාවිතයෙන් ඵලදායී ලෙස ජීව අඟුරු නිපදවීම සඳහා ද්විත්ව කුටීර තාප විච්ඡේදකයක් නිර්මාණය කර තිබෙනවා. මෙහි විශේෂත්වය වන්නේ තැඹිලි කෝම්බ අමුද්‍රව්‍යක් ලෙස මෙන් ම දහන ඉන්ධනයක් ලෙස ද භාවිත කළ හැකි වීම. වෙළෙඳපොළේ ඇති නොනනෝල් අඩංගු ෆෙරමෝන් නිෂ්පාදන වෙනුවට නැනෝ

තල් සංවර්ධන මණ්ඩලයේ තල් පර්යේෂණ ආයතනය සුදු සීනි භාවිතයෙන් සකසන කැස්ස පැණි බෙහෙත්වලට වඩා ඖෂධීය ගුණයෙන් අනූන තල් ආශ්‍රිත ව සැකසිය හැකි කැස්ස පැණියක් හඳුන්වා දී තිබෙනවා. කැස්ස සමනයට අමතර ව මේ ඖෂධීය පානයේ ශරීරයට වැදගත් කැල්සියම්, මැග්නීසියම්, පොටෑසියම්, පොස්පරස් සහ අයන වැනි ඛණිජ ලවණ කිහිපයක් ම අඩංගු වන අතර නිෂ්පාදනය කිරීමෙන් පසු වසරක කාලයක් කල් තබා ගැනීමේ හැකියාව තිබීම මෙහි විශේෂත්වයක්.

ඩිස්පෙන්සරයක් උපයෝගී කරගෙන නව ජෙල් වර්ගයේ ෆෙරමෝනයක් නිෂ්පාදනය කර තිබෙනවා. මෙමඟින් පොල් ඵලදාවට සිදුවන කුරුමිණියන්ගේ හානිය වළක්වා පොල් අස්වැන්න වැඩි කරගත හැකියි. පොල් අස්වැන්න වැඩි කර ගැනීමෙන් දේශීය වෙළෙඳපොළේ පොල් මිල අඩු කර ගැනීමටත් කර්මාන්ත සඳහා ගුණාත්මක පොල් සැපයීමටත් හැකියාව ලැබෙන අතර කාබනික පොල් වගාව සඳහා කාබනික පොටෑසියම් ප්‍රභවයක් ලෙස අඩු මිලට තැඹිලි කෝම්බ අළු භාවිත කළ හැකි බව පාංශු හා ශාක පෝෂක අංශය පෙන්වා දෙනවා.

පොල් සැකසුම් අංශයේ මැදිහත්වීමෙන් තවත් නිෂ්පාදන හා සොයා ගැනීම් රැසක් හඳුන්වා දුන්නා. ඒ අතර විජලනය කරන ලද පොල් මද භාවිතයෙන් පොල් බටර් ස්ප්‍රෙඩ් නිෂ්පාදනය නිර්මාංශ ආහාර පරිභෝජනය කරන්නන්ට වඩාත් ගැළපෙන්නක්. ඉහළ අගයක පවතින ගෘහස්ථ පොල් කිරි පරිභෝජනය නිසා පොල් අපතේ යාම අවම කිරීමට නැවුම් ක්‍රීම් කළ පොල් නිෂ්පාදනයක් ඉදිරිපත් කෙරුණා. මෙය ඉතා පහසුවෙන් නිෂ්පාදනය කළ හැකි වන අතර භාවිතයට සූදානම් උකු පොල් කිරි නිෂ්පාදනයක් ලෙස වෙළෙඳපොළට නිකුත් කිරීමට පුළුවන්. මේදය අඩු පොල් කිරි භාවිතයෙන් නිර්මාංශ චීස්, කිරි පානයක් හා පොල් කිරි පිටි, පොල් මද කුරුටු තෙල් සහ පොල් මද කුරුටු පිටි භාවිත කර ආහාර වර්ග නිෂ්පාදනය කර තිබෙන බවත් පර්යේෂණ සංවාදයේදී අනාවරණය වුණා.



තල් සංවර්ධන මණ්ඩලයේ තල් පර්යේෂණ ආයතනය සුදු සීනි භාවිතයෙන් සකසන කැස්ස පැණි බෙහෙත්වලට වඩා ඖෂධීය ගුණයෙන් අනූන තල් ආශ්‍රිත ව සැකසිය හැකි කැස්ස පැණියක් හඳුන්වා දී තිබෙනවා. කැස්ස සමනයට අමතර ව මේ ඖෂධීය පානයේ ශරීරයට වැදගත් කැල්සියම්, මැග්නීසියම්, පොටෑසියම්, පොස්පරස් සහ අයන වැනි ඛණිජ ලවණ කිහිපයක් ම අඩංගු වන අතර නිෂ්පාදනය කිරීමෙන් පසු වසරක කාලයක් කල් තබා ගැනීමේ හැකියාව තිබීම මෙහි විශේෂත්වයක්. තල් කිරිවල පෝෂණ ගුණය ආරක්ෂා වන පරිදි පිටි බවට පත් කිරීමෙන් හා අයිස් ක්‍රීම් වැනි තල් කිරි ආශ්‍රිත ව අගය එකතු කළ හැකි වෙනත් නිෂ්පාදන පිළිබඳවත් මෙහිදී අවධානය යොමු කෙරුණා. හකුරු හා බේකරි ආහාර සඳහා භාවිත කරන වියළි පලතුරු කැබලි සකස් කිරීමටත් සුදු සීනි වෙනුවට ගුණාත්මක තල් ආශ්‍රිත පැණිරසකාරක යොදාගත හැකි බවත් පර්යේෂණවලින් හෙළි වූ කරුණු.



# බය <sup></sup>නැති / ඇති කරන ඇන්ටිබයෝටික්

# Antibiotics

**නුවන් කුමාර කටුගම්පල**

ඇතැම් බැක්ටීරියා ආසාදනවලට ප්‍රතිකාර කිරීමට (වැළැක්වීමට, පාලනයට) භාවිත කරන ප්‍රතිජීවක ඖෂධ (Antibiotics) පිළිබඳ අප දන්නා තරම ප්‍රමාණවත් ද? බැක්ටීරියා විනාශ කිරීමට හෝ ඒවා පැතිරීම වැළැක්වීමට හෝ සමත් මේ ඔසු ගැන මහජනයා දැනුවත් කිරීමේ වැඩමුළුවක්, පා ගමනක් සහ සතියක වැඩසටහන් මාලාවක් 'ලෝක ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාව' මැයෙන් 2025 නොවැම්බර් 18-24 දක්වා සතියක් අංගොඩ මානසික රෝග විද්‍යායතනය සංවිධාන කර තිබුණා.

ප්‍රතිජීවක ඖෂධ යනු බැක්ටීරියාවලට එරෙහි ව ක්‍රියාකාරී වන ප්‍රති-ක්ෂුද්‍රජීවී ද්‍රව්‍යයක් (Antimicrobial Substance). ඒවා බැක්ටීරියා ආසාදනවලට එරෙහි ව සටන් කරන නිසා එවැනි ආසාදනවලට ප්‍රතිකාර කිරීමේදී බහුල ව භාවිත වනවා. එවැනි ප්‍රතිජීවක වර්ග කිහිපයක් වන්නේ ෆීනොක්සිමීතයිල්පෙනිසිලින් (Phenoymethylpenicillin), ඩයික්ලොක්සැසිලින් (Dicloacillin), ක්ලවුලානික් අම්ලය සහිත ඇමොක්සිලින් (Amoicillin with Clavulanic Acid), ඇම්පිසිලින් (Ampicillin), නැෆ්සිලින් (Nafcillin), ඔක්සැසිලින් (Oacillin), පෙනිසිලින් වී (Penicillin V), පෙනිසිලින් ජී (Penicillin G) යනාදිය. සාමාන්‍ය භාවිතයේදී, ප්‍රතිජීවක යනු ස්වාභාවික ව එක් ක්ෂුද්‍ර ජීවියකු තවත් ක්ෂුද්‍ර ජීවියකු සමග සටන් කිරීමෙන් නිපදවෙන්නක්. ප්‍රතිජීවක නොවන ප්‍රතිබැක්ටීරියා වර්ග නිපදවන්නේ සම්පූර්ණයෙන් ම කෘත්‍රිම ව. මේ කාණ්ඩ දෙක ම ක්ෂුද්‍ර ජීවීන් මරා දැමීමේදී හෝ වර්ධනය වීම වැළැක්වීමේදී හෝ එක ම බලපෑමක් ඇති කරනවා. මේ දෙවර්ගය ම ක්ෂුද්‍ර ජීවී රසායනික චිකිත්සාවට (Antimicrobial Chemotherapy) ඇතුළත්. 'ප්‍රතිබැක්ටීරියා' යන්නට බැක්ටීරියා නාශක, බැක්ටීරියා ස්ථිතික, ප්‍රතිබැක්ටීරියා සබන් සහ රසායනික විෂබීජ නාශක ද ඇතුළත්. පශු සම්පත් ආහාරවල (Livestock feed) භාවිත කරන ප්‍රතිබැක්ටීරියා විශේෂ (ප්‍රතිජීවක ඖෂධ) ද මේ ගණයට ඇතුළත්.

## අනවශ්‍ය (අනිසි) භාවිතය

Paul L. Marinoගේ The ICU Bookහි නිර්දේශ අනුව 'ප්‍රතිජීවක ඖෂධවල පළමු රීතිය වන්නේ ඒවා භාවිත නොකිරීමට උත්සාහ කිරීම. දෙවැනි රීතිය වන්නේ ඒවායින් බොහොමයක් භාවිත නොකිරීමට උත්සාහ කිරීම.' නුසුදුසු ප්‍රතිජීවක ප්‍රතිකාර සහ ප්‍රතිජීවක අධික ලෙස භාවිතය 'ප්‍රතිජීවක-ප්‍රතිරෝධී බැක්ටීරියා' මතුවීමට හේතු වන බව ද එයින් පෙන්වා දෙන්නක්. එබඳු තත්ත්ව මතු වූ රෝගීන් දැඩි සත්කාර ඒකකවල බරපතළ තත්ත්වයට පත් වනවා. ඊට ප්‍රමුඛ ව බලපාන ප්‍රතිජීවක ස්වයං-නිර්දේශ කිරීම (Self-Prescribing of Antibiotics) ප්‍රබල අනිසි භාවිතයක්. ප්‍රතිජීවකවලට ප්‍රතිචාර නොදක්වන හෝ ප්‍රතිකාර නිශ්චය කර ගත නොහැකි හෝ රෝගවලට අනුමානයෙන් ප්‍රතිජීවක ඖෂධ නියම කිරීමත් ඇතැම් බැක්ටීරියා ආසාදන සඳහා වැරදි හෝ උපප්‍රශස්ත ප්‍රතිජීවක නියම කිරීමත් නිසා ද බැක්ටීරියා ප්‍රතිරෝධීතාව වර්ධනය වනවා.

දැන හැඳුනුම්කම, රෝගියාගේ බර, පෙර භාවිතයේ දත්ත වැනි පදනම් විරහිත කරුණු මත ඇතැම් වගකීම් විරහිත වෛද්‍ය වෘත්තිකයන් ප්‍රතිජීවක වැරදි මාත්‍රා (Incorrect Dosage) නියම කිරීම ද භයානක, අනිසි භාවිතයක්. අනිසි භාවිතයේ අනෙකුත් ආකාර අතරට ප්‍රතිජීවකයේ සම්පූර්ණ මාත්‍රාව ගැනීමට අපොහොසත් වීම, ප්‍රතිජීවකය ලබා ගැනීමෙන් පසු සහනය ලැබෙන තුරු ප්‍රමාණවත් විවේකය ලබා නොගැනීම, වෛද්‍යවරුන් සහ රෝගීන් යන දෙපාර්ශ්වය ම ඉලක්ක කරගත් දැනුවත් කිරීම් සහ මැදිහත්වීම් සිදු නොවීම, වේගවත් සහ නිසි රෝග නිශ්චය පරීක්ෂණ (Medical Tests) සිදු නොකර ප්‍රතිජීවක ඔසු නියම කිරීම, ප්‍රමාණවත් තරම් ප්‍රතිජීවක නොමැති වීම නිසා අවම ප්‍රමාණයක් ලබා දීම ද අයත්.

ප්‍රතිජීවක අනිසි භාවිතයේ ප්‍රතිඵල පිළිබඳ බොහෝ විට සමාජයේ පවතින්නේ අඩු දැනුවත්භාවයක්. හිතුමතයේ ප්‍රතිජීවක පාවිච්චි කරමින් කල් මරා අවසාන මොහොතේ මරණාසන්න වූ විට බොහෝ දෙනෙකු රෝහල්ගත වනවා. ඒ අය මිය යන්නේ හෘදයාබාධයක්, සුව නොවන තුවාලයකින් විෂබීජ ශරීරගත වීමක්, පෙනහලු ආසාදනයක් වැනි රෝග තත්ත්වයක් මත විනා කලක් තිස්සේ ප්‍රතිජීවක අනිසි භාවිතය නිසා එතෙක් පැවැති රෝග යටපත් ව තිබී උත්සන්න වීම හේතුවෙන් බව වාර්තා වන්නේ නැහැ. කාලවේලාව නැතිකම හෝ උනන්දුවක්



නැතිකම හෝ ආර්ථික අපහසුතා නිසා හෝ සමාජ මාධ්‍ය පෝස්ටු පිළිගැනීම නිසා හෝ පූර්ව අත්දැකීම් මත හෝ වෛද්‍යවරයකු හමු නොවී ප්‍රතිජීවක භාවිත කිරීම සුලබ ව දකිය හැකියි. ඒ නිසා රෝගයට අදාළ බැක්ටීරියා විනාශ නොවී අභ්‍යන්තරයේ සැඟවී වර්ධනය වීමෙන් එම බැක්ටීරියා ප්‍රතිජීවක ඔසුවලට ඔරොත්තු දීමේ හැකියාව සහ ප්‍රතිරෝධීතාව ලබා ගන්නවා. හිතුවක්කාරී ලෙස බෙහෙත් පාවිච්චි කරමින් වේදනාව ඉවසා දරාගෙන සිට අවසානයේ සුව කළ නොහැකි අවස්ථාවට පැමිණීම ප්‍රතිජීවක අනිසි භාවිතයේ ප්‍රතිඵලයක්. පවුලේ වෙනත් අයෙකුට වැලඳුණු රෝගයකට ගෙනා ප්‍රතිජීවක ඔසු එම රෝගය ම තවත් අයෙකුට වැලඳුණු විට ලබා දීම, කිසියම් රෝගයකට නියම කළ ප්‍රතිජීවක ඔසු රෝගියාගේ වේදනාව අඩු වූ විට භාවිතය නවතා තබාගෙන සිට පසු කලෙක එබඳු රෝග ලක්ෂණ මතු වුවහොත් නැවත පාවිච්චි කිරීම, නිර්දේශිත මාත්‍රාවට අඩුවෙන් හෝ වැඩියෙන් හෝ පාවිච්චි කිරීම යනාදිය නිසා විවිධ ආසාදන සහ සංකූලතා ඇති වීම තවත් එවැනි අවස්ථා. නිර්දේශ කළ දින ගණනත් පැය ගණනත් ප්‍රමාණයත් නොසලකා ප්‍රතිජීවක පාවිච්චි කිරීමෙන් වන්නේ බැක්ටීරියා මර්දනය හෝ පාලනය හෝ නොවී යටපත් ව තිබී නැවත වඩාත් ප්‍රබල ව මතු වීම. ප්‍රතිජීවක ඔසු අවශ්‍ය නොවන එහෙත් ඒ සමාන රෝග ලක්ෂණ සහිත වෙනත් රෝගවලට ප්‍රතිජීවක ඔසු ලබා දීමත් පුද්ගලයකුට ලබා දෙන ප්‍රතිජීවක ඖෂධ සතුන්ට හෝ සතුන්ට ලබා දෙන ප්‍රතිජීවක ඖෂධ පුද්ගලයන්ට හෝ රෝග ලක්ෂණ සමාන වන අවස්ථාවලදී ලබා දීමත් සිදු වන වැරදි භාවිතයක්.

### අතුරු ආබාධ සහ හානි

සායනික භාවිතය සඳහා අනුමැතිය ලබා දීමට පෙර ප්‍රතිජීවක ඖෂධවල ආරක්ෂිත බව සහ රෝගියාට හොඳින් ඔරොත්තු දෙන බව පරීක්ෂාවට ලක් කරනවා. එහෙත් ඇතැම් ප්‍රතිජීවක වර්ග ඉලක්කගත ක්ෂුද්‍ර ජීවීන්ගේ සහ රෝගියාගේ දරාගැනීමේ හැකියාව අනුව අධි සංවේදී (Hypersensitive) මට්ටමේ සිට ආසාත්මික (Allergy) මට්ටම දක්වා පුළුල් පරාසයක අහිතකර අතුරු ආබාධ (Bad Side Effects) ඇති කළ හැකියි.

ඇතැම් ප්‍රතිජීවකවලින් ඇති වන අතුරු ආබාධ අතර ප්‍රතිජීවක ආශ්‍රිත පාචනය (Diarrhea), බඩවැල් ආශ්‍රිත ආබාධ (Intestinal Flora), මෛත්‍ර ලිංගික පද්ධති (යෝනි මාර්ග) ආශ්‍රිත යීස්ට් විශේෂවල අධික වර්ධනය (Vaginal Flora), අස්ථි කණ්ඩරාවල හානි (Tendon Damage) යනාදිය වනවා. ඇතැම් ප්‍රතිජීවකවලට මිනිස් සෛල තුළ ඔක්සිකාරක ආතතිය (Oidative Stress) ඇති කිරීමේ හැකියාව ද පවතිනවා. ප්‍රතිජීවක දුර්භාවිතයෙන් ඖෂධ විෂ වීම, වකුගඩු හානි, අක්මා හානි, ප්‍රතිරෝධී ජීවී ආසාදන ද ඇතිවනවා. ප්‍රතිශක්තිකරණ සෛලවල ජෛව ශක්තිජනක අඩපණ කරන්නටත් සමේ ක්ෂුද්‍රජීවක වෙනස් කිරීම වැනි රෝග වැලඳෙන්නටත් ප්‍රතිජීවක දුර්භාවිතය හේතු වන්නට පුළුවන්.

**Paul L. Marinoගේ The ICU Bookහි නිර්දේශ අනුව 'ප්‍රතිජීවක ඖෂධවල පළමු රීතිය වන්නේ ඒවා භාවිත නොකිරීමට උත්සාහ කිරීම. දෙවැනි රීතිය වන්නේ ඒවායින් බොහොමයක් භාවිත නොකිරීමට උත්සාහ කිරීම.' නුසුදුසු ප්‍රතිජීවක ප්‍රතිකාර සහ ප්‍රතිජීවක අධික ලෙස භාවිතය 'ප්‍රතිජීවක-ප්‍රතිරෝධී බැක්ටීරියා' මතුවීමට හේතු වන බව ද එයින් පෙන්වා දෙන්නක්. එබඳු තත්ත්ව මතු වූ රෝගීන් දැඩි සත්කාර ඒකකවල බරපතළ තත්ත්වයට පත් වනවා.**

සාමාන්‍ය සරල රෝගවලට ප්‍රතිකාර වශයෙන් ලබා දෙන ප්‍රතිජීවකවල කාර්යක්ෂමතාව සහ අවශ්‍යතාව පිළිබඳ පොදු වැරදි වැටහීම් ඒවායේ අධික භාවිතයට දායක වන බව අධ්‍යයනවලින් පෙනී ගිය කරුණක්.

බැක්ටීරියා ආසාදන සහිත රෝගීන්ට ප්‍රතිජීවක නිවැරදි භාවිතය පැහැදිලි ව ම ජීවිතාරක්ෂකයක්. ආසාදනවල තත්ත්වය හඳුනා නොගෙන එම ඖෂධ වැරදි භාවිතයෙන් සිදු වන්නේ ජීවිත හානි. සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ බහුල ව භාවිත වන ප්‍රතිජීවක ඖෂධ ලබා දුන් ගොවිපොළ සතුන්ගේ මස්, කිරි සහ බිත්තර පරිභෝජනයෙන් ද ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාව ඇතිවිය හැකියි. ඒවා වෙළෙඳපොළට ඒමට ඇති ඉඩකඩ ඇහිරීමත් වෙළෙඳපොළට පැමිණි නිෂ්පාදන ඉවත් කිරීමත් පාරිභෝගිකයා මිල දී ගත් නිෂ්පාදන පරිභෝජනය කිරීම වැළැක්වීමත් තවත් ගැටලු. මේ සම්බන්ධයෙන් පනවන ලද රෙගුලාසි උල්ලංඝනය කළ අවස්ථාවල පශු සම්පත් තහනම් කරමින් නඩු තීන්දු ලබා දීමට සිදුවීම දක්වා දුර ගිය අවස්ථා විවිධ රටවලින් වාර්තා වනවා.

### අනවශ්‍ය (අනිසි) භාවිතය තුරන් කිරීම

ප්‍රතිජීවක ඖෂධ අනවශ්‍ය භාවිතය, දුර්භාවිතය, අවභාවිතය, අනිසි භාවිතය, අවම භාවිතය සහ අධික භාවිතය යන කවරාකාරයකින් හැඳින්වුවත් මේ වැරදි භාවිත පිළිබඳ ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා වන ක්‍රියාකාරී බලපෑම් සහගත







රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන තිබෙනවා. ඒ හේතුවෙන් එක්සත් ජනපදය ඇතුළු බොහෝ රටවල ප්‍රතිජීවක භාවිතය මෙන් ම බෙහෙත් වට්ටෝරු නියම කිරීමත් සැලකිය යුතු ලෙස නිවැරදි වී තිබෙනවා. එබඳු රටවල මෙන් ම ශ්‍රී ලංකාවේත් මේ තත්ත්වයට නිසි ක්‍රියාමාර්ග ගැනීමට රජය ගන්නා පියවරවල තවත් අවස්ථාවක් මේ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව.

රෝහල් අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය දම්මික අලහප්පෙරුම පැවසුවේ ශ්‍රී ලංකාව ප්‍රතිජීවක වැරදි භාවිතයේ ඉහළින් ම සිටින රටක් බව. සුව නොවන තුවාල, ශ්වසනාබාධ යනාදී රෝග සම්බන්ධ කාරණාවලදී මේ තත්ත්වය දැඩි ව බලපා තිබෙනවා. අදහස් දක්වන ඔහු: "අනවශ්‍ය ලෙස ප්‍රතිජීවක ඖෂධ භාවිත නොකළ යුතු බව රෝගියාත් ප්‍රතිජීවක ලබා දිය යුත්තේ අත්‍යවශ්‍ය ම නම් පමණක් ය යන්න වෛද්‍ය කාර්යමණ්ඩලත් විශේෂයෙන් දැනුවත් කළ යුතුයි. රෝග නිශ්චය තුණ්ඩුව (Diagnostic Card) හෝ සායන පත්‍රිකාව (Clinic Card) හෝ වෛද්‍ය නිර්දේශ තුණ්ඩුව (Medical Prescription) නොමැති ව ඔසුසලවලින් ප්‍රතිජීවක නිකුත් නොකළ යුතුයි. ඖෂධ නිකුත් කිරීමේදී යාවත්කාලීන නොවූ තුණ්ඩු සහ පත්‍රිකා ප්‍රතික්ෂේප කිරීම, වෛද්‍යවරයාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම, නියම කර ඇති මාත්‍රාවේ වැරදි නිවැරදිභාවය ප්‍රත්‍යක්ෂ කර ගැනීම ද සිදු විය යුතුයි."

කායික රෝග විශේෂඥ වෛද්‍ය මහාචාර්ය සුජිත සෙනෙවිරත්න පවසන්නේ 'ප්‍රතිජීවක ඖෂධ ලබා ගත් පමණින් රෝග සුව වනවා' යනුවෙන් සමාජගත වී ඇති දුර්මතය සමාජයෙන් තුරන් කළ යුතු බව. මේ නිසා බැක්ටීරියා මර්දනයටත් ආසාදන පාලනයටත් ගන්නා ඖෂධ සහ රෝග සුවපත් කිරීමට ගන්නා ඖෂධ අතර වෙනස මහජනතාව දැනගැනීමත් වැදගත්.


"ලෝකයේ මේ වන විට විවිධ රෝග පාලනය සඳහා නිෂ්පාදනය කරන බොහෝ ඖෂධවලට ක්ෂුද්‍රජීවීන් ප්‍රතිරෝධය ඇතිකරගෙන අවසන්. ඒ සඳහා අධි භාවිතාව මූලික ව බලපා තිබෙනවා. එහෙත් අධි ප්‍රමාණවලින් ප්‍රතිජීවක ඔසුවලට පවතින ඉල්ලුම සපුරාලීමට තරම් ප්‍රමාණවත් ප්‍රතිජීවක ඖෂධ නිෂ්පාදනයක් ලෝකයේ සිදු වන්නේ නැහැ. ප්‍රතිරෝධතා සහිත ක්ෂුද්‍රජීවීන් පාලනය කළ හැකි නව ඖෂධ නිපදවීමට, පර්යේෂණ සිදුකිරීමට ලොව මහා පරිමාණ පරීක්ෂණාගාරවල ඉඩකඩ ප්‍රමාණවත් නැහැ. ඒ නිසා වැරදි භාවිත ඉවත්කොට ප්‍රතිජීවක ඖෂධ නිවැරදි භාවිතය සමාජයට හුරු කරවීම යුගයේ කාර්යභාරයක්. 'ලෝක ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාව' මැයෙන් වූ මේ පාගමන සහ වැඩසටහන් පෙළගැස්ම ඒ කාර්යාවලියේ එක් පියවරක්." ක්ෂුද්‍රජීව විද්‍යා විශේෂඥ වෛද්‍ය මාලිකා කරුණාරත්න පැවසුවේ එලෙස.

මිනිස් ශරීරයේ ජීවත් වන හිතකර ක්ෂුද්‍රජීවී බැක්ටීරියා පවා ප්‍රතිජීවක ඖෂධවලට ප්‍රතිරෝධීතා ඇති කර ගන්නේ යම් කාලයක් වෛද්‍ය නිර්දේශයට නොගැළපෙන ලෙස




අඩුවෙන් හෝ වැඩියෙන් හෝ කාල විරාම නොසලකා හෝ ප්‍රතිජීවක ලබා ගන්නා විට. එනම් වැරදි භාවිතය නිසා. මේ ඔසුවලට අක්‍රමවත් ව නිරාවරණය වන ක්ෂුද්‍රජීවීන් ඊට අනුගතවන ලෙස සිය ජාන වෙනස් කර ගැනීමයි සිදුවන්නේ. එවිට නියමිත ප්‍රතිජීවක මාත්‍රාව රෝගියාට ලබා දීමෙන් අපේක්ෂිත රෝග පාලනය සිදු වන්නේ නැහැ. ඒ, ආසාදනයට එරෙහි ව ක්‍රියාත්මක වීම සඳහා ශරීරයට හිතකර ක්ෂුද්‍රජීවියාට තිබූ බලය සහ ප්‍රතිරෝධය නිපදවා ගැනීමෙන් පසු අහිමි වන නිසා. මේ අභියෝගයට එරෙහි ව නිසි ක්‍රියාත්මක වීමක් සිදු නොවුණහොත් වසර 2050 පමණ වන විට ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාව හේතුවෙන් වසරකට මිය යන සංඛ්‍යාව මිලියන 10ක් පමණ දක්වා ඉහළ යා හැකි බව නවතම ලෝක දත්ත අනුව පෙනී යනවා. මෙය ලෝකයට නුදුරු අනාගතයේදී මුහුණ දෙන්නට සිදුවන 'නිහඬ වසංගතයක් (Silence Pandemic) වේවි. එනම්, පුද්ගල මරණවලට බලපාන රෝග වැලඳීමට හේතුව ප්‍රතිජීවක වැරදි භාවිතය බව රහසක් ලෙස පැවතියදී ම දැනට පවත්නා තත්ත්වය වර්ධනය වන්නට පුළුවන්. මේ තත්ත්වය වාර්තාවලට ඇතුළත් නොවී එනම්, සැඟවුණු ප්‍රතිරෝධයක් (Silence Resistance) ලෙස පැවතිය හැකියි. මේ නිසා තේරුම් ගත යුත්තේ ප්‍රතිජීවක වැරදි භාවිතය 'මරණයට අත වැනීමක්' වන අතර එහි අවසන් ප්‍රතිඵලය 'මරණය' බව.






# සියවස සපුරන දේශීය සිනමාව

## 1925-2025

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**ප්‍රියන්ත ෆොන්සේකා**

කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස මහත් වේගයකින් නැගී ආ යාන්ත්‍රික උපකරණ ලෝකය ඉතා කෙටි කලකින් කැඳවාගෙන ගියේ නව යුගයක් වෙත. නාට්‍ය කලාව, සංගීතය, චිත්‍ර කලාව, නර්තනය ඈ කලාවන් අතරට කාර්මික මැදිහත්වීම් පදනම් ව නැගී ආ ඡායාරූප කලාව, සිනමා කලාව යනාදිය ද එක් වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙන්. 19 වැනි සියවස, මේ නව කලා මාධ්‍යයන්ගේ මූලාරම්භය සනිටුහන් කළ සියවස වූ අතර තිරයක් මතට පළමු වරට චලන චිත්‍රයක් පතිත කෙරුණේ සියවසෙහි අවසාන දශකයෙහිදී. ඒ, 1895 දෙසැම්බර් 28 දින පැරිසියේ ග්‍රාන්ද් කැෆෙහිදී ලුමියේ සහෝදරවරුන්ගේ චලන චිත්‍ර එකතුවක් ප්‍රදර්ශනය කිරීමත් සමඟ.


මේ නව තාක්ෂණික පෙරළිය, 'මැජික්' පන්නයේ එළඹුමක් ලෙස පළමු වසර කිහිපයේ ඉතා ඉක්මනින් ලොව පැතිරුණු එහි පැවති කතන්දර කීමේ හැකියාව, කලාත්මක එළඹුම් ආදිය හඳුනා ගැනීමට මිනිසාට එපමණ කලක් ගත වූයේ නැහැ. 20 වැනි සියවසෙහි පළමු දශකයේ ආඛ්‍යානමය චලන චිත්‍ර සමගින් ද දෙවැනි දශකයේ වඩාත් කලාත්මක ප්‍රකාශනයන් සමගින් ද චලන චිත්‍රය, සිනමාව බවට පරිවර්තනය වී ගොඩනැගුණා.


යුරෝපය හා ඇමරිකාව ආශ්‍රිත ව නැගුණක් වුව මේ නව කලා ස්වරූපය ලෝකයේ සෙසු කලාපවලට පැතිර යෑමට වැඩිකලක් ගත වූයේ නැහැ. දේශීය සිනමාවක පළමු සලකුණ හමුවන්නේ 1925 වර්ෂයේදී. ඒ සමාරම්භක සනිටුහන සිදු වී 2025 වසර වන විට හරියට ම වසර සියයක්.

ලොව මුල් ම සිනමා පට නැතහොත් කෙටි ධාවන කාලයක් සහිත වූ චලන චිත්‍ර නිහඬ ඒවා වූයේ රූපය සමඟ ශබ්දය සම්බන්ධ කරගැනීමේ තාක්ෂණය පළමු ව හඳුනාගෙන නොතිබුණු බැවින්. ලෝකයට චලන චිත්‍රය දායාද වී දශක තුනක් පමණ ඉක්ම ගිය පසු, 1927 වසරේදී 'ජෑස් සිංගර්' චිත්‍රපටය පළමු ව හඬ සහිත රූප පටය ලොවට ඉදිරිපත් කළා. මෙරට මුල් ම සිනමා කෘතිය හමුවන්නේ 1925 වසරේදී. එබැවින් ම එය අත්‍යන්තයෙන් ම නිහඬ රූප එකතුවක් විය යුතු අතර එහි නම 'රාජකීය වික්‍රමය හෙවත් ශාන්තා' බව සඳහන්. එය මෙරට තිරගත වීමට පෙර ගිනිගෙන හෝ ගිනිතබා විනාශ වූ බව සඳහන් වුව ද අධ්‍යක්ෂණය කරන්නේ ගුප්තා නමැති ඉන්දියානුවෙක් වුව ද නළු නිළියන්, නිෂ්පාදකයන්, ඇතැම් ශිල්පීන් මෙරට අය වූ බැවින් ද එය පළමු වැනි ලාංකේය සිනමා කෘතිය ලෙස සැලකීම යුක්තියුක්තයි.

මේ ගෙවී අවසන් වූයේ 2025 වසර. 2025 දෙසැම්බර් මස 29 දින රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී 1925න් ඇරඹි ලාංකේය සිනමා ඉතිහාසයේ සියවස සනිටුහන් කෙරුණා. ඒ, 'සිනමා විමර්ශී' නමින් ශාස්ත්‍රීය සිනමා සඟරාවක් එළි දක්වමින් හා 1947 සිට 2022 දක්වා වසර 75ක ලාංකේය කතා නාද සිනමාවේ විශිෂ්ටතම කෘති 25 තෝරා තබමින්.

ලාංකේය සිනමාවේ කතානාද යුගය ඇරඹෙන්නේ 1947 වර්ෂයේ තිරගත වන 'කඩවුණු පොරොන්දුව' චිත්‍රපටය බව බොහෝදෙනා දන්නා කරුණක් එය පදනම් ව 2025 වසර වන විට


නිධානය


බඹරු ඇවිත්

ලාංකේය කතානාද සිනමාවට වසර 78ක් පිරුණා. කලාත්මක සිනමාවෙහි ප්‍රබල කෘති නිර්මාණය කර තබමින් ද කලාපීය හා ලෝක මට්ටමින් තීරණාත්මක ඇගයුම්ලත් සිනමා කෘති හා නිර්මාණකරුවන් පෙරට ගෙන එමින් ද එම වසර 78 විහිද විකාශනය වී තිබෙනවා. ව්‍යාපාරයක් ලෙස 'ස්වර්ණමය' යුගය ලෙස නම් ලද කලාප ද සිවිල් අරගල හේතුවෙන් බිඳ වැටුණු සමය ද එහිදී පසුකර පැමිණ තිබෙනවා.

'රජත ජයන්තිය' පිළිබඳ සංඥාවක් තබමින් පසුගිය සිනමා ඇගයුමේදී හැරී විමසා බැලුවේ 2022 දක්වා නිෂ්පාදනය වුණු සිනමා කෘති පමණයි. ගෙවුණු යුගයෙහි සිනමා කෘති අතුරින් හොඳම සිනමා කෘති තේරීමේ මෙරට ඉතිහාසයට මින් පෙර එවැනි අවස්ථා 02ක් එක් වී ඇති අතර 1972 වර්ෂයේදී එතෙක් නිපදවුණු චිත්‍රපට අතුරින් හොඳම චිත්‍රපට 10 තේරීම ශ්‍රී ලංකා චිත්‍රපට ලේඛක හා විචාරක සංගමය විසින් ද 1997 වසරේදී ගෙවුණු වසර 50ක හොඳම චිත්‍රපට 10 තේරීම ජාතික චිත්‍රපට සංස්ථාව විසින් ද සිදු කරනු ලැබුවා.

විශිෂ්ටතම සිනමා කෘති ලැයිස්තුගත කිරීම කරන්නේ ලෝකයේ දියුණු සිනමා සංස්කෘති පැවති එක් එක් යුගවලට අදාළ වශයෙන් හෝ තෝරාගත් මාතෘකා පදනම් ව. එවැනි තෝරා ගැනීමක් සඳහා ආරාධනා ලබන්නේ සිනමාව හා සම්බන්ධ විද්වතුන්, ශාස්ත්‍රඥයන් හා පර්යේෂකයන්, විචාරකයන් ඇතුළු සිනමා භාෂාව හා කලාව පිළිබඳ සැලකිය යුතු පරිචයක් ඇති පිරිසක්.

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ, සිනමා අනු මණ්ඩලය විසින් සිදු කරනු ලැබූ ලාංකේය සිනමාවේ හොඳම චිත්‍රපට 25 තෝරා ගැනීම සඳහා ද එවැනි 150කට ආරාධනා ලැබී තිබුණු අතර එයින් 102 දෙනෙකු අදාළ පිළිතුරු ලබා දී තිබුණා. එහි අවසාන ප්‍රතිඵල ලබාගෙන තිබුණේ ගූගල් වෙබ් ඔස්සේ ලබාගත් එක් එක් තෝරා ගැනීම් විද්‍යාත්මක පදනමක් මත සිදු කළ පර්යේෂණාත්මක දත්ත විශ්ලේෂණයකින්.

ලෝක සිනමාව නිරතුරු ව වැඩී නැගෙන්නේ එහි හමුවන නේකවිධ කලාප විමසීමට ඇති එළඹුම් අතර පෙරමුණෙහි ශාස්ත්‍රීය විමර්ශනය තබමින්. 'සිනමා විමර්ශී' සඟරාව 2025 අවසානයේ එළි දකින්නේ ජාතික වශයෙන් පවතින එම අවශ්‍යතාවට සැලකිය යුතු මැදිහත්වීමක් සමගින්. මෙවර එහි සමාරම්භක කලාපය වෙන් කර තිබුණේ 'ශ්‍රී ලාංකේය සිනමාවේ සියවස' වෙනුවෙන්.


කලාව හා සංස්කෘතිය වඩා ශක්තිමත් ව නැගීම සෞඛ්‍යමත් රටකදී අත්‍යාවශ්‍ය කරුණක්. නව යුගයේ තාක්ෂණය හා නිරතුරු ව නැඟෙන සිනමාව එහිලා ප්‍රමුඛ වෙනවා. එබැවින් ශ්‍රී ලාංකේය සිනමාව සිය සියවස සමරමින් වඩාත් විධිමත් ව ඉදිරිය දෙස බැලීම යහපත් ප්‍රවේශයක්.



ගම්පෙරළිය

## හොඳම චිත්‍රපට 25

- නිධානය - ලෙස්ටර් ජේම්ස් පීරිස් (1972)
- බඹරු ඇවිත් - ධර්මසේන පතිරාජ (1978)
- ගම්පෙරළිය - ලෙස්ටර් ජේම්ස් පීරිස් (1963)
- වැලි කතර - ඩී.බී. නිහාල්සිංහ (1971)
- හංස විලක් - ධර්මසිරි බණ්ඩාරනායක (1980)
- දඩයම - වසන්ත ඔබේසේකර (1983)
- පාර දිගේ - ධර්මසේන පතිරාජ (1980)
- පරසතු මල් - ගාමිණී ෆොන්සේකා (1966)
- තුං මං හන්දිය - මහගම සේකර (1970)
- පුරහඳ කළුවර - ප්‍රසන්න විතානගේ (1997)
- විරාගය - තිස්ස අබේසේකර (1987)
- මේ මගේ සඳයි - අශෝක හඳගම (2000)
- අහස් ගව්ව - ධර්මසේන පතිරාජ (1974)
- පවුරු වළලු - ප්‍රසන්න විතානගේ (1999)
- සත් සමුදුර - සිරි ගුණසිංහ (1967)
- ඉර මැදියම - ප්‍රසන්න විතානගේ (2003)
- සුළඟ එනු පිණිස - විමුක්ති ජයසුන්දර (2005)
- දෙලොවක් අතර - ලෙස්ටර් ජේම්ස් පීරිස් (1966)
- රේඛාව - ලෙස්ටර් ජේම්ස් පීරිස් (1956)
- සොල්දාදු උන්නැහෙ - ධර්මසේන පතිරාජ (1981)
- අහසින් වැටෙයි - විමුක්ති ජයසුන්දර (2009)
- තුන්වෙනි යාමය - ධර්මසිරි බණ්ඩාරනායක (1982)
- ගොළු හදවත - ලෙස්ටර් ජේම්ස් පීරිස් (1968)
- හාර ලක්ෂය - ටයිටස් තොටවත්ත (1971)
- මිල්ලෙ සොයා - බුධ් කීර්තිසේන (2004)



පුරහඳ කළුවර



අහසින් වැටෙයි

**කපිල එම්. ගමගේ**

# ගීත ලතාව

ගුවන්විදුලි ගීතය සඳහා ඇය දැක්වූ වඩාත් වැදගත් දායකත්වයක් වන්නේ ජන සම්ප්‍රදායේ මුල්බැසගත් සිංහල සරල සංගීතය ජනප්‍රිය කිරීම. බොහෝ සිංහල ගීත උතුරු ඉන්දියානු චිත්‍රපට තනු මත යැපෙන කාලයක, ලතා වඩාත් දේශීය සංගීත අනන්‍යතාවක් සොයා යන සංගීත රචනාකරුවන් සහ ගී පද රචකයන් සමඟයි සමීප ව ක්‍රියා කළේ.

ශ්‍රී ලංකාවේ ගීත කෝකිලාව ලෙස සමාජ සමාදරයට බඳුන් වූ ලතා වල්පොල, ලාංකේය සංගීත ඉතිහාසයේ වඩාත් ම ගෞරවණීය හා බලගතු ගායිකාව ලෙස සැලකීම අතිශයෝක්තියක් වන්නේ නැහැ. විශේෂයෙන් රේඩියෝ සිලෝන්හි ආරම්භක වසරවලදී, නූතන සිංහල ගීතය හැඩගැස්වීමට දායක වූ පුරෝගාමී ගායිකාවක ලෙසයි ඇය සම්භාවනාවට පාත්‍ර වන්නේ. ඇගේ දීර්ඝ ගායන චාරිකාවේ අමරණීය සටහන්, ගුවන්විදුලි වෙළෙඳ තැටියේ සිට රිදී තිරය ඔස්සේ විහිදී නව මාධ්‍ය දක්වා වන පුළුල් පරාසයක පැතිර යනවා.

ලතා, 1934 වසරේ කොළඹ බම්බලපිටියේදී කිතුණු පවුලක උපත ලැබුවා. ඇගේ මුල් නම රීටා ජෙනෙවි ප්‍රනාන්දු. පසුව ඇය ගල්කිස්සේ පදිංචියට ගොස් පාසැල් අධ්‍යාපනය ලැබුවේ ශාන්ත අනිතෝනි බාලිකාවෙන්. එවක ශාන්ත අන්තෝනි දේවස්ථානයේ ගීතිකා කණ්ඩායමේ නිත්‍ය සාමාජිකාවක වූ ඇය ගායනයට වැඩි සමත්කම් දැක්වූ සිසුවියක්. සංගීතඥයකු වූ සී. ඒ. ෆොන්සේකා වෙත ඇය රැගෙන යනු ලැබුවේ සිය සොහොයුරෙකු විසින්. සී. ඒ. ෆොන්සේකා යනු එවක ගුවන්විදුලි ගායකයකු, සංගීතඥයකු මෙන් ම රංගන ශිල්පියකු ද වුණා. ඔහු සිය දරුවන් වූ සී. ඩී. ෆොන්සේකා, අර්වින් ෆොන්සේකා ඇතුළු පිරිසක් සමඟ මසකට වරක් ගුවන්විදුලි වැඩසටහනක් සඳහා ගීත ගැයූ අතර රීටා ජෙනවි ප්‍රනාන්දු, එම වැඩසටහන සඳහා සමූහ ගී ගායනයට සහභාගි වන්නටත් භාග්‍යය ලැබුවා. එවකට ජනප්‍රිය ගායකයෙකු වූ සුසිල් ප්‍රේමරත්නගේ



ගී වැඩසටහන වෙනුවෙන් ගී ගැයීමට ද ඇයට අවස්ථාව හිමි වුණේ එහිදී. පසුව ඇය එතෙක් භාවිත නම 'ලතා' ලෙස වෙනස් කළ අතර එයට සුසිල් ප්‍රේමරත්නගේ බලපෑමක් ඇති වූ බවයි පැවසෙන්නේ. 'රෑ රූසේ අඳිනා ලෙසේ', 'රන්වන් කරලින්' ආදී ගීත ඔහු සමඟින් ද 'සැළලිහිණි කොවුල්', 'ලෝ අඩ නින්දේ' යන ගීත තවත් ජනප්‍රිය ගායකයෙකු වූ සී.ටී. ප්‍රනාන්දු සමඟින් ද ගයමින් ඇය පත් වූණේ අතිශය ජනප්‍රියත්වයට.

රේඩියෝ සිලෝන් ඇසුරේ ගුවන්විදුලි ගීත සඳහා ලතා වල්පොලගේ දායකත්වය කැපී පෙනෙනවා. සිංහල සංගීත රසය හැඩගැස්වීම, සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කිරීම සහ ශ්‍රී ලාංකේය ගුවන්විදුලි විකාශන කලාවේ ගීත පාර්ශ්වයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ඇය ඉටු කළේ තීරණාත්මක කාර්යභාරයක්. ඇය දක්ෂ ගායිකාවක පමණක් නොව, සම්ප්‍රදාය හා නූතනත්වය අතර පාලමක් ඉදි කළ සංස්කෘතික නිරූපිකාවක්.

රේඩියෝ සිලෝන්හි ස්වර්ණමය යුගයේ (1950/60 දශකවල) ලතා වල්පොල ජනාදරයට පත් වූ අතර එම කාලයේ ගුවන්විදුලිය රටේ බලවත් ම ජනමාධ්‍යය ලෙස පැවතීම එයට ප්‍රබල හේතුවක් වුණා. ඇගේ ගීත ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල පදිංචි සිංහල කතා කරන රසිකයන් අතර පුළුල් ව ප්‍රචලිත වුණා. ගුවන්විදුලිය ඔස්සේ ඇගේ ගීතය ගම්, අර්ධ නාගරික ප්‍රදේශ සහ නගර කරා ප්‍රවිෂ්ට වූ අතර එයින් ඇය පත්වුණේ ගුවන්විදුලිය නිර්මාණය කළ මුල් ම සැබෑ ජාතික සංගීත තාරකාවක් බවට.

ගුවන්විදුලි ගීතය සඳහා ඇය දැක්වූ වඩාත් වැදගත් දායකත්වයක් වන්නේ ජන සම්ප්‍රදායේ මුල්බැසගත් සිංහල සරල සංගීතය ජනප්‍රිය කිරීම. බොහෝ සිංහල ගීත උතුරු ඉන්දියානු චිත්‍රපට තනු මත යැපෙන කාලයක, ලතා වඩාත් දේශීය සංගීත අනන්‍යතාවක් සොයා යන සංගීත රචනාකරුවන් සහ ගී පද රචකයන් සමඟයි සමීප ව ක්‍රියා කළේ. ඇගේ ගායනයේ භාෂා භාවිතය, පැහැදිලි උච්චාරණය, නිරුත්සාහී ස්වාභාවික ගැයුම් විලාසය සහ ප්‍රකාශනයේ චිත්තවේගීය ගැඹුර, ජන රිද්ම, ගැමි ජීවිතය, හෙළකම සහ බෞද්ධ සංස්කෘතික තේමාවලින් ලැබූ ආභාසය සහ ඇය ඒ කෙරෙහි දැක්වූ අවධානය

විශේෂයෙන් කැපී පෙනෙන්නක්. මේ නැගී එන සිංහල ගීත සම්ප්‍රදාය ප්‍රවර්ධනය සඳහා ගුවන්විදුලිය විසින් පුළුල් ලෙස භාවිත කරනු ලැබුවේ ඇගේ අනන්‍ය කටහඬ සහ ගායන ශෛලිය.

ගුවන්විදුලි ගීතවල කලාත්මක හා භාෂාමය ප්‍රමිති ඉහළ නැංවීමේදී ඇගේ භූමිකාවෙන් සැපයුණේ ප්‍රධාන දායකත්වයක්. මෙය ශ්‍රාවක රුචි අරුචිකම් ඉහළ නැංවීම සහ පිරිපහදු කර භාෂා භාවිතය ප්‍රවර්ධනය අරමුණු කරගත් ගුවන්විදුලියේ අධ්‍යාපනික හා සංස්කෘතික මෙහෙවරට හොඳින් ගැළපුණා. ඇගේ ගීත, සාහිත්‍යමය වටිනාකම සහ සංගීතමය සුන්දරත්වය ඒකාබද්ධ කළ උසස් තත්ත්වයේ ගුවන්විදුලි සංගීත යෙදවුම්වලට නිදසුන් ලෙස අදටත් භාවිත කෙරෙන්නේ එබැවින්.

ලතා වල්පොල ගුවන්විදුලි සංගීතයේ කාන්තා නියෝජනයට ද කැපී පෙනෙන දායකත්වයක් ලබා දුන් ගායිකාවක්. කාන්තාවන් ප්‍රසිද්ධියේ ගී ගැයීම සමාජීය වශයෙන් නොපිළිගත් යුගයක ඇය විශ්වාසවන්ත, ගෞරවනීය සහ වෘත්තීයමය කලාකාරියක් ලෙසයි ඉස්මතු වුණේ. ගුවන්විදුලිය ඔස්සේ ලද ඇයගේ සාර්ථකත්වය ගායිකාවන් සඳහා වැඩි වශයෙන් සමාජ පිළිගැනීම ඇතිකිරීම දිරිගැන්වූ අතර බොහෝ තරුණ ගායිකාවන්ට සංගීත ක්ෂේත්‍රයට පිවිසෙන්නට ද පෙළඹවීමක් ඇති කළා. ගුවන්විදුලි ගීත ඔස්සේ පොදු සමාජ සංස්කෘතික අවකාශයක කාන්තා හඬ සාමාන්‍යකරණය කිරීමට ඇය ප්‍රමුඛ ව උදව් කළ අතර ශ්‍රී ලංකාවේ කලාකාරියන්ට අවස්ථා පුළුල් කිරීමේදී ඇගේ මැදිහත්වීම තීරණාත්මක සාධකයක් වුණා.

ආගමික උත්සව සහ විශේෂ අවස්ථාවලදී විකාශනය වූ ඇගේ ගීත පටිගත කිරීම්, ශ්‍රාවකයන්ට ආධ්‍යාත්මික රසයක් නිර්මාණය කළා. ගුවන්විදුලි සංගීතය සහ ආගමික ජීවිතය අතර සම්බන්ධතාව ශක්තිමත් කළ මේ ගීත විශේෂයෙන් ජනප්‍රිය වූණේ ග්‍රාමීය ජනයා අතර.

ලතා, සරල වූ ජන පාදක තනුවලින් වඩාත් ව්‍යුහගත, සම්භාව්‍ය බලපෑමෙන් යුත් සංයුති වෙත සිංහල ගීත කලාව පරිවර්තනය කිරීමට උපකාර කිරීමෙන් ලබා දුන්නේ කල් පවතින දායකත්වයක්. මේ අනුව 20 වැනි සියවසේ මැදභාගයේ සිංහල ගීතවල අනන්‍යතාව හැඩගස්වන්නට දායක වූ ඇයගේ ගීත බොහෝවිට පිළිබිඹු කළේ සංස්කෘතික වටිනාකම්, චිත්තවේගීය සංවේදීතාව, සාහිත්‍යමය පොහොසත්කම සහ සම්භාව්‍ය සංගීත විනය.

ලතා වල්පොල ගුවන්විදුලි සංගීතයේ කාන්තා නියෝජනයට ද කැපී පෙනෙන දායකත්වයක් ලබා දුන් ගායිකාවක්. කාන්තාවන් ප්‍රසිද්ධියේ ගී ගැයීම සමාජීය වශයෙන් නොපිළිගත් යුගයක ඇය විශ්වාසවන්ත, ගෞරවනීය සහ වෘත්තීයමය කලාකාරියක් ලෙසයි ඉස්මතු වුණේ.





ලතා වල්පොල චිත්‍රපට පසුබිම් ගීත ගායිකාවක් ලෙස සිංහල සිනමාවට සැලකිය යුතු හා කල් පවතින දායකත්වයකුයි ලබා දුන්නේ. ඇගේ මධුර හඬින් සහ සුපැහැදිලි ගැයුමින් හැඟීම් ප්‍රකාශ කිරීමේ විශේෂ හැකියාව නිසා චිත්‍රපට චරිතවලින් පිළිබිඹු වන හැඟීම් සහ තත්ත්ව ගායනාවෙන් ගළපන්නට ඇය තුළ වූ හැකියාව ඊට හේතු වුණා.

සිංහල චිත්‍රපටයේ ස්වර්ණමය යුගයේදී ජනප්‍රිය ගායිකාවක් බවට පත් වූ ඇයගේ කටහඬ, බොහෝ සාර්ථක චිත්‍රපටවල ජනප්‍රිය ගීතවලට යොදා ගන්නට නිෂ්පාදකවරුන් නොපැකිළ ව ඉදිරිපත් වූයේ එහි තිබූ ජීව ගුණය නිසා ම. ලතා බොහෝවිට චිත්‍රපටවල ප්‍රධාන කාන්තා චරිත සඳහා පසුබිම් ගායනා කළ අතර ඒවායේ ආදර, නාට්‍යමය හෝ භක්තිමය හෝ ගුණ තිබුණා. චිත්‍රපටවල චිත්තවේගීය ගැඹුර වැඩි දියුණු කරන්නටත් ඇගේ ගීත සමත් වුණා. සංගීතය සහ එහි බහුකාර්යතාව පිළිබඳ ඇයගේ මනා වූ ශක්තිමත් පුහුණුව නිසා තිරයේ විවිධ භූමිකා සහ මනෝභාවයට අනුව ඇගේ හඬ අනුවර්තනය කිරීමට ඇයට හැකියාව ලැබුණා.

චිත්‍රපට ක්ෂේත්‍රයේ ඇයගේ දායකත්වය, ප්‍රේක්ෂකයන් අතර ජනප්‍රියත්වය සහ ශ්‍රී ලාංකික චිත්‍රපට සංගීතයට ඇගෙන් වූ හිතකර බලපෑම් හේතුවෙන් ලතා වල්පොල ශ්‍රී ලංකාවේ වඩාත් ම ගෞරවනීය හා කීර්තිමත් ම චිත්‍රපට පසුබිම් ගායිකාවක ලෙසයි පිළිගැනෙන්නේ. ඇගේ චිත්‍රපට ගීත බොහෝදෙනා එසේ පිළිගෙන අගය කරන ලද්දේ ප්‍රකාශන ඉදිරිපත් කිරීම, චිත්තවේගීය සමබරතාව සහ සම්භාව්‍ය අලංකාරය යන කාරණා සැලකිල්ලට ගනිමින්. සිංහල සිනමා ගීතයේ කලාත්මක අනන්‍යතාව සොයා ගනිමින් සිටි කාලයක සිදු වූ ඇයගේ මැදිහත්වීම එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීමට තීරණාත්මක දායකත්වයකුයි ලබා දුන්නේ.

ජීවිතයේ පසුකාලීන සමයේදී ලතා වල්පොල ගීත ගායනයට ලබා දුන්නේ අඩු දායකත්වයක්. එහෙත් ඇය සංගීත වෘත්තිකයන් සහ රසික ජන ප්‍රජාව තුළ ඉතා ගෞරවනීය චරිතයක් ලෙස රැඳී සිටියා. ජාතියේ සම්භාවනාවට පාත්‍ර වූ ඇය ශ්‍රී ලාංකේය සංගීතයට සිය ජීවිත කාලයේ ඉටු කළ සේවය වෙනුවෙන් සුවිශේෂ පිළිගැනීමටත් ලක් වුණා. ඇය දීපශිඛා, ස්වර්ණහංස, සරසවිය ඇතුළු සිනමා උළෙල රැසකදී ම සම්මානිත වූ අතර 2005 වසරේදී රජය පිරිනමන කලාසූරි සම්මානයෙන් ද 2017 වසරේදී දේශමාන්‍ය සම්මානයෙන් ද පිදුම් ලැබුවා. දක්ෂතාවලට පමණක් නොව නිහතමානීකමට සහ කලා දිවියේ අඛණ්ඩතාව පවත්වාගෙන ඒම සඳහා කළ කැපකිරීම්වලට ද විචාරකයන්ගේත් සාමාන්‍ය රසිකයන්ගේත් පිළිගැනීම දිවියෙන් සමුගන්නා තුරු ලැබීමට ලතා වල්පොල සමත් වීම කැපී පෙනෙන කාරණයක්. එය සිංහල ගීත වංශය පවතින තුරු නොනැසී එක සේ පවතින බව ද කිව හැක්කක්.

# නියාමනය මාධ්‍ය මර්දනයේ මුහුණුවරක් ද?

ප්‍රියාන් ආර් විජේබණ්ඩාර



මාධ්‍ය නියාමනයට ඇත්තේ මාධ්‍ය ප්‍රතිපත්ති සමඟ සමීප සම්බන්ධතාවකි. රජය සහ වෙනත් නිල තීරණ ගන්නා කණ්ඩායම් යම් ආකාරයකට මාධ්‍ය ව්‍යුහ, මාධ්‍ය හැසිරීම් හා මාධ්‍ය පාලනය පිළිබඳ විධිමත් හා අවිධිමත් ආකරයට යාන්ත්‍රණ නිර්මාණය කිරීම මින් අදහස් වේ. මෙය රාජ්‍ය මෙන් ම රාජ්‍ය නොවන ලෙස ද ස්ථාපිත විය හැකි ය.

පසුගියදා ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට 'හිරු' නාලිකාවේ ව්‍යාජ ප්‍රචාර සම්බන්ධයෙන් පියවරක් ගන්නැයි ඉල්ලීම් කර තිබිණි. මෙම ඉල්ලීම සම්බන්ධයෙන් හිරු නාලිකාව තහනම් කිරීමට හෝ කිසිදු අන්දමේ මාධ්‍ය මර්දනයක් හෝ සිදුනොවන බවට කැබිනට් මාධ්‍ය ප්‍රකාශක, අමාත්‍ය නලින්ද ජයතිස්ස තහවුරු කර තිබිණි. එහෙත් මෙම සිදුවීමත් සමඟ 'මාධ්‍ය නිදහස හා නියාමනය' පිළිබඳ මතුවූ කතිකාව තවමත් සක්‍රීය ව පවතී.

බොහෝ සංකල්ප සේ ම ප්‍රජාතන්ත්‍රවාදය, භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ආදිය පිළිබඳ ව ද බොහෝ දෙනකුට ඇත්තේ ඌනිත අදහස් ය. නිදසුනක් ලෙස රටක පුරවැසියන්ට රටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට වඩා වැඩි යමක් 'මාධ්‍ය නිදහස' යන්නෙන් ස්ථාපිත ව ඇතැයි ඇතැම්හු සිතති. වෙනත් අයුරකින් කිවහොත් පුරවැසියාගේ නිදහස මාධ්‍ය නිදහසට යටත් යැයි ඔවුහු කල්පනා කරති. 'මාධ්‍ය නිදහස'යනු මාධ්‍ය මුදලාලිලාගේ නිදහස බවත් ඕනෑ ම දෙයක් ප්‍රකාශ කිරීමට, මහජනයා නොමඟ යැවීමට පවා තමන්ට පරම අයිතියක් ඇති බවත් සිතා තීන්දු තීරණ ගැනීමට උත්සාහ දරනු පෙනෙයි.

එහෙත් විෂයික කරුණු පිළිබඳ පුළුල් චිත්‍රයක් සහිත ව වත්මන් කතිකාව දෙස බැලීම 'සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය' පිළිබඳ උනන්දුවක් දක්වන සියලුදෙනාට යහපත් ය.

"මහජන ආයතනයක් විසින් ප්‍රජාවගේ පිළිගැනීමට ලක් වූ ක්‍රියාකාරකම් පිළිබඳ ව බල පවත්වනු ලබන ඉලක්කගත පාලනයක්" නියාමනය ලෙස සරල ව හැඳින්විය හැකි ය. ඒ අනුව මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ ව සලකන්නේනම් මාධ්‍ය නියාමනය යනු නූතන මාධ්‍ය භාවිතයේ කැපී පෙනෙන සංකල්පයකි. විවිධත්වය, තරගකාරිත්වය සහ නිදහස වැනි ප්‍රතිපත්තියක අරමුණු තහවුරු කිරීම සඳහා මාධ්‍ය ක්‍රමවේද සහ ආයතනවලට අදාළ ව නීතිමය බැඳීමක් සහිත ව සිදු කරන ක්‍රියාවලියක් ලෙස මෙය හැඳින්විය හැකි ය.

රජය හෝ  මාධ්‍ය සංවිධාන හෝ මාධ්‍ය කර්මාන්තයේ අභ්‍යන්තර ගතික විසින් නියාමන ක්‍රියාවලි ආරම්භ කළ හැකි ය. එය ධනාත්මක මෙන් ම ඍණාත්මක මුහුණුවරකින් ද ක්‍රියාත්මක වනු දැකිය හැකි ය. කිසියම් පිළිගත් ප්‍රමිතියක් සහිත ව ප්‍රවෘත්ති විකාශය කිරීමට ඉඩ සැලසීම ධනාත්මක නියාමනකි. යම් සන්දේශයක් මාධ්‍යය ඔස්සේ ප්‍රකාශමාන වීම වැළක්වීම ඍණාත්මක නියාමනකි. අනෙක් අතට ජනමාධ්‍යවල ස්වරූපය හා ගතිකත්වය අනුව නියාමන ක්‍රමවේද, නීතිරීති හෝ කොන්දේසි, ආචාරධර්ම වෙනස් විය හැකි ය. ඒ, මුද්‍රිත මාධ්‍ය නියාමනය, විද්‍යුත් මාධ්‍ය නියාමනය වශයෙනි. එහෙත් ඩිජිටල් තාක්ෂණ ක්‍රියාවලියේදී අන්තර්ජාලය පුළුල්වත් ම මාධ්‍යවලට විශේෂිත නියාමනය අර්ථ විරහිත දෙයක් ලෙස පෙනී යා හැකි ය. එනම් අන්තර්ජාලය හා වෙනත් සමාජ මාධ්‍ය නියාමනය වර්තමානය වන විට අපහසු කටයුත්තක් වී ඇති බැවිනි. එහෙත් එය සම්පූර්ණයෙන් කළ නොහැක්කක් ද නොවේ. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ වුව අවස්ථා කිහිපයකදී ම සමාජ මාධ්‍ය සේවා සැපයුම් ආයතන ඔස්සේ අවහිර කිරීම සිදු විය. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලන යුගයේ පුවත් වෙබ් අඩවි කිහිපයක් අවහිර කෙරුණු අතර 2015 වසරේදී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ ආගමනයත් සමඟ එකී වෙබ් තහනම ඉවත් කෙරුණි. එසේ වුව ලංකා ඊ නිව්ස් වෙබ් අඩවිය එම ජනාධිපතිවරයාගේ කාලයේදී ම 2017-11-08 දින සිට කාලයක් යළි අවහිර කරනු දකින්නට ලැබුණි. ජාතික ආරක්ෂාව හේතුවෙන් එවැනි ක්‍රියාමාර්ග ගැනීමට සිදුවූ බව එවක රජයන්හි නිල මතය වූ අතර මාධ්‍ය සංවිධාන, සිවිල් ක්‍රියාකාරී ඇතුළු බොහෝදෙනා මෙම අවස්ථා හඳුනාගනු ලැබුවේ මාධ්‍ය මර්දනයක් ලෙස ය.

කෙසේ වුවත් 15 වැනි සියවස මැදභාගයේදී මුද්‍රණ යන්ත්‍ර භාවිතයෙන් බටහිර යුරෝපයේ පොත් මුද්‍රණය ආරම්භ වන විට ම මාධ්‍ය නියාමනය ආරම්භ වී ඇති බව හඳුනාගත හැකි ය. මුද්‍රණය ව්‍යාපාරයක් මෙන් ම කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වන විට පල්ලිය සහ රාජ්‍ය, මුද්‍රිත ප්‍රකාශනවල අන්තතර්ගතය කුමක් ද? යන්න පිළිබඳ විමසීමට උනන්දු වූ බව පෙනේ. පොත් මුද්‍රණයට පෙර කිසියම් බලධාරියෙකුගේ අනුමැතිය ගැනීමේදීත් ඒවා ආනයනය හා අපනයනයේදීත් කිසියම් පාලනයකට/සීමා කිරීමකට නතු කෙරිණි.

මාධ්‍ය නියමනයකට පක්ෂ වන පිරිස් එකී අවශ්‍යතාව වෙනුවෙන් ප්‍රමුඛ කරුණු 06ක් ගෙන හැර දක්වති.

- තොරතුරු සමාජයක පවත්නා විවිධ සන්නිවේදන විධික්‍රම යනු ආර්ථික සම්පතකි. එබැවින් ඒවා කළමනාකරණයට.

- මහජන සාමය ආරක්ෂා කිරීමට.

- පාලනය නොකරන ලද පොදු මහජන සන්නිවේදන ක්‍රම මගින් තනි පුද්ගලයන්ගේ අයිතියට සිදුවන බලපෑම පාලනය කිරීමට.

- තාක්ෂණික ප්‍රමිතිකරණය, නවෝත්පාදනය, අන්තර් සම්බන්ධතා මත පදනම් වූ සන්නිවේදන ක්‍රමවේදවලට සංවර්ධනයට සහ ඵලදායී භාවිතයට.

- තමන් තෝරා ගත් සන්නිවේදනාත්මක හා සංස්කෘතික භාවිතය මත පදනම් ව තොරතුරු වෙත ප්‍රවේශ වීම, සන්නිවේදනයේ නිදහස, විවිධත්වය සහ විශ්වීය වටිනාකම් ප්‍රවර්ධනයට.

- මාධ්‍ය සේවාවල නිදහස් වෙළෙඳපොළ භාවිතය, ප්‍රවේශ වීමේ තරගකාරීත්වය, පාරිභෝගික අයිතිය යනාදිය පවත්වාගෙන යාමට.

ලෝකයේ පිළිගත් නියාමන ප්‍රවේශ කිහිපයක් හඳුනාගත හැකි ය. ස්වයං නියාමනය (Self regulation), සහනියාමනය (Co-regulation), ව්‍යවස්ථාපිත නියාමනය (Statutory regulation), අභ්‍යන්තර නියාමනය (inhouse regulation) ඊට අයත්.

### 1. ස්වයං නියාමනය

පූර්ණ රාජ්‍ය මැදිහත්වීමකින් තොර ව මාධ්‍ය විසින් ස්වේච්ඡාවෙන් සිදු කරනු ලබන නියාමන ක්‍රියාවලියකි. මාධ්‍ය හිමිකරුවන්, සංස්කාරකවරුන්, ජනමාධ්‍යකරුවන් විසින් එක් ව හෝ වෙන් වෙන් වශයෙන් හෝ එය සිදු කරනු ලබති. මෙවැනි ක්‍රියාවලියකදී ආචාරධර්ම/ මාර්ගෝපදේශ සකස් කිරීමේ ක්‍රියාවලියට මාධ්‍ය වෘත්තිකයෝ සහභාගි වෙති. එමෙන් ම ඒවා නිසි පරිදි ක්‍රියාත්මක වන්නේදැයි විමසා බලන ව්‍යුහයට (මණ්ඩල, කොමිසම්, කමිටු) සහභාගි වන්නෝ ද එකී මාධ්‍යයේ නියැළෙන වෘත්තිකයෝ ය. එවැනි ව්‍යුහවලට මහජන නියෝජනයක් ලබා දීමේ අරමුණෙන් සිවිල් සමාජ සංවිධාන නියෝජිතයෝ හා පර්යේෂකයෝ ද සහභාගි කර ගැනෙති.

### 2. සහනියාමනය

මාධ්‍ය නියෝජිතයන්ගේ කැපී පෙනෙන මැදිහත්වීමක් සහිත ව නීතිය විසින් ස්ථාපිත කරන ලද නියාමනය සහනියාමනය ලෙස හැඳින්විය හැකි ය. මාධ්‍ය නියෝජිතයෝ යන්නට මාධ්‍ය හිමිකරුවෝ, මාධ්‍ය සංස්කාරකවරු මෙන් ම මාධ්‍යකරුවෝ ද ඇතුළත් වෙති. මාධ්‍ය නියෝජිතයන්ගේ ද සහභාගිත්වය සහිත ව ආචාරධර්ම, මාර්ගෝපදේශ සකස් කෙරේ. මාධ්‍යකරුවන්ට මෙමගින් ලබා දෙන තීන්දු හා නිර්දේශ නොසලකා හැරිය නොහැකි වීම මෙහි ඇති ප්‍රධාන ලක්ෂණයකි. නීතියෙන් ස්ථාපිත ව ඇති බැවින් රාජ්‍ය මැදිහත්වීම දැකිය හැකි ය. ඒ නිසා මාධ්‍ය මෙවැනි නියාමන ආයතන සමඟ සහයෝගී ව වැඩ කිරීමට පසුබෑමක් පෙන්විය හැකි ය.

### 3. ව්‍යවස්ථාපිත නියාමනය

නීතියෙන් ස්ථාපිත, මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රබල මැදිහත්වීමක් නොමැති විධි ක්‍රමයකි. සිවිල් සමාජ කණ්ඩායම්, නීතිඥ සංගම් සහ ශාස්ත්‍රාලයීය පර්යේෂකයෝ නියාමන මණ්ඩලවල සාමාජිකත්වය දරති. ඇතැම් අවස්ථාවලදී පාර්ලිමේන්තුව හෝ එවැනි කිසියම් මණ්ඩලයක් හෝ පත් කරන නියෝජිතයන්ගෙන් නියාමන ව්‍යුහය සමන්විත වේ. මාර්ගෝපදේශ සකස් කිරීම, ඊට අදාළ නිරීක්ෂණ අදාළ ව්‍යුහ විසින් සිදු කරනු ලබයි.

### 4. අභ්‍යන්තර නියාමනය

ඇතැම් මාධ්‍ය ආයතන නියාමන ක්‍රියාවලිය තම ආයතන මට්ටමින් ආභ්‍යන්තරික ව පවත්වාගෙන යයි. මාධ්‍ය ආයතන තම ආයතනය වෙනුවෙන් ඒ සඳහා ඕම්බුඩ්ස්මන්වරයෙක් (Ombudsman) පත් කරයි. මාධ්‍ය ආයතනයක කටයුතු කළ විශ්‍රාම ගත් ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවේදියෙකු ඕම්බුඩ්ස්මන්වරයා ලෙස බොහෝ විට පත් කෙරේ. එසේ නොමැති මාධ්‍ය විෂය පිළිබඳ අවබෝධයක් ඇති ස්වාධීන විද්වතෙකු ඒ සඳහා පත් කරන අවස්ථා ද දැක ගත හැකි ය.

මාධ්‍ය ආයතන සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි ආයතනයේ සංස්කාරකවරුන්ට දැනුම් දීමත් ඒ සඳහා ගත හැකි පියවර නිර්දේශ කිරීමත් ඕම්බුඩ්ස්මන්වරයාගේ කාර්යය වේ. 'රාවය' පුවත්පත වරෙක එවැනි ඕම්බුඩ්ස්මන්වරයෙකු පත් කිරීමට උත්සාහ ගත්ත ද එය අසාර්ථක විය. අසාර්ථක වූ ප්‍රථම සහ එක ම ලාංකේය අත්දැකීම එය විය.

ආසියානු ක්‍රිකට් කවුන්සිලය මෙහෙයවූ 'වයස අවුරුදු 19න් පහළ ආසියානු කුසලානය 2025' දිනා ගැනීමට පාකිස්තානය සමත් වුණා. ඩුබායි දේශයේ අයි.සී.සී. ඇකඩමි හා සෙවන්ස් ක්‍රීඩාංගණවල කණ්ඩායම් 08ක සහභාගිත්වයෙන් පැවති මේ තරගාවලියේ අවසන් ගැටුම පැවැත්වුණේ පරම ප්‍රතිවාදීන් වන ඉන්දියාව හා පාකිස්තානය අතර. මෙහිදී 'තරගයේ වීරයා' වූ පාකිස්තාන ආරම්භක පිතිකරු සමීර් මින්හාස් පන්දු 113කින් ලකුණු 172ක් ලබා ගනිමින් ඉන්දියා පන්දු බළ ඇණිය සුනුවිසුනු කළා. ඔහුගේ අගනා පිතිහරඹය මත පාකිස්තානය වාර්තා කළ කඩුලු 08ට 347ක මුළු ලකුණු සංඛ්‍යාවට පිළිතුරු වශයෙන් ඉන්දියාවට රැස් කර ගැනීමට හැකිවුණේ ලකුණු 156ක් පමණයි. ඔවුන්ගේ සියලු ම ක්‍රීඩකයන් ඕවර 26යි පන්දු 02ක් ඇතුළත දැවී ගිය අතර ඒ අනුව පාකිස්තානයට ලකුණු 191ක ප්‍රබල ජයග්‍රහණයක් සහ වයස අවුරුදු 19න් පහළ ආසියානු කුසලානය හිමි වුණා.

මින්හාස්ගේ දර්ශනීය ඉනිමට හතරේ පහර 17ක් සහ හයේ පහර 09ක් ඇතුළත් ව තිබුණා. ඔහුගේ ලකුණු 172 පාකිස්තානය වෙනුවෙන් ලබා ගත් වැඩි ම පෞද්ගලික ලකුණු සංඛ්‍යාව මෙන් ම යොවුන් ජාත්‍යන්තර එක්දින තරගාවලියක අවසාන තරගයේදී ඕනෑ ම පිතිකරුවෙකු වාර්තා කළ වැඩි ම ලකුණු සංඛ්‍යාව ද වනවා. මේ දක්ෂතාවේදී ඔහු අභිභවා ගියේ 2012 වසරේ පැවති තුන්කොන් තරගාවලියක අවසාන තරගයේදී දකුණු අප්‍රිකාවේ කුයින්ටන් ඩි කොක් පාකිස්තානයට එරෙහි ව රැස්කරගෙන තිබූ ලකුණු 146. මින්හාස් එල්ල කළ හයේ පහර 09 ද යොවුන් ජාත්‍යන්තර එක්දින තරගාවලියක අවසාන තරගයක පිතිකරුවෙකු එල්ල කළ වැඩි ම හයේ පහර සංඛ්‍යාව. මෙහිදී ඔහු නැවත වරක් පසුකර ගොස් තිබුණේ 2012 අවසන් තරගයේ ඩි කොක්ගේ හයේ පහර 6යේ වර්තාව. තරගාවලියේ වැඩි ම ලකුණු 471ක් රැස් කළ මින්හාස් සමස්ත තරගාවලියේ වීරයා ලෙස ද නම් කෙරුණු අතර කඩුලු 14ක් ලබා ගත් ඉන්දියාවේ දීපෂ් දේවේන්ද්‍රන් වැඩි ම කඩුලුලාභියා වුණා.

ACC MEN'S U19 ASIA CUP 2025

# ආසියානු යොවුන් ක්‍රිකට්

වර්නන් ගුණසේකර

ඉන්දියාවේ ආරම්භක පිතිකරුවෙකු වන නැගී එන ක්‍රිකට් තරුව වයිභාව් සූර්යවන්ශිට මේ අවසාන තරගයේදී ඔහුගේ ප්‍රවේගකාරී පිතිහරඹය දිගට ම දියත් කිරීමට හැකි වුණේ නැහැ. හයේ පහර 03ක් හා හතරේ පහරක් එල්ල කළ ද ඔහුගේ ඉනිම පන්දු 10කින් ලකුණු 26කට සීමා වුණා.

සූර්යවන්ශි මේ තරගාවලිය ආරම්භ කළේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයට එරෙහි ව පන්දු 95කින් ලකුණු 171ක් ලබා ගනිමින්. හතරේ පහර 9ක් සහ වාර්තාගත හයේ පහර 14ක් ඔහුගේ එම ඉනිමට ඇතුළත් ව තිබුණා. ඒ අනුව ඔහු යොවුන් ජාත්‍යන්තර එක්දින තරගවලදී පිතිකරුවෙකු ඉනිමකදී එල්ල කළ වැඩි ම හයේ පහර වාර්තාව බිඳ දැමුවා. සූර්යවන්ශි මකා දැමුවේ ඕස්ට්‍රේලියාවේ මයිකල් හිල් නැමීබියාවට එරෙහි ව 2008 පෙබරවාරියේ එල්ල කර තිබූ හයේ පහර 12 වාර්තාව.

මේ තරගාවලියේ ශ්‍රී ලංකාව ඇතුළත් ව තිබුණේ 'බී' කොටසට. එම කොටසේ සෙසු කණ්ඩායම් වුණේ නේපාලය, ඇෆ්ඝනිස්තානය හා බංග්ලාදේශය. 'ඒ' කොටසට ඉන්දියාව, පාකිස්තානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ මැලේසියාව ඇතුළත් ව සිටියා.

පිලකට ඕවර 50 බැගින් වූ මේ තරගාවලියේ ශ්‍රී ලංකාවේ ගමන අවසන් පූර්ව වටයෙන් නතර වුණා. ඔවුන් තරගාවලිය ආරම්භ කළේ නේපාලය කඩුලු 8කින් පහසුවෙන් පරදවමින්. තියුණු මුහුණුවරක් ගත් දෙවැනි තරගයේ ඇෆ්ඝනිස්තානයට එරෙහි ව ශ්‍රී ලංකාව කඩුලු දෙකක ජයග්‍රහණයක් වාර්තා කළේ තරගයේ පන්දු හතරක් පමණක් ඉතිරි ව තිබියදී. ශ්‍රී ලංකාව අවසාන මූලික වට තරගයේදී බංගලි දේශයට ලකුණු 39කින් පරාජය වූ අතර මෙය ඔවුන් මෙවර තරගාවලියේ අත්කරගත් පළමු වැනි පරාජය වුණා. තරග තුනකින් ජයග්‍රහණ දෙකක් වාර්තා කරමින් ශ්‍රී ලංකාව ඔවුන්ගේ කොටසෙන් අවසන් පූර්ව වටයේ ස්ථානයක් හිමිකර ගැනීමට සමත් වුණා. එහිදී ඔවුන්ට මුණ ගැසුණේ ඉන්දියාව.

මේ තරගයට වර්ෂාව හරස් වූ බැවින් තරගය විස්සයි20 ගැටුමක් බවටයි පත්වුණේ. පළමු ව පන්දුවට පහර දීම සඳහා කැඳවීමෙන් පසුව ශ්‍රී ලංකාවට රැස්කර ගැනීමට හැකිවුණේ කඩුලු 08ක් දැවී ලකුණු 138ක් පමණයි. පහසුවෙන් මේ ඉලක්කය හඹා ගිය ඉන්දියාව ඕවර 18ක් ඇතුළත කඩුලු දෙකක් පමණක් අහිමි කරගෙන ලකුණු 139ක් වාර්තා කරමින් තරගය ජය ගත්තා.

මෙහිදී ඉන්දියාවට ලකුණු හඹා යාම පහසු කරමින් විහාන් මල්හොත්රා (පන්දු 45කින් නොදැවී ලකුණු 61) සහ ඒරන් ජෝර්ජ් (පන්දු 49කින් නොදැවී ලකුණු 58) අර්ධ ශතක ලබා ගනිමින් තෙවැනි කඩුල්ල වෙනුවෙන් ලකුණු 114ක සබඳතාවක් පවත්වා ගනිමින් ජයග්‍රහණය සුවිශේෂ ආකාරයට සම්පූර්ණ කළා. රසිත් නිම්සර ශ්‍රී ලංකාව වෙනුවෙන් සාර්ථක ම පන්දු යවන්නා වෙමින් ලකුණු 31කට කඩුලු 02ක් බිඳ හෙළුවා.

ඊට පෙර, ශ්‍රී ලංකා ඉනිමේ කඩුලු අඛණ්ඩ ව බිඳ වැටීම නිසා අභියෝගාත්මක ඉලක්කයක් ප්‍රතිවාදීන්ට ලබා දීමට ඔවුන්ට නොහැකි වුණා. මැද පෙළ පිතිකරු චාමික හීනැටිගල පන්දු 38කින් ලකුණු 42ක් රැස් කරමින් ශ්‍රී ලංකාවේ වැඩි ම ලකුණුලාභියා බවට පත්වුණා. නායක විමත් දින්සාර පන්දු 29කින් ලකුණු 32ක් ද සෙත්මික සෙනෙවිරත්න පන්දු 22කින් ලකුණු 30ක් ද ශ්‍රී ලංකා ඉනිමට එක් කළා. ඉන්දියාව වෙනුවෙන් හෙනිල් පටෙල් සහ කණිෂ්ක් චවුහාන් කඩුලු 02 බැගින් ලබා ගත්තා.

ආසියානු ක්‍රිකට් කවුන්සිලයේ සාමාජික රටවල් අතර පැවැත්වෙන මේ තරගාවලිය මෙවර පැවැත්වුණේ 12 වැනි වතාවට. පාකිස්තානය මෙහි කිරුළ දිනා ගත්තේ දෙවැනි වතාවට. මීට පෙර ඔවුන් 2012 වසරේ මැලේසියාවේ පැවති තෙවැනි තරගාවලියේදී ඉන්දියාව සමඟ සමශූරයන් වුණා. ඉන්දියාව 08 වතාවක් ශූරයන් වී තිබෙනවා. මීට පෙර අවසන් වරට 2023 (එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ) හා 2024 (නේපාලයේ) වසරවල පැවති 10 වැනි සහ 11 වැනි තරගාවලි දෙකේ ම ශූරයන් වුණේ බංගලි දේශය. මේ තරගාවලියේ පළමු වැන්න 1989 වසරේ බංග්ලාදේශයේ පැවති අතර එහි ශූරතාව හිමිකර ගත්තේ ඉන්දියාව.






# ජනවාරිය කළු නොවෙන්නට නම්...!

අප ගෙවමින් සිටින්නේ ජනවාරිය. අලුත් වසරකට නැවුම් බලාපොරොත්තු කැන්දන වසරේ මුල් ම මාසයට 'කළු පැල්ලමක්' එකතු කොට එය 'කළු ජනවාරියක්' බවට පත් කළ ඉතිහාසයක් අප පසු කර තිබෙනවා.

ප්‍රවීණ මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය කර 2026 ජනවාරි 08 දිනට වසර 17ක්. ගෙවුණු දූෂිත පාලන කාලයේ ලසන්ත වික්‍රමතුංග ඝාතනය, සිරස මාධ්‍ය ආයතනයට බෝම්බ ප්‍රහාර එල්ල කිරීම, මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීම, රිවිර පුවත්පතේ කතෘ උපාලි තෙන්නකෝන්ට පහරදීම, ලංකා ඊ නිව්ස් කාර්යාලය ගිනි තැබීම ඇතුළු මාධ්‍යවේදීන්ට හා මාධ්‍ය ආයතනවලට කළ අපරාධ සංඛ්‍යාත්මක ව ගන්නේ ඉහළ අගයක්. කාලයේ වැලි තලාවෙන් වැසී ගිය, කුමන්ත්‍රණකාරී ලෙස විනාශ කළ, සාක්ෂි සමග යුක්තිය ඉටුවීම තවමත් ප්‍රමාදයි.

ලසන්ත වික්‍රමතුංගගේ බිරිඳ රෙයින් වික්‍රමතුංග මෙසේ පවසා තිබුණා.

"කවදහරි කාටවත් ගැති නැති, ඒ කියන්නෙ කාවවත් රකින්න ඕනෙ නැති ජනතා හිතවාදී ආණ්ඩුවක් ආව දවසකටනම් අපට බලාපොරොත්තු තියාගන්න පුළුවන් ලසන්තගෙ ඝාතකයන් හොයාගනියි කියලා. ඉතින් දැන් ඒක වෙලා තියෙන්නෙ. අවුරුද්දකුත් ගිහිල්ලා තියෙන්නෙ. ඉතින් ඒත් අපි හිතනව මේක වෙයි කියලා. අපි ගොඩාක් බලාපොරොත්තුවෙන් ඉන්නවා. මං හිතනව ළඟදි ම වගේ ප්‍රගතියක් ඇති වෙයි කියලා. බලමු ඉතින්."

ලසන්තට මෙන් ම ඝාතනය කෙරුණු, අතුරුදහන් කෙරුණු, වධහිංසාවට ලක් කෙරුණු, පීඩාවට පත් කෙරුණු සියලුදෙනාට යුක්තිය ඉටු විය යුතුයි. ජනතාවාදී පාලනයක දූෂිතයන්ට, අපරාධකරුවන්ට දඬුවම් හිමිවිය යුතුයි. යළිත් කිසිදු දිනයක මාධ්‍යයට හෝ පුරවැසියාගේ ප්‍රකාශනයේ නිදහසට හෝ 'කළු' පැල්ලමක් එකතු නොවිය යුතුයි. අප වෙහෙස නොබලා වැඩ කරමින් සිටින්නේ ඒ වෙනුවෙන්. මේ ගෙවී යන සංක්‍රාන්ති කාලයේ අතීත අමිහිරි අත්දැකීම් මතින් අනාගතය ගොඩනැගිය යුත්තේ අපමයි.

ඡායා රූ
**නයනහාරී අබේනායක**

දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත
Department of Government Information
news.lk
GFU Sri Lanka
Rs. 100/-